# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014 ජූලි 08** වන අඟහරුවාදා
2014 ஆடி 08 செவ்வாய்க்கிழமை
Tuesday 08th July 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.55 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.55 **க்கு சபை கூடியது**
The Provincial Council met at 09.55 a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"මෙම පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගම්පහ දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රී සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාගේ පත්වීම 2014.06.23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මා විසින් පිළිගනු ලැබූ බව කාරුණිකව දැනුම් දෙනවා."*

*මෙම පළාත් සභාවේ ගරු සභානායක ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රී ඒ.ඩී. ගාමිණී තිලකසිරි ගරු මන්ත්‍රීතුමාගේ පත්වීම 2014.06.27 දින සිට මා විසින් පිළිගනු ලැබූ බව කාරුණිකව දැනුම් දෙනවා.*

එම අභිනව පත්වීම්ලාභී ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනාටම ගරු ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාටත්, ගරු සභානායකතුමාටත් මගේ සුභාශිංසන පිරිනමමින් එම දෙදෙනාගේම සහයෝගය මා වෙත සහ සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ලැබේවි කියන බලාපොරොත්තුව ඇතිව මම ඔවුන් දෙපලට යළිත් වරක් සුබ පතනවා.

*ii*

*"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදා හැරීම්, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කරනු ලැබ තිබූ යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා වෙනුවට, 2014.06.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමාව මවිසින් නම් කරන ලද බව දැනුම් දෙනවා.*

*iii*

*"විදුලිබල හා බල ශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජල සම්පාදන හා ජලපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කරනු ලැබ තිබූ ජී. නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.06.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාව මවිසින් නම් කරන ලද බව දැනුම් දෙනවා."*

*iv*

*"බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාව ඇතුළුව නව කාර්යාල සංකීර්ණය සඳහා මහල් පහළොවකින් යුක්ත නව ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු මෙම පරිශ්‍රයේදී ඉදිරි සතියේ ආරම්භ වීමට නියමිතය. එම ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් කටයුතු සිදු කරනු ලබන කාල සීමාව තුළ සහා රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී ගරු මන්ත්‍රීවරුන් හට සිදු විය හැකි අපහසුතාවයන් හැකිතාක් දුරට අවම කර සභා රැස්වීම් බාධාවකින් තොරව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇති බව දැනුම් දෙන අතර, ඊට අදාළව ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා."*

*V*

*කාර්ය පටිපාටි රීති (සංශෝධන) පුස්තකය.*
*(IV හා V වන පළාත් සභාව)*

*මධ්‍යම ආණ්ඩුවේ පළාත් සභා සහ පළාත් පාලන ලේකම්ගේ දැනුම් දීමෙන් 2005.09.07 දින රැස්වූ සියලුම පළාත් සභාවල ලේකම්වරුන්ගේ එකඟතාවයෙන් ඉහත කී පුස්තකය සකස් කරන ලදී. ඒ අනුව ඔවුන් විසින් සකස් කරන ලද කාර්ය පටිපාටි රීති පුස්තක කෙටුම්පත අපගේ පළාත් සභාවට යොමු විය.*

*එය, කාර්ය පටිපාටි රීති කාරක සභාවට යොමු කිරීමෙන් අනතුරුව සාකච්ඡා කරමින් ඉදිරිපත් වූ සංශෝධන ද ඇතුළත් කර නව පුස්තකයේ මූලික කටයුතු අවසන් කරමින් සිටින විට IV වන පළාත් සභාව අහෝසි විය. පසුව යළිත් V වන පළාත් සභාවේදී එකී පුස්තකය සභාවට ඉදිරිපත් කොට කාර්ය පටිපාටි රීති කාරක සභාවට යොමු කරන ලදී. 2009.07.02 දින රැස්වීමේ සිට වරින් වර රැස් වී සම්පූර්ණ සංශෝධන ඇතුළත් කරමින් නව කාර්ය පටිපාටි රීති (සංශෝධන) පුස්තකය සකස් කොට නිම කරන ලදී.*

*අනතුරුව, 2011 පෙබරවාරි 08 සහ මැයි 09 දින කාර්ය පටිපාටි රීති කාරක සභාවේදී මෙන්ම 2011.06.07 දින පැවැති පළාත් සභාවේදී ද තීරණය වූයේ,*

*1997 වර්ෂයේදී සම්මත වූ එනම්, දැනට ක්‍රියාත්මකව පවතින කාර්ය පටිපාටි රීතීන්, නව රීති පුස්තකය බලාත්මක වීමෙන් පරිච්චින්න වන බවයි. එහිදී 1987 අංක 42 දරන පළාත් පනතේ දෙවන කොටසේ එකොළොස්වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගත යුතු රීතීන් ද පරිච්චින්න වන හෙයින් නව රීති පුස්තකයේ එම රීතීන් එලෙසම ඇතුළත්ව තිබුණද එකී රීතීන් බලාත්මක වීමට පෙර ඉහත කී පනත ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු බවයි."*

*ඒ අනුව, එකී පුස්තකය 2011.08.04 දින ගරු ආණ්ඩුකාරතුමා මගින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යොමු කරන ලදී. වරින් වර කරන ලද විමසුම්වලින් අනතුරුව ඒ පිළිබඳව තීරණය 2013.09.03 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අප වෙත එවා ඇත. ඒ අනුව යෝජිත කාර්ය පටිපාටි රීති (සංශෝධන) පුස්තකයේ 12 වන රීතියත්, 40 සහ 49 වන රීතියත් පිළිබඳව අපගේ අවධානය යොමු කොට ඇත.*

*ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවන ලද ලිපිය සහ නව කාර්ය පටිපාටි පුස්තකය පිළිබඳ යළිත් විමසා බලා තීරණයක් ලබා ගැනීම සඳහා ඉදිරියේදී පළාත් සභාවේ යෝජනාවක් මගින් එය කාර්ය පටිපාටි රීති කාරක සභාවට යොමු කළ යුතු බව වැඩිදුරටත් දැනුම් දෙනවා.*

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014.06.17 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
## PETITIONS

**ගරු සුමිත් ලාල් මැන්දිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කළුතර, නාගොඩ, 4 වන පටුමග, අංක 62/89 හි පදිංචි ඩී. ලලිත් වසන්ත සිල්වා යන අයගේ පෙත්සම සහ,

ii. රාජගිරිය, කලපලුවාව, පළමුවන පටුමග, අංක 200/5 හි පදිංචි පී.පී. පල්ලේවෙල යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පෙත්සම් ඉදිරිපත් කරන වෙලාවේදී වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කැමැතියි. යම් රාජ්‍ය ආයතනයකින් අපට අදාළ කොට්ඨාශයේ යම් පුද්ගලයෙකුට හෝ තැනැත්තියකට යම් අසාධාරණයක් වුණාම ඒ ආයතන

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

තුළින් සාධාරණයක් උදෙසා තමයි පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට මමත් මේ ඕනෑම මන්ත්‍රීවරයෙක් වුණත් පෙත්සමක් ඉදිරිපත් කරන්නේ. ඇයට හෝ ඔහුට යම් සහනයක් ඒ වාගේම සුගතියක් ලබා දීමේ අරමුණින්. දීර්ඝ කාලයක් තිස්සේ එහෙම අසාධාරණයට ලක් වුණු උදවිය අපට දුන් ඒ පෙත්සම් සභාවට ඉදිරිපත් කළාම අපි දැකලා තිබෙනවා, මේ පෙත්සම් කාරක සභාවල් රැස්වන කාලය නිසා ඔවුන් මේක තුළත් යම් අසාධාරණයකට ලක් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මේ මන්ත්‍රීවරයෙක් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් වෙනත් ආයතනවලින් වුණු අසාධාරණය නිසා සාධාරණයක් ඉෂ්ට කර ගන්න උත්සාහ කරන වෙලාවේදී අපි ඉදිරිපත් කරනු ලබන පෙත්සම් ඔබතුමාගේ මැදිහත්වීම තුළ ඉතාම ඉක්මණින් ක්‍රියාත්මක කරලා දෙන්න. නැත්නම් මේ ඉදිරිපත් කරන කාලය තුළත් ඒ ආයතනවලින් ඇයට හෝ ඔහුට වෙන්නේ අසාධාරණයක්. ඒ නිසා අපි පෙත්සම් කාරක සභාව නිරන්තරයෙන් කැඳවමින් ඒ අයට සාධාරණයක් ඉෂ්ට කරන්න ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය පිළිබඳව අපි සභා කටයුතු කාරක සභාවට යොමු කරලා, සාකච්ඡා කරලා අපි ඉක්මන් තීන්දුවක් ගනිමු.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**01.**

**ලක්ෂමන් නිපුනආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/03)**

අ. පළාත් මාර්ග ගණනාවක් සංවර්ධනය කිරීමේදී මාර්ග දෙපස ජනතාව වන්දි ලබා ගැනීමකින් තොරව තම ඉඩමේ ප්‍රමාණයක් පාර සංවර්ධනයට නිදහස් කළ ස්ථාන ඇති බව පිළිගන්නේද?

ආ. එකී ස්ථානවල මාර්ගය පුළුල් කළද විදුලි කණු, දුරකථන කණු, එලෙසින්ම පවතින බව පිළිගන්නේද?

ඇ. මාර්ගය ලෙස භාවිතා වන සීමාවේ මෙම කණු පැවතීමෙන් එය අනතුරුදායක තත්ත්වයක් බව පිළිගන්නේද?

ඈ. එකී අනතුරුදායක තත්වය වෙනස් කිරීමට ගන්නා වූ පියවර කවරේද?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. එවැනි ස්ථාන වේ නම් කරුණාකර සඳහන් කරන්න. නිශ්චිතව ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකියි.

ආ. එවැනි ස්ථාන වේ නම් කරුණාකර සඳහන් කරන්න. නිශ්චිතව ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකියි.

ඇ. එවැනි ස්ථාන වේ නම් කරුණාකර සඳහන් කරන්න. නිශ්චිතව ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකියි.

ඈ. පැන නොනගී.

ඉ. පැන නොනගී.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය තමයි මේ අමාත්‍යාංශයේ එතුමාට නිලධාරීන් ලබා දීලා නැද්ද කියන එක. ඔබතුමාට අමාත්‍යාංශයට නිලධාරීන් ලබා දීලා නැද්ද? ඔබතුමා තනියමද ඉන්නේ කියලයි අහන්නේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් ඔබතුමාගේ ප්‍රශ්න තුනම අහන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ. එක අතුරු ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ ඒකට උත්තර දෙන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් ඉන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ නිලධාරීන් මොනවාද කරන්නේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නිලධාරීන්ට දිව්‍ය ඥානය නැහැ නේ? ඔබතුමා අහන ප්‍රශ්නවලට නිලධාරීන් - (බාධා කිරීම්)

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒ නිලධාරීන් කරන රාජකාරී මොනවාද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ රාජකාරී ලේකම්වරයා පවරා දීලා තිබෙනවා. මේ වෙලාවේ උත්තර දෙන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා අතුරු ප්‍රශ්න අහනකොට -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ ඔබතුමාට නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අහලා තිබෙන ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න ඔබතුමා අහන්න. වෙන වෙන අතුරු ප්‍රශ්න අහන්න යන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මහජන නියෝජිතයෙක් හැටියට මෙතැනට ඇවිල්ලා ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නේ, එහෙම ප්‍රශ්නයක් තිබෙන නිසා. ඒකට ඇමතිවරයෙකුගෙන් උත්තරයක් ගන්න. ඇමතිවරයාට නිලධාරීන්, කාර්ය මණ්ඩල මේ අය ලබා දීලා තිබෙන්නේ ඒ සම්බන්ධව සොයා බලලා මේ සභාවට උත්තරේ දෙන්න. මෙතුමා එදා මේ ප්‍රශ්නයට උත්තරේ හරියට දුන්නා නම් දෙවැනි වරටත් වැඩ බලන මහ ඇමති වෙන්න තිබුණා. ඒකත් නැති කර ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක්. ඒක වෙන කථාවක්. නමුත් ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්න අහන්න. දැන් එක ප්‍රශ්නයක් ඔබතුමා ඇහුවා. ඊළඟ -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ඊළඟ ප්‍රශ්නය ඇමතිතුමාට නොවෙයි, ඔබතුමාටයි පැවරෙන්නේ. ඔබතුමා තමයි මේ සභාවේ මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද ආරක්ෂා කරන්න ඕනෑ. ඒ ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු ලබා දීම සඳහා ඇමතිවරු ඒ සඳහා යොමු කරවන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමා මේ ප්‍රශ්නයට කල් අරගෙන, ඊළඟ සභා වාරයේ උත්තර දෙන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, නිවැරදි විස්තර සහිතව අහන්න. ඊළඟ වාරයේදී මට පුළුවන් උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඊළඟ වාරේදී උත්තර දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, එතුමා අර පළමුවැනි දවසෙත් ඕකම නේ කිව්වේ ඉතින්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා පොඩ්ඩක් ඉවසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමාට පොඩි කාලයක් දෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

එහෙම ඉවසන්න හිතෙන්නේ නැහැ මේ කියන විධියට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ඔබතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඉවසන්න හිතෙන්නේ නැහැ. මොකටද, අපි මේ සභාවට ආවේ කියලා හිතෙනවා. අපි ගැන අපට කනගාටු හිතෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමාට අවස්ථාව ලබා දෙන්න. එතුමාට මේ -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ. මට ඔබතුමා පැහැදිලිව කියන්න මේකට මාස තුනකින් උත්තර දෙනවාද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එතුමාට අවස්ථාව ලබා දෙනවා. ගරු ඇමතිතුමා, ඔබතුමා මාස තුනකින් එතුමාට පැහැදිලි උත්තරයක් ලබා දෙන්න, ඒ පිළිබඳව.

## ඔප්පු සඳහා මුද්දර ගාස්තු ගෙවීම
## PAYMENT OF STAMP DUTY FOR DEEDS

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**02.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/07)**

අ. බස්නාහිර පළාතේ නොතාරිස්වරුන් ලියා සහතික කරනු ලබන ඔප්පු සඳහා මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය හා එහි සංශෝධන අනුව බව ඔබතුමා පිළිගන්නේද ?

ආ. නොතාරිස්වරු ලියා සහතික කරන ඔප්පුවල ඇතුළත් ඉඩම් තක්සේරු කිරීම සඳහා නිසි බලයක් බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියෙහි ඇතුළත්ව ඇත්ද? එසේ ඇතුළත් වන්නේ නම් ඒ කුමන වගන්තීන්වලද?

ඇ. නොතාරිස්වරු විසින් ඔප්පුවල ඇතුළත් කළ ප්‍රතිෂ්ඨාවන් අභිබවා යමින් මුදලක් තක්සේරු කිරීම සඳහා උක්ත ප්‍රඥප්තියෙන් බලය පැවරී ඇත්ද?

ඈ. බස්නාහිර පළාතේ, ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු ඒකකයක් හෝ කිහිපයක් පවතින්නේද? එම තක්සේරුවන්ගේ නම් හා නිශ්චල දේපල තක්සේරු කිරීමට අදාළව ඔවුන්ගේ සුදුසුකම් කවරේද?

ඉ. එලෙස නිශ්චල දේපල තක්සේරු කිරීමට නිසි සුදුසුකම් තිබේ නම් නිශ්චල දේපළ තක්සේරු කිරීමට භාවිතා කරනු ලබන නිර්නායක කවරේද?

ඊ. වටිනාකම මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව තීරණය කිරීම සඳහා දැනට බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ ඇති ක්‍රමවේදය කුමක්ද?

උ. මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ආරම්භ කළේ 1990 අංක 6 දරන මුදල් ප්‍රඥප්තිය සම්මත වී වසර කීයකට පසුවද? ප්‍රථමයෙන් ක්‍රියාත්මක කළ වර්ෂය කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)

Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

අ. ඔව්.

ආ. ඔව්.

බස්නාහිර පළාත් මුදල් ප්‍රඥප්තියේ අංක 37 සිට 78 දක්වා හා 106 වගන්ති.

ඇ. ඔව්.

ඈ. ඔව්.

ඇමුණුම 01 සමඟ දැක්වේ.[1]

උපාධිය සහ සේවා පළපුරුද්ද.

ඉ. පිළිගත් තක්සේරු ක්‍රම.

ඊ. පිළිගත් තක්සේරු ක්‍රම භාවිතයෙන් දේපළේ වෙළඳ වටිනාකම තක්සේරු කිරීම.

උ. වසරකට පසුව.

1991.09.13 සිට.

ඇමුණුම 01

## බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප.) 2014.05.29 දිනට සේවයේ නියුතු ජ්‍යෙෂ්ට තක්සේරුකරුවන්

| අනු අංකය | නම | තනතුර | කාර්යාලය |
|---|---|---|---|
| 01. | කේ.එන්.කේ. සිල්වා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 02. | ඩබ්.එස්.ආර්. රුද්‍රිගු මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 03. | ඩී.කේ.එන්. සමන්මලී මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 04. | එච්.ටී. පීරිස් මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 05. | ආර්.එල්.ඒ.ඩබ්ලිව්. රණවැල්ල මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 06. | එච්.ආර්.ඒ.ජේ.අයි. රණසිංහ මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 07. | ජී.ජී. ශ්‍රියාණි මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 08. | එච්.ඒ. ගාමිණී ජයවික්‍රම මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 09. | බී.කේ.එස්. ලක්මාලි මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 10. | ඩබ්ලිව්.ඒ.ඩී. දිනේෂ් සුජීව මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 11. | එල්.එච්.සී.ජේ. ලියනහිටි මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 12. | කේ.කේ.ඩී.ඒ.කේ. ගුණවර්ධන මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 13. | කේ.කේ.ආර්. රසත් කුමාර මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කොළඹ |
| 14. | ජී.පී.එම්. ෆොන්සේකා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 15. | එස්.එන්.බී. රෝසා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 16. | පී.ඩබ්ලිව්.ආර්. වීරසූරිය මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 17. | පී.එම්. වැන්දබෝනා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 18. | එච්.එම්.එස්. කරුණාරත්න මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 19. | එම්.එස්.ආර්. එම්. පෙරේරා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 20. | එච්.ආර්.පී. බුද්ධික මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ගම්පහ |
| 21. | පී.සී. සිමිත්‍රආරච්චි මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | ප්‍රධාන |
| 22. | එම්.ඩී.යූ. ගුණතිලක මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 23. | ඒ.එස්. සමරක්කොඩි මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 24. | ජී.එල්. චන්ද්‍රාණි මෙනෙවිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 25. | ඩී.එම්. රණවීර මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 26. | සී.ටී.වයි.කේ. පෙරේරා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 27. | බී.කේ.එස්. කුමාර මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 28. | කේ.ඒ.ඒ.කේ. අමරසිංහ මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | කළුතර |
| 29. | ඩී.එම්. උදයසිරි මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 30. | ජී.පී.එච්. ජයන්ත මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 31. | එම්.එල්. පෙරේරා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 32. | ටී.ඩී.වී.එස්. ජයරෝහණ මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 33. | එච්.ටී.එම්.අයි.ඩබ්.ජේ.කේ. ඒකනායක | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 34. | කේ.ඒ.පී.ජී. පෙරේරා මෙනෙවිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 35. | ජේ.ආර්. දහනායක මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 36. | කේ.එම්.එල්. ශ්‍රේරු මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 37. | කේ.ඒ. චන්ද්‍රලතා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 38. | ඒ.එච්.එල්.යූ. අතපත්තු මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 39. | පී.පී.ටී. ඇන්තනී මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 40. | කේ.එල්.වී.එච්. ගුණරත්න මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 41. | ඩී.පී. එදිරිසිංහ මෙනෙවිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 42. | එල්.එන්.ආර්.එස්. සමරසිංහ මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මහරගම |
| 43. | ආර්.යූ. මිරිහාගල්ල මයා | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මුද්දර |
| 44. | යූ.ජේ.අයි. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මුද්දර |
| 45. | ඩබ්ලිව්.ඒ.කේ. චාන්දනී මෙනෙවිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මුද්දර |
| 46. | ආර්.ඩී.ටී.පී. පුෂ්පකුමාරි මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මුද්දර |
| 47. | එච්.ඩී.ආර්.පී. ගුණසේකර මිය | ජ්‍යෙෂ්ට තක්සේරුකරු | මුද්දර |

## බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප.) 2014.05.20 දිනට සේවයේ නියුතු තක්සේරුකරුවන්

| අනු අංකය | නම | තනතුර | කාර්යාලය |
|---|---|---|---|
| 01. | එම්.පී.පී. කරුණාරත්න මිය | තක්සේරුකරු | කොළඹ |
| 02. | එස්.ඩී. ජයරත්න මයා | තක්සේරුකරු | කොළඹ |
| 03. | යූ.කේ.ඒ.පී. ජයලත් මයා | තක්සේරුකරු | කොළඹ |
| 04. | ඩී.ආර්.සී. මුණසිංහ මිය | තක්සේරුකරු | කොළඹ |
| 05. | එච්.එස්.එච්. ප්‍රනාන්දු මයා | තක්සේරුකරු | කොළඹ |
| 06. | ඩී.එම්.පී.දිසානායක මිය | තක්සේරුකරු | කොළඹ |
| 07. | ඩී.පී. දන්වත්ත මිය | තක්සේරුකරු | කොළඹ |
| 08. | ඩී.ඩී.සී.ඩී. කුලරත්න මිය | තක්සේරුකරු | කොළඹ |
| 09. | කේ.ඩබ්ලිව්.ආර්. කාරියවසම් මයා | තක්සේරුකරු | කොළඹ |
| 10. | එස්.ඒ.එස්. සුරවීර මයා | තක්සේරුකරු | ගම්පහ |
| 11. | අයි.පී.ජේ. චන්ද්‍රලතා මිය | තක්සේරුකරු | ගම්පහ |
| 12. | ඩී.එස්.එස්. පීරිස් මිය | තක්සේරුකරු | ගම්පහ |
| 13. | ඩබ්ලිව්.පී.එස්. වර්ණකුලසූරිය මයා | තක්සේරුකරු | ගම්පහ |
| 14. | එම්.වී.පී. සිසිර කුමාර මයා | තක්සේරුකරු | ගම්පහ |
| 15. | ආර්.ඒ.ඩී.එස්. රාජපක්ෂ මෙනෙවිය | තක්සේරුකරු | ගම්පහ |
| 16. | පී.ඒ.එස්.එන්. පුල්ලෙපෙරුම මයා | තක්සේරුකරු | ගම්පහ |
| 17. | **එච්.ඩී.අජිත් නිශාන්ත මයා** | තක්සේරුකරු | ප්‍රධාන |
| 18. | එම්.එම්.එස්.එන්. කරුණාතිලක මිය | තක්සේරුකරු | කළුතර |
| 19. | එච්.ඩී.ඩී. සිල්වා මිය | තක්සේරුකරු | මහරගම |
| 20. | කේ.එච්.ආර්. මල්ලිකා මිය | තක්සේරුකරු | මහරගම |
| 21. | එන්.ඩී. නිමල්සිරි මයා | තක්සේරුකරු | මහරගම |
| 22. | කේ.කේ. පුෂ්පසිරි මයා | තක්සේරුකරු | මහරගම |
| 23. | කේ.ඩී.ඒ. රණසිංහආරච්චි මිය | තක්සේරුකරු | මහරගම |
| 24. | ඩබ්ලිව්.ඒ. අජිත් පත්මසිරි මයා | තක්සේරුකරු | මහරගම |
| 25. | එම්. ගමගේ මයා | තක්සේරුකරු | මුද්දර |
| 26. | ටී.ටී. ප්‍රේමශාන්ත මයා | තක්සේරුකරු | මුද්දර |

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය. පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පිළිගත් නිශ්චල දේපළක් තක්සේරු කිරීමට සුදුසු තක්සේරුකරුවන් සිටීද කියන ප්‍රශ්නයට තමුන්නාන්සේ දීලා තිබෙන්නේ, පිළිගත් තක්සේරු ක්‍රම අනුව වාගේ උත්තරයක් මට පැහැදිලි වුණේ. ගරු මහ ඇමතිතුමනි, -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකක්ද මන්ත්‍රීතුමා ප්‍රශ්නය?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සිටින තක්සේරුකරුවන්ට නිශ්චල දේපළ තක්සේරු කිරීම සඳහා ඔවුන්ට නිසි සුදුසුකම් තිබෙනවාද කියන ප්‍රශ්නයට.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

'අ' යන්න ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

'ඇ' යන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා අහන්නේ බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු ඒකකයක් හෝ කිහිපයක් පවතින්නේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. පවතින්නේද? එම තක්සේරුකරුවන්ගේ නම් හා දේපළ තක්සේරු කිරීමට අදාළ ඔවුන්ගේ සුදුසුකම් කවරේද කියලා මම අහන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒ සඳහා ඇමුණුමක් තිබෙනවා. ඒකේ නම් ටික ගහලා තිබෙනවා. මෙතැන ඉන්නවා මම හිතන්නේ 60 ගණනක්. ඒක අමුණලා තිබෙනවා. පළමුවැනි ප්‍රශ්නයට මම කියනවා, ඔව් කියලා. ඒකේ දෙකට කියනවා, ඇමුණුම 1 සමඟ දැක්වේ කියලා. 3 ට කියනවා, උපාධිය සහ සේවා පළපුරුද්ද කියලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු මහ ඇමතිතුමනි, මගේ ප්‍රධාන ප්‍රශ්නය. මේ ඔක්කොම ප්‍රශ්නවලට Base වෙන්නේ - මම කියන්නේ, නිශ්චල දේපළක් තක්සේරු කිරීම සඳහා බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සුදුසුකම් නැතැයි කියන කාරණයයි. එතකොට ඔබතුමා විශාල ඇමුණුමක් තිබෙන බව තමයි සඳහන් කරන්නේ. ඔවුන්ට සුදුසුකම් තිබෙනවාද කියන ප්‍රශ්නයට ඔබතුමාට කෙටි පිළිතුරක් දෙන්න පුළුවන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේකේ තිබෙනවා, බස්නාහිර පළාතේ ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු ඒකකයක් හෝ කිහිපයක් පවතින්නේද? ඔව්. එම තක්සේරුකරුවන්ගේ නම් හා නිශ්චල දේපල තක්සේරු කිරීමට අදාළව ඔවුන්ගේ සුදුසුකම් කවරේද? ඔබතුමා අහලා තිබෙන්නේ සුදුසුකම් කවරේද කියලා. එතකොට මම ඒකට අවශ්‍ය සුදුසුකම් ටික මේකේ දාලා තිබෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔව්. එතකොට ගරු මහ ඇමතිතුමනි, මම කියන්නේ නිශ්චල දේපළ - මම අතුරු ප්‍රශ්නයක් හැටියට අහන්නම් කෝ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම නම් ඔබතුමා අතුරු ප්‍රශ්නයක් අහන්න. මම ඊළඟ සභාවේදී උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කාලයක් දෙන්න ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා අහන ප්‍රශ්නයට එතුමාට එකවර උත්තරයක් දෙන්න අමාරුයි. මෙතුමාට කාලයක් දෙන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නිශ්චල දේපළක් තක්සේරු කිරීම සඳහා මෙම බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සිටින තක්සේරුකරුවන්ට සුදුසුකම් තිබේද කියන ප්‍රශ්නයට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න තුනම අහන්න. අතුරු ප්‍රශ්න තුනක් අහන්න. එතුමා කාලයක් අරන් උත්තර දේවි. දෙවන ප්‍රශ්නයත් අහන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දෙක. එසේ සුදුසුකම් නොමැත්තේ නම් මේ දක්වා බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව එකතු කරන ලද ඒ කියන්නේ, නිශ්චිත ප්‍රතිශ්ඨාවට අමතරව එකතු කරන ලද මුදල් ප්‍රමාණය ආපසු මහජනතාව වෙත ලබා දෙන්නේද? කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තුන්වැනි ප්‍රශ්නය.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තුන්වැනි එක. මෙතෙක් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව නිශ්චිත ප්‍රතිෂ්ඨාවට අමතරව එකතු කරන ලද සමස්ත ආදායම කවරේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමාට මාසයක කාලයක්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සති දෙකක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සති දෙකක්. මීළඟට තුන්වන ප්‍රශ්නය.

# කොළඹ නගර සභාවට අයත් ලිපිගොනු පිළිස්සීම
BURNING OF FILES BELONGING TO COLOMBO MUNICIPAL COUNCIL

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය]***
*[ Adjourned Question]*

**03.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/VI(1)/14/11)**

අ. කොළඹ මහ නගර සභාවට අයත් ලිපිගොනු රාශියක් බොරැල්ල කනත්තේ දී වර්ෂ 2013 අගෝස්තු 17 වන දින පුළුස්සා විනාශ කරන ලද්දේද?

ආ. එම පිළිස්සීම සඳහා ගරු නගරාධිපතිතුමාගේ/ නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ මහ සභාවේ/ ආයතන කමිටුවේ අවසරය ගෙන තිබුණේද? නැතහොත් අවම තරමින් ඔවුන් හෝ එම ආයතනයන් දැනුවත් කර තිබුණේද?

ඇ. එම පිළිස්සීමෙන් පහත නෛතික ප්‍රතිපාදන උල්ලංඝනය වී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

i. ජාතික ලේඛනාරක්‍ෂක පනතේ 16(1) (අ), 16(1) (ඌ) ප්‍රතිපාදන.

ii. ආයතන සංග්‍රහයේ පළවන කාණ්ඩයේ xxviii ඡේදයේ 9.6 සහ 9.8 වගන්තිවල ප්‍රතිපාදන.

iii. මහ නගර සභා අඥා පනතේ 172 වගන්තිය.

ඈ. එම ලිපිගොනු ජාතික ලේඛනාරක්‍ෂක පනතේ 16(1) (අ), 16(1) (ඌ) හි නියෝග 301 න් කුමකට අදාළද ?

ඉ. ආයත සංග්‍රහයේ 9.6 වගන්තිය අනුව අංක යෙදීම අනිවාර්ය බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. පුළුස්සන ලද ලිපිලේඛන ඇතුළත් ඉදිරිපත් කරන ලද ලේඛනයේ අංක 54 සිට 126 දක්වා ලිපිගොනුවල අනු අංකය වෙනුවට ඉරි කැල්ලක් පමණක් ඇති බව ඔබතුමා දන්නේද?

උ. උක්ත ගැටළුවට අදාළව පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයන්හි වත්මන් ප්‍රගතිය කුමක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. නැත.

ඇ. i. තවදුරටත් මෙම කරුණට අදාළ මූලික විමර්ශන සිදු කරමින් පවතින හෙයින් එම සියලු පරීක්ෂණ අවසන් වීමෙන් පසු නිගමනය කරමි.

ii. තවදුරටත් මෙම කරුණට අදාළ මූලික විමර්ශන සිදු කරමින් පවතින හෙයින් එම සියලු පරීක්ෂණ අවසන් වීමෙන් පසු නිගමනය කරමි.

iii. තවදුරටත් මෙම කරුණට අදාළ මූලික විමර්ශන සිදු කරමින් පවතින හෙයින් එම සියලු පරීක්ෂණ අවසන් වීමෙන් පසු නිගමනය කරමි.

ඈ. දැනට සිදු කර ඇති පරීක්ෂණ අනුව විනාශ කර ඇති ලිපිගොනු ලේඛනාරක්ෂක පනත යටතේ වන නියෝගයන් යටතට අදාළ වන බවට කරුණු අනාවරණය නොවේ.

ඉ. ඔව්. ආයතන සංග්‍රහයේ විසි අට වන පරිච්ඡේදයේ 9.6 වගන්තියට අනුව විනාශ කළ ලිපිගොනු හෝ ලේඛනයන්හි අංක ලේඛනගත කළ යුතු බව පිළිගනිමි.

ඊ. අදාළ ලේඛනයට අනුව එලෙස නිරීක්ෂණය වේ.

උ. කරුණට අදාළ සිද්ධිමය පරීක්ෂණ නිම කර ඇති අතර, එමගින් අනාවරණය වූ කරුණු අනුව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඒ සඳහා විශේෂයෙන් පත් කරනු ලබන නිලධාරියෙකු යටතේ මූලික විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මගේ දෙවන ප්‍රශ්නයට පිළිතුර හැටියට ලබා දීලා තිබෙන්නේ නැත කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මොකක්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

'ආ' ප්‍රශ්නයට පිළිතුර නැත. ඒ අනුව ගරු සභාපතිතුමනි, කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්වරිය සිදු කර ඇත්තේ ඉතාමත් බරපතළ විනය විරෝධී ක්‍රියාවක් බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දෙවැනි ප්‍රශ්නයත් අහනවාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒකට උත්තරයක්.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. ගරු සභාපතිතුමනි, ඒකට උත්තර දැන් දෙන්න බැහැ. බලලා කියන්නම්. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට එකපාර උත්තරයක් දෙන්න අමාරුයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දෙවැනි අතුරු ප්‍රශ්නය. එය බරපතළ ගණයේ විනය විරෝධී ක්‍රියාවක් බව - කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්වරිය විනය විරෝධී කටයුත්තක් සිදු කළ බව ඔබතුමා පිළිගන්නේ නම් ඇයව වහාම එම ස්ථානයෙන් මාරු කිරීමට කටයුතු කරනවාද?

එසේම අවසන් අතුරු ප්‍රශ්නය. මෙම පුළුස්සන ලද ලිපිලේඛන තුළ ඔවුන් වර්ග කරන ලද - නගර සභාවෙන් කියා සිටිනේ ගරු සභාපතිතුමනි, 1 – 126 දක්වා ලිපි ලේඛන තමයි පුළුස්සලා තිබෙන්නේ. ඔවුන්ගේ වර්ගීකරණයට අයත් නොවන ලිපි ලේඛන රාශියක් බොරැල්ල කනත්තේදී පුළුස්සන ලද බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්න තුන හරි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කල් ඉල්ලනවා එම අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න. සති දෙකක කාලයක්.

## වත්තල අල්විස් වත්ත සාගර ක්‍රීඩා පිටිය : සංවර්ධනය කිරීම
## SAGARA PLAYGROUND OF ALWISWATTE, WATTALA : DEVELOPMENT ACTIVITIES

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය. (ප්‍ර/VI(1)/14/12)**

අ. වත්තල ප්‍රාදේශීය සභාවට අයත් අල්විස් වත්ත සාගර ක්‍රීඩා පිටියට (ප්‍රාදේශීය සභා ක්‍රීඩා පිටිය) අප්‍රේල් සිංහල දෙමළ අවුරුදුවලින් පසු දිනකදී බොරළු පස් ටිපර් මගින් ගෙනවිත් තැනින් තැන ගොඩ ගසා ඇති බව ඔබ දන්නේද?

ආ. දින 40 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද, එම පස් තුනීකර නොමැති නිසා ක්‍රීඩා කිරීමට ඇති ඉඩකඩ අවහිර වී ඇති බව පිළිගන්නේද?

ඇ. එසේනම් එම පස් තුනීකර එම ක්‍රීඩා පිටිය තුළ ක්‍රීඩා කිරීමට හැකි ලෙස එය සකස් කිරීමට පියවර ගන්නේද?

ඈ. එසේ පියවර ගනු ලබන්නේ කවදා සිටද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්. අදාළ ව්‍යාපෘතිය කඩිනමින් නිම කර ක්‍රීඩා කිරීමට හැකි වන පරිදි ක්‍රීඩාපිටිය සකස් කිරීම සඳහා වත්තල ප්‍රාදේශීය සභාවෙහි ගරු සභාපති වෙත පළාත් පාලන කොමසාරිස් මගින් උපදෙස් ලබා දෙන ලදී.

ඈ. දැනටමත් පියවර ගෙන ඇත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය තමයි, දැන් මේ පස් ගෙනැල්ලා දාලා තිබෙන්නේ අප්‍රේල් 20 වාගේ ආසන්න දිනයක. එතකොට මේ වන කොටත් මාස දෙකහමාරක් වාගේ කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන් දැඩි අපහසුතාවයක ඉන්නවා, මේ ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරන්න. ඒ නිසා නිශ්චිත ලෙසම මෙය ආරම්භ කරන්නේ කවදාද? තවමත් මේක ආරම්භ කරලා නැහැ මම දන්න තරමින්.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක කඩිනමින් ආරම්භ කරන්න උපදෙස් දීලා තිබෙනවා. මේක බලලා කියන්නම් ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. බොහොම ස්තුතියි.

## ශාන්ත ජෝන් මාළු වෙළඳපොළ සහ මැනිං එළවළු වෙළඳ සැල
## ST.JOHN FISH MARKET AND MANNING VEGETABLE MARKET

* ***[කල් ගන්නා ලද ප්‍රශ්නය ]***
*[ Adjourned Question]*

**05.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/13)**

අ. කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටා තිබූ ශාන්ත ජෝන් මාළු වෙළඳසැල පැලියගොඩට රැගෙන ගිය බව ඔබතුමා දන්නේද?

ආ. රැගෙන යන විට එහි සිල්ලර වෙළඳාම කළ වෙළඳ ප්‍රජාව කොපමණද?

ඇ. පැලියගොඩ නව මාළු වෙළඳ සංකීර්ණය විවෘත කරන අවස්ථාව වන විට සිල්ලර මාළු වෙළඳසැල් කීයක් වෙළඳ ප්‍රජාවට ලබා දුන්නේද?

ඈ. එසේ ලබා දුන් සිල්ලර මාළු වෙළඳසැල් කීයක් වැසී ගොස් ඇද්ද?

ඉ. එසේ වැසී ගොස් ඇත්තේ, වෙළඳාමේ අඩුකම නිසා බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. මැනිං එළවළු වෙළඳ සැලද පැලියගොඩ ප්‍රදේශයට රැගෙන යාමට සැලැස්මක් පවතින්නේද?

උ. එසේ වුවහොත් ඉහත (ඈ) සහ (ඉ) ඡේදවල අන්දමට වෙළඳාම අඩු වී වෙළඳසැල් වැසී යාමේ තර්ජනයකට මුහුණදීම යථාර්ථය බව ඔබතුමා පිළිගන්නේද?

ඌ. එසේ නම් එළවළු වෙළඳාම සඳහා හොඳ විකල්ප ස්ථානයක් යෝජනා නොකරන්නේ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. රැගෙන යන විට ශාන්ත ජෝන් වෙළඳ සංකීර්ණයේ සිල්ලර වෙළඳාම් සිදු කරන ලද වෙළඳසැල් සංඛ්‍යාව 109 කි.

ඇ. පැලියගොඩ නව මාළු වෙළඳ සංකීර්ණය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන්නක් බැවින් ඒ සම්බන්ධයෙන් නොදනිමි.

ඈ. නොදනිමි.

ඉ. ඒ සම්බන්ධයෙන් නොදන්නා බැවින් නිශ්චිතව කිව නොහැක.

ඊ. නොදනිමි.

උ. පැලියගොඩ මාළු වෙළඳ සංකීර්ණයෙහි වෙළඳාම අඩු වීම මත වෙළඳසැල් වැසීයාම සිදුවී ඇත්ද යන්න නිශ්චිතව කිව නොහැකි වුවත්, වෙළඳපොලක වෙළඳසැල් වැසීයාමකට අදාළ යථාර්ථය වෙළඳාම අඩු වීමම බව පිළිගත නොහැක.

ඌ. ඒ පිළිබඳව නිශ්චිත ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව තීරණය කරනු ඇත.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, 'අ' සිට 'ඌ' දක්වා තිබෙන සියලු ප්‍රශ්නවලට නිකම් පිළිතුරු දීලා තිබෙන්නේ, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා වාගේ. එසේ වූවානම් මෙසේ වේ කියලා.

ගරු සභාපතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේ කොළඹ මහ නගර සභාවට අයිති මාලු වෙළඳ සංකීර්ණය, ඒ වාගේම ඉවත් වීමට නියමිත මැනිං එළවළු වෙළඳපල, පිළිබඳව නිශ්චිත පිළිතුරක් තමුන්නාන්සේට දෙන්න හැකියාවක් නැත්නම් ඇයි මේ මාලු වෙළඳ සැල සහ එළවළු වෙළඳ සැල මේ පැලියගොඩ ප්‍රදේශයට - එකක්, මාලු වෙළඳපළ දැනටමත් ගෙනිහිල්ලා තිබෙනවා. ඒ වාගේම එළවළු වෙළඳ සැලත් දැන් පැලියගොඩ ප්‍රදේශයට ගෙනියන්න හදන්නේ ඇයි? කියන ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ. දෙක, මැනිං එළවළු වෙළඳපළ පැලියගොඩට අරගෙන යනවා නම් - දැනටමත් මාලු වෙළඳසැලේ කඩ බක්කි, කඩ කාමර 52 ක් වැහිලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි. තමුන්නාන්සේ එම යථාර්ථයමද එළවළු වෙළඳසැලටත් මේ කරන්න

[ගරු සුනිල් වටගල]

හදන්නේ කියන කාරණය තමයි මම මේ අහන්නේ. එම අතුරු ප්‍රශ්න දෙකට පිළිතුරු මම අපේක්ෂා කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා අහන්නේ මම කරන්නද හදන්නේ කියලා නේද? සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

## මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය
MINISTRY OF MANPOWER AND EMPLOYMENT, ENGINEERING SERVICES AND INFORMATION

**06.**

**ලක්ෂ්මන් නිපුනආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍රVI(1)/14/17)**

අ. I. ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් මිනිස්බල හා රැකීරක්ෂා විෂය යටතේ ඇති කටයුතු කවරේද?

II. V වන පළාත් සභාව තුළ එම විෂය යටතේ සිදු කළ ප්‍රධාන කාර්යභාරයන් මොනවාද?

ආ. I. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඉංජිනේරු සේවා විෂය යටතේ ඇති කටයුතු කවරේද?

II. V වන පළාත් සභාව තුළ එම විෂය යටතේ සිදු කළ ප්‍රධාන කාර්යභාරයන් මොනවාද?

ඇ. I. ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් ප්‍රවෘත්ති විෂය යටතේ ඇති කටයුතු කවරේද?

II. V වන පළාත් සභාව තුළ එම විෂය යටතේ සිදු කළ ප්‍රධාන කාර්යභාරයන් මොනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. I. මිනිස්බල හා රැකීරක්ෂා විෂය යටතේ රැකියා විරහිත අඩු ආදායම්ලාභී තරුණ තරුණියන් සඳහා රැකියා ඉලක්කගත පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම පුහුණු වැඩ සටහන් පවත්වනු ලබන්නේ ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් වෙන් කරනු ලබන උපමාන පාදක ප්‍රතිපාදන මගිනි.

II. V වන පළාත් සභාවට අදාළ වසර 05 ක කාලය තුළ සැහැල්ලු වාහන රියදුරු පුහුණුව, බර වාහන රියදුරු පුහුණුව, ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පය, පරිගණක පාඨමාලා යන රාජ්‍ය අනුබද්ධිත ආයතන මගින් මෙහෙයවනු ලබන පාඨමාලා සඳහා තරුණ තරුණියන් පුහුණු කර තිබේ. ඒකට අදාළ විස්තර මතු සඳහන් වෙනවා ගරු සභාපතිතුමනි.

**ආ. II** ට අදාළ පිළිතුර

**ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් උපමාන පාදක ප්‍රතිපාදන යොදවා පුහුණු කළ පුහුණුලාභීන් පිළිබඳ තොරතුරු**

| දිස්ත්‍රික්කය | වර්ෂය 2009 | | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුහුණුලාභීන් | වැය කළ මුදල රු. | පුහුණුලාභීන් | වැය කළ මුදල රු. | පුහුණුලාභීන් | වැය කළ මුදල රු. | පුහුණුලාභීන් | වැය කළ මුදල රු. | පුහුණුලාභීන් | වැය කළ මුදල රු. |
| කොළඹ | 1492 | 3,384,500.00 | 525 | 3,202,260.00 | 165 | 984,500.00 | 231 | 1,430,450.00 | 113 | 1,941,751.00 |
| ගම්පහ | 372 | 1,117,500.00 | 144 | 855,500.00 | 47 | 315,500.00 | 25 | 190,000.00 | 10 | 102,000.00 |
| කළුතර | 320 | 1,161,000.00 | 274 | 1,535,000.00 | 162 | 931,000.00 | 97 | 687,300.00 | 73 | 635,500.00 |
| එකතුව | 2184 | 5,663,000.00 | 943 | 5,592,760.00 | 374 | 2,231,000.00 | 353 | 2,307,750.00 | 196 | 2,679,251.00 |

ආ. I. ඉංජිනේරු කාර්යාංශය වෙත පැවරී ඇති කටයුතු පළාත් සභාව වෙතින් අනුමත මුදල් ප්‍රකාශයේ ද දක්වා ඇති අතර, ඒවා පහත පරිදි වේ. ඒ අනුව බස්නාහිර පළාත් සීමාව තුළ ඉටු කිරීම සඳහා පවරනු ලබන පහත සඳහන් කටයුතු ඉංජිනේරු සේවා විෂය යටතේ සිදු කෙරේ.

i. සියලු ඉදිකිරීම් කටයුතු.
ii. ඉදිකිරීම්වලට අදාළ සියලු අධීක්ෂණ කටයුතු.
iii. ඉදිකිරීම්වලට අදාළ පසුවිපරම් කටයුතු.
iv. වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය උපදේශන සේවා කටයුතු.

II. ඒ අනුව ඉහත විෂයයන් යටතේ ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්ගේ සංක්ෂිප්තයක් පහත දැක්වේ.

**පළාත් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති**

| වර්ෂය | අධ්‍යාපන අමාත්‍යාංශය | සෞඛ්‍ය අමාත්‍යාංශය | කෘෂිකර්ම අමාත්‍යාංශය | ක්‍රීඩා හා කර්මාන්ත අමාත්‍යාංශය |
|---|---|---|---|---|
| 2009 | 775 | 156 | 7 | 50 |
| 2010 | 718 | 89 | 7 | - |
| 2011 | 894 | 50 | - | - |
| 2012 | 1021 | 163 | 30 | 6 |
| 2013 | 907 | 96 | - | 14 |

* මීට අමතරව මධ්‍යම රජයේ ප්‍රතිපාදන, විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති ද ඉටු කරන ලදී.

ඇ. I. ප්‍රවෘත්ති විෂය හයවන පළාත් සභාව යටතේ මා වෙත පැවරී ඇති නව විෂයකි. ඒ අනුව අදාළ විෂය පථයට අයත් කටයුතු පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.

II. V වන පළාත් සභාව තුළ එම විෂය මා වෙත පැවරී නොතිබුණි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ගරු සභාපතිතුමනි, මිනිස් බල හා රැකී රක්ෂා විෂය යටතේ දැන් උපමාන පාදක මුදල් මන්ත්‍රීවරයෙකු වෙන් නොකළොත් ඒ විෂය යටතේ මුකුත්ම වැඩක් කරන්න ඔබතුමාට ප්‍රතිපාදන වෙන් වෙන්නේ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පොදු අරමුදල යටතේ වෙන් කරන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

එතකොට මෙතෙක් පස් වන එක යටතේ කොයි තරම් ප්‍රමාණයක මුදලක් ඒ යටතේ පුහුණුව සඳහා වෙන් කර තිබුණේද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, බලලා කියන්නම්, ඊළඟ සභාවේදී.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මේක ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ. මේක දැණුනු දෙයක් හින්දා. ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාට පස්සේ, ඒ ප්‍රශ්නයට ගරු ඇමතිවරයෙක් උත්තර දුන්නාට පස්සේ, අතුරු ප්‍රශ්න පැන නගින්නේ, ඒ ප්‍රශ්නයට හරියට උත්තර දුන්නේ නැත්නම්. එතකොට පළමුවැනි අතුරු ප්‍රශ්නය කියලා අහන්නේ ඒ නිසා. ඊට පස්සේ ඒ පළමුවැනි අතුරු ප්‍රශ්නයට හරියට උත්තර දුන්නොත් ගරු සභාපතිතුමනි, අපට දෙවැනි සහ තුන්වැනි කියලා අතුරු ප්‍රශ්න අහන්න වුවමනාවක් නැහැ. ඒ නිසා මේ යන ක්‍රමවේදයේ හරි විකෘතියක් තිබෙන්නේ. ඒ කියන්නේ අතුරු ප්‍රශ්න තුනම එකට අහන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා අහපු ප්‍රශ්නයට එතුමා පැහැදිලි උත්තරයක් දුන්නා පොදු අරමුදලින් කියලා. ඒක දුන්නා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ. මම ඒකට නොවෙයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඊළඟ ප්‍රශ්නය ඔබතුමා ඇහුවේ මුදල් සම්බන්ධව නේ. ඉතින් එතුමාට එකවර මුදල කියන්න බැහැ. එතුමාට ඒ මුදල නිශ්චිතව කියන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක හරි. මගේ ප්‍රශ්නයට හරි. නමුත් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ අහපු අතුරු ප්‍රශ්නවලට හරියට උත්තර නොලැබෙන්නේ ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක්. ඔබතුමාගේ ප්‍රශ්නයට - (බාධා කිරීම්)

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඒක පොදු ප්‍රශ්නයක්. ඒකයි අහන්නේ. ඒක එතුමාගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි. අපිත් ප්‍රශ්න අහනවා නේ? ඒ නිසා ඒක වැරදියි කියලයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානයට මේ යොමු කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා, එතුමාට ඉතින් ප්‍රශ්න මාලාවක් අහන කොට විෂය භාර අමාත්‍යතුමාට එක පාරටම උත්තර දෙන්න අමාරුයි. එතුමා නිලධාරීන්ගෙන් අහලා සභාවට -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සති දෙකක් -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඇත්තටම එතුමාට ඒ අතුරු ප්‍රශ්න තුනට එකපාර උත්තර දෙන්න, එහෙම නම් එතුමා කොම්පියුටරයක් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. අන්න හරි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මොනවා හරි එකක් අහලා ඒකට උත්තරය දුන්නොත් ආයිත් -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මේ ක්‍රමවේදය වැරදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හත්වන ප්‍රශ්නයත් ඔබතුමාගේමයි. ඒ සඳහා අවස්ථාව.

## සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
MINISTRY OF CULTURAL AND ART AFFAIRS

**07.**

**ලක්ෂ්මන් නිපුනආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍රVI(1)/14/18)**

අ. I. ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් සංස්කෘතික හා කලා කටයුතු විෂය යටතේ ඇති කටයුතු කවරේද?

II. එම විෂයට අදාළව ස්ථාපිත ආයතන මොනවාද?

III. V වන පළාත් සභාව තුළ එම විෂය යටතේ සිදු කළ ප්‍රධාන කාර්යභාරයන් මොනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

අ. I. දහම් පාසල් සංවර්ධනය, කලා ආයතන සංවර්ධනය, කලාකරුවන්ගේ සුභ සාධන කටයුතු, විවිධ ආගමික හා ජාතික උත්සව, විවිධ සංස්කෘතික උත්සව සඳහා ආධාර ලබා දීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල

සංස්කෘතික කටයුතු සම්බන්ධීකරණය, සංවර්ධන ව්‍යාපෘති යටතේ සංස්කෘතික ක්ෂේත්‍රයට වෙන් වන මුදල් පිළිබඳව ක්‍රියා කිරීම, නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය හා සංරක්ෂණය, කොළඹ සංස්කෘතික නිකේතනය, හොරණ කලාකෙත හා ගම්පහ ජනාධිපති ශිල්ප ශාලිකාව පවත්වාගෙන යාම.

II. බස්නාහිර පළාත් සංස්කෘතික නිකේතනය, හොරණ කලාකෙත සංස්කෘතික ආයතනය, ගම්පහ ජනාධිපති ශිල්ප ශාලිකාව.

III. බස්නාහිර පළාත් කලා උළෙල පැවැත්වීම, සංස්කෘතික ආධාර ලබා දීම, පෙරහැර 39 ක්. ආදාහන පූජෝත්සව 29 ක්. ශාන්තිකර්ම 14 ක්. සාහිත්‍ය කලා මහෝත්සව 22 ක්. දහම් පාසල් ත්‍යාග ප්‍රධානෝත්සව 11 ක්. සංස්කෘතික වැඩ සටහන් 23 ක්.

ඒ වාගේම ශාසනාරක්ෂක බල මණ්ඩල විභාග කටයුතු, පාස්කු උත්සවය, රාමසාන් උත්සවය, නත්තල් උත්සවය, බක්මහ උළෙල, වෙසක් උත්සවය, පොසොන් උත්සවය, දහම් පාසල් ගුරු පුහුණු, කලා ආයතන ආධාර, බස්නාහිර පළාත් කෙටි නාට්‍ය උළෙල, දහම් පාසල් ගොඩනැගිලි ආධාර, කලා කෙත සංස්කෘතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම. ජනාධිපති ශිල්ප ශාලිකාව පවත්වාගෙන යාම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සංස්කෘතික නිලධාරීන් සඳහා කරනු ලබන ව්‍යාපෘති, දහම් පාසල් ගුරු උපහාර උළෙල, 18 සන්නි ශාන්ති කර්මය - මහරගම, කලාකරු උපහාර උළෙල.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කරපු වැඩ ප්‍රමාණය මදිද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, එතුමාට බොහොම ස්තුතියි. අතුරු ප්‍රශ්න පැන නොනගී.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

වැඩේ හරියට කරලා තිබෙනවා නේ අපේ හිටපු ඇමතිතුමා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හිටපු ඇමතිතුමා මහ ඇමති නොවුණා පුදුමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හිටපු ඇමතිතුමා වැඩේ හරියට කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මේ න්‍යාය පත්‍රයේ තව බොහෝ දුර යන්න තිබෙනවා මට. න්‍යාය පත්‍රයේ තාම භාගයක්වත් ගියේ නැහැ. බොහොම සොච්චමයි. තවම ප්‍රශ්න 08 යි. දැන් අටවන ප්‍රශ්නය යන්න තිබෙන්නේ.

08 වන ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ, හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමා. එතුමා මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා එම ප්‍රශ්නය පිළිබඳව. එතුමා හදිසියේ විදේශගත වන නිසා ඒ ප්‍රශ්නය පිළිබඳව අතුරු ප්‍රශ්න ඇසීම සහ ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව ගරු විපක්ෂ නායකතුමාට එතුමා භාර දීලා තිබෙනවා. ඒ නිසා මම ඒ අවස්ථාව ලබා දෙනවා විපක්ෂ නායකතුමාට. බලය පාවිච්චි කරලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
[ගරු හර්ෂණ රාජකරුණා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා වෙනුවෙන්]
Hon. Manju Sri Arangala - Leader of the Opposition
[On Behalf of Hon. Harshana Rajakaruna - Chief Opposition Whip]

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

## ගම්/කිරිදිවැල සංඝමිත්තා බාලිකා විදුහල : නව සිව්මහල් ගොඩනැගිල්ල

GM/KIRINDIWELA SANGHAMITHTHA BALIKA VIDYALAYA: NEW FOUR STOREY BUILDING

**08.**

**හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍රVI(1)/14/19)**

අ. බප/ගම්/කිරිදිවැල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ කඩා ඉවත් කරන ලද පැරණි ගොඩනැගිල්ල වෙනුවට යෝජිත නව සිව්මහල් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තු ගත මුදල කොපමණද?

ආ. එම ගොඩනැගිල්ල සඳහා මෙතෙක් වැය කර ඇති මුදල කොපමණද? වෙන් කළ මුදල කොපමණද?

ඇ. 2013 මැයි මාසයේදී ඔබතුමා විසින් මුල්ගල් තබා ආරම්භ කරන ලද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට නැවතී ඇති බව ඔබතුමා දන්නවාද?

ඈ. පැරණි ගොඩනැගිල්ලේ තිබූ පන්ති කාමර 6 ක දරුවන් සඳහා පාසල ඉදිරිපිට ඇති බෞද්ධ මධ්‍යස්ථානයේ පන්ති පැවැත්වෙන අතර එම ගොඩනැගිල්ල නැවත ආපසු ලබා දෙන මෙන් එහි පාලක මණ්ඩලය විසින් ඉල්ලා ඇති බව ඔබතුමා දන්නවාද?

ඉ. වර්ෂයකට අධික කාලයක් මෙම ස්ථානයේ ඉගෙනුම ලබන දරුවන්ට නිසි ආරක්ෂාවක් නොලැබෙන බව ඔබතුමා දන්නවාද?

ඊ. යෝජිත නව සිව්මහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නියමිතව ඇත්තේ කවදාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. රුපියල් මිලියන 50 කි.

ආ. එම ගොඩනැගිල්ල සඳහා 2013 වර්ෂයේදී රුපියල් මිලියන 2 ක් ද, 2014 වර්ෂය මුලදී තවත් රුපියල් මිලියන 2 ක් ද වන සේ රුපියල් මිලියන 4 ක් ලබා දී තිබේ. බිම් මහලේ ඉදිකිරීම් කටයුතු සඳහා තවත් රුපියල් මිලියන 8 ක් වෙන් කර තිබෙන අතර, මෙම වර්ෂය අවසන් වන විට බිම් මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් වේ. නමුත් සිසුන් ඇතුළත් කිරීමට එහි අවශ්‍යතා නිම කිරීම සඳහා 2015 වර්ෂයේ පළමුභාගය දක්වා ගත කිරීමට සිදුවේ. ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු නිම කිරීම ලැබෙන ප්‍රතිපාදන අනුව අදියර වශයෙන් වෙන් කිරීමට කටයුතු කරනු ඇත.

ගරු සභාපතිතුමනි, මෙතැන පොඩි සංශෝධනයක් කරන්න ඕනෑ. අපි පසුගිය අයවැයට අමතරව මිලියන 450 ක් භාණ්ඩාගාරයෙන් භාගයට ඉදි කරපු පාසල් ගොඩනැගිලි සඳහා ලැබිලා තිබෙනවා. මම හිතන්නේ, මම බලාපොරොත්තු වෙනවා එක අදියරක් අවසන් කරලා දෙන්න. මේ සඳහා අපේ හර්ෂණ රාජකරුණා ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රතිපාදනවලින් වෙන් වීමක් වෙලා නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා මන්ත්‍රීවරුන්ගේත් දායකත්වයක් ලැබිලා නැති නිසා පළාත් සභාවෙන් පළමුවැනි අදියරය අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඇ. 2014 වසරට අනුමත කළ රුපියල් මිලියන 2 හි වැඩ නිම කර ඇති අතර දෙවන අදියරට අනුමත කළ රුපියල් මිලියන 8 හි ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.

ඈ. විදුහල්පති හා උක්ත බෞද්ධ මධ්‍යස්ථානය සමග ඇති කර ගත් එකඟතාවය අනුව පන්ති කාමර 06 ක් බෞද්ධ මධ්‍යස්ථානයේ පවත්වා ගෙන යන අතර 2014 හා 2015 වසරේ මාස 06 ක් දරුවන් සඳහා එහිම පන්ති පැවැත්වීමට සිදුවේ.

ඉ. ආරක්ෂාව පිළිබඳ කිසිදු ගැටළුවක් මෙතෙක් මතුවී නොමැති අතර, දෙමව්පිය කමිටුවක් විසින් පාසල් කාලයේදී ආරක්ෂාව ලබා දේ.

ඊ. 2017 වර්ෂය අවසානය වන විට ගොඩනැගිල්ලේ වැඩ සම්පූර්ණයෙන් අවසන් කිරීමට යෝජිතය.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පළමුවැනි ප්‍රශ්නය මේකේ ප්‍රස්තුත කාරණය පිළිබඳව මට අවබෝධයක් නැහැ. නමුත් මේකේ 'අ' අහලා තිබෙනවා එහි පාලක මණ්ඩලය විසින් මේ ගොඩනැගිල්ල ඉල්ලලා තිබෙනවාය කියලා. ඒකට ප්‍රධාන අමාත්‍යතුමාගෙන් පිළිතුරක් ලැබුණේ නැහැ. ඉල්ලලා තිබෙනවාද නැද්ද කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම දැනුවත් කිරීමක් කරලා නැහැ.

# බස්නාහිර පළාත : අධ්‍යාපන කලාප
WESTERN PROVINCE : EDUCATION ZONES

**09.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍රVI(1)/14/20)**

අ. I. පළාත තුළ අධ්‍යාපන කලාප කීයක් තිබේද?

II. එම කලාපවලට විධිමත්ව පත් කරන ලද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු කීදෙනෙකු සිටීද?

III. වැඩ බලන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කීදෙනෙකු සිටීද?

IV. සෑම කලාපයකටම විධිමත් ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් නොකරන්නේ මන්ද?

ආ. I. පළාත තුළ අධ්‍යාපන කලාප අනුව අධ්‍යාපන කොට්ඨාශ කීය බැගින් තිබේද?

II. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කී දෙනෙකු විධිමත්ව පත් කර තිබේද?

III. වැඩ බලන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කී දෙනෙකු සිටීද?

IV. සෑම අධ්‍යාපන කොට්ඨාශයකටම විධිමත් ලෙස කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් නොකරන්නේ මන්ද?

ඇ. I. කලාප අධ්‍යාපන කාර්යාලයක විවිධ විෂයන්ට අනුව සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද?

II. ඒ ඒ විෂය අනුව අධ්‍යක්ෂවරුන් කීදෙනා බැගින් සිටිය යුතුද?

III. පළාතේ කලාප අධ්‍යාපන කාර්යාලවල මෙකී ප්‍රමාණයන් සම්පූර්ණ කර තිබේද?

IV. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. I. කලාප 11 කි.

II. ස්ථිර 09 සහ වැඩ බලන 02 කි.

III. 02 කි.

IV. බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලයෙන් පුවත්පත් දැන්වීමක් මගින් ඉල්ලුම්පත්‍ර කැඳවා ඇති අතර අදාළ පුරප්පාඩු ඉදිරි කාලයේදී සම්පූර්ණ කරනු ලැබේ.

ආ. I. ඇමුණුම අමුණා ඇත.[2]

II. ස්ථිර 34
රාජකාරී ආවරණ 01
වැඩ බලන 03

III. රාජකාරී ආවරණ 01, වැඩ බලන 03.

IV. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සංඛ්‍යාවට වඩා දැනට සිටින සංඛ්‍යාව අඩු බැවින්.

ඇ. I. 14 කි.

II. එක් විෂයකට එක් අයෙකු බැගින් විෂයන් 14 ට 14 කි.

III. නැත.

IV. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අනුමත සංඛ්‍යාවට වඩා සිටින සංඛ්‍යාව අඩු බැවින්.

[2] පිළිතුර අවසානයේ පළ කර ඇත.

***ආ. I. ට අදාළ ඇමුණුම***

| කලාපය | කොට්ඨාශය |
|---|---|
| | මීගමුව |
| මීගමුව | කටාන |
| | ජාඇල |
| | මිනුවන්ගොඩ |
| මිනුවන්ගොඩ | මීරිගම |
| | දිවුලපිටිය |
| | අත්තනගල්ල |
| ගම්පහ | ගම්පහ |
| | දොම්පෙ |
| | බියගම |
| | මහර |
| කැලණිය | කැලණිය |
| | වත්තල |
| | උතුරු කොළඹ |
| | මැද කොළඹ |
| කොළඹ | දකුණු කොළඹ |
| | බොරලේල |
| | මහරගම |
| | කඩුවෙල |
| ශ්‍රී ජයවර්ධනපුර | කොලොන්නාව |
| | නුගේගොඩ |
| | කැස්බෑව |
| පිළියන්දල | දෙහිවල |
| | මොරටුව |
| | හංවැල්ල |
| හෝමාගම | පාදුක්ක |
| | හෝමාගම |
| | දොඩංගොඩ |
| | පානදුර |
| කළුතර | කළුතර |
| | බේරුවල |
| | හොරණ |
| හොරණ | බුලත්සිංහල |
| | බණ්ඩාරගම |
| | මතුගම |
| මතුගම | අගලවත්ත I |
| | අගලවත්ත II |
| | වලල්ලාවිට |

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට අතුරු ප්‍රශ්න තිබෙනවා. එතුමා 'අ' හි iv වන ප්‍රශ්නයට සඳහන් කළා. ඉල්ලුම්පත්‍ර කැඳවලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදී බඳවා ගන්නවා කියලා. එහි Closing date එක කවදාද? සහ ඒ අනුව මේ බඳවා ගැනීම් සම්පූර්ණ වන්න් කවදාද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඒක බලලා ඊළඟ සභාවේදී කියන්නම්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

## කටාන විවිධ සේවා සමූපකාර සමිතිය : පරීක්ෂණ වාර්තාව
KATANA MULTIPURPOSE COOPERATIVE SOCIETY : INVESTIGATION REPORT

**10.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍රVI(1)/14/21)**

අ. කටාන විවිධ සේවා සමූපකාර සමිතියේ ඇති වූ වංචා දූෂණ රාශියක් මෙම සභාවේ හෙළිදරව් කිරීම අනුව කොමසාරිස් පාලනයට යටත් කරනු ලැබූ, එකී සමූපකාර සමිතියේ පරිපාලන ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් සමූපකාර කොමසාරිස්වරයා විසින් මේ වන විට ඔබතුමා වෙත භාර දී තිබේද?

ආ. එසේ නම්, සමූපකාර කොමසාරිස්වරයා විසින් සකස් කරන ලද එම වාර්තාව සභාගත කරන්නේද?

ඇ. නොඑසේ නම් ඒ මන්ද?

ඈ. සමූපකාර කොමසාරිස්වරයා විසින් පරීක්ෂණ වාර්තාවක් මෙතෙක් භාර දී නොමැති නම් එම වාර්තාව ලබා ගැනීමට ඔබතුමා පියවර ගත්තේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

අ. ඔව්.

ආ. අවශ්‍ය ඕනෑම කෙනෙකුට සමූපකාර සංවර්ධන කොමසාරිස් වෙත ලිපියක් ඉදිරිපත් කිරීමෙන් පරීක්ෂණ වාර්තා ලබා ගත හැක.

ඇ. ඉහත පැහැදිලි කිරීම අනුව අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ඉ. ඉහත පැහැදිලි කිරීම අනුව අදාළ නොවේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, පළමු වන අතුරු ප්‍රශ්නය. මෙම විවිධ සේවා සමූපකාර සමිතියේ කටයුතු අධීක්ෂණයට ගිය නිලධාරීන්ට සහ ඒ වාහනයකට පහර දුන් බව ඔබතුමා දන්නේද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ප්‍රශ්නවලට මම දැන් උත්තර දුන්නා. උත්තර දුන්නාම අතුරු ප්‍රශ්නයක් අහන්න ඕනෑ ප්‍රශ්නයට දුන්න පිළිතුරේ ප්‍රශ්නයක් තිබෙනවා නම් තමයි. ඔබතුමිය ඔය ප්‍රශ්නය වේලාසනින්ම ඇහුවා නම් ඕකට මම අද උත්තර දෙනවා නේ? දැන් ලියලා ගෙනැල්ලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දැන් ගහපු එක පරීක්ෂණය කරලා තිබෙන්නේ. මෙතුමියට කියන්නම්. මෙතුමිය කියපු හින්දා නොවෙයි පරීක්ෂණය කරලා තිබෙන්නේ. පරීක්ෂණය කරලා තිබෙන්නේ 2010.12.09 වන දින. අධ්‍යක්ෂ මණ්ඩලයේ දූෂිත පාලනය යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත යවා ඇති පෙත්සමට අදාළව මහ සභා නියෝජිතයන් විසින් 2010.01.31 වන දින ඉදිරිපත් කරපු පෙත්සමට තමයි පරීක්ෂණය කළේ. මෙතුමියගේ ප්‍රශ්නයත් වැරදියි. නමුත් මම ඒක කිව්වේ නැහැ. ඊළඟට මෙතුමිය පළාත් සභාවේදී මේක අහන්නේ 2011.11.17 වන දින. එතකොට මේක සිද්ධ වුණා නම් වෙන්නේ 2010 දී. 2010 දී වුණු එකක් අතුරු ප්‍රශ්නයක් විධියට දැන් අහන්න ඕනෑ නැහැ. ඔබතුමිය අහන්න. මම නීත්‍යානුකූලව උත්තර දෙන්නම්. අදාළ අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමිය උගත් නීතීඥතුමියක් නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපි -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

2010 ගුටි කාපු එකක් ගැන දැන් අහනවා. ඉතින් ප්රශ්නයේම අහලා එව්වා නම් ඉවරයි නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපි ප්‍රශ්න අහන්නේ මේ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් මේ නිලධාරීන් හෝ ඇමතිතුමා හෝ අරගෙන තිබෙනවාද කියන එකයි. ඒක අපට දැන ගන්න ඕනෑ. එතකොට -

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමිය ඕනෑ ප්‍රශ්නයක් අහන්න. මම උත්තර -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ පහර දුන්න ඒ නිලධාරීන්ට පහර දීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පැහැදිලි කිරීම් නැතිව ඔබතුමිය මේ ප්‍රශ්නයට අදාළව අහන්න කෝ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ප්‍රශ්නය අහන්න කෝ උත්තර දෙන්න. පළමුවැනි ප්‍රශ්නය ඇහුවා උත්තරේ දුන්නා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්නය තමයි අහන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දෙවැනි ප්‍රශ්නය අහන්න කෝ ඔබතුමිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ පහර දීපුවාම ඒ වෙලාවේම පියවර ගන්නේ නැහැ. කාලයක් ගිහින් තමයි අහන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දෙවැනි ප්‍රශ්නය අහන්න කෝ. දෙවැනි ප්‍රශ්නය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම අහන්නේ ඒ නිලධාරීන්ට පහර දීම, වාහනයට පහර දීම සම්බන්ධයෙන් නීති පියවරක් අරන් තිබෙනවාද කියලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මට ඉතින් ඇලඩින්ගේ පුදුම පහන තිබෙනවා නම්, ඔබතුමිය අහපු ගමන් 2010 ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්. ඒ මිනිහාට ගැහුවාද? ගුටි කෑවාද? පරීක්ෂණ වුණාද? මොනවාද වුණේ කියලා. මම කොහොමද දන්නේ දැන්. මෝඩ ප්‍රශ්න අහන්න එපා. ඔබතුමිය අහන්න ඉතින්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, දන්නේ නැත්නම් -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෝඩ ප්‍රශ්න නේ අහන්නේ. 2010 එකක් දැන් මගෙන් අහනවා. මම යැ හිටපු ඇමතිවරයා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අමාත්‍යාංශයක් භාර ගත්තාම ප්‍රශ්නයට පිළිතුර දන්නේ නැත්නම් හොයලා ඒකට පිළිතුරු දෙන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔව්. පිළිතුරු දුන්නේ ඒක තමයි. ඔබතුමිය ප්‍රශ්නය අහන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එපමණ කෘතහස්ත දැනුමක් තිබෙනවා නම්, ඔය විධියට කථා කරනවා නම් -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඇලඩින්ගේ පුදුම පහන මට නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමන්ට භාර දුන්න අමාත්‍යාංශයේ මෙවැනි නීති පියවරක් ගත්තාද කියලා දැන ගන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දැන් ගරු සභාපතිතුමනි, මට -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලයක් ගිහිල්ලා දන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

පොඩ්ඩක් ඉන්න. ගරු සභාපතිතුමනි, මම ඉතා පැහැදිලි උත්තරයක් දෙන්නම්. දැන් රෝස් නෝනා ඇඳගෙන ඉන්නවා නේ? අපි ඇඳගෙන ඉන්නවා නේ. එතකොට අපි ඇඳගෙන හිටපු අපේ ඇඳුම ගැලෙව්වොත් තමයි අපි දන්නේ

හොරි තිබෙනවාද? කුෂ්ට තිබෙනවාද? දද තිබෙනවාද? කියන එක.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ අනවශ්‍ය කථා ගැන මම විරුද්ධයි. අනවශ්‍ය කථා මෙතැනට ඕනෑ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හැබැයි ඔබතුමියගේ තිබෙන -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනවශ්‍ය කථා නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්නාම අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා. මේ අහපු ප්‍රශ්නවලට අදාළව අතුරු ප්‍රශ්න තුනක් ඔබතුමිය අහන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මගේ අතුරු ප්‍රශ්නය අහන්නේ, නිලධාරීන්ට පහර දීම ගැන නීති පියවරක් ගත්තාද? නැද්ද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව කියන්නේ. දැන් මෙතුමිය 2010 ප්‍රශ්නයක් නේ ඇහුවේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලාව ඕනෑ නම්, එහෙම නම් වෙලාව ඉල්ලා ගන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

2010 ප්‍රශ්නයට මම උත්තර දුන්නා. එතකොට 2010 ප්‍රශ්නයක් නැවත අතුරු ප්‍රශ්නයක් විධියට අහනවා. ඉතින් 2010 ප්‍රශ්නයක්, 2010 ප්‍රශ්නයක් විධියටම අහන එක නේ? ගැහුවාද? ගුටි කෑවාද? පරීක්ෂණය කළාද? මොනවාද කළේ කියන එක අහන එක නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේකට උත්තර දෙන්න බැරි නම් වෙලාව ඉල්ලා ගන්න පුළුවන්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. මම වෙලාව ඉල්ලන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේගොල්ලන්ගේ මොළේ කුෂ්ට තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. (බාධා කිරීම්) මම අහන ප්‍රශ්නයට උත්තර -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. නැහැ. මම වෙලාව ඉල්ලන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ විධියට මේ සභාවේ ප්‍රශ්න අහන්න බැහැ. මොළේ තමයි කුෂ්ටෙ තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමිය ප්‍රශ්නය අහන්න කෝ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගහපු එකට මොකක් හරි සම්බන්ධයක් තිබෙනවාද දන්නේ නැහැ මෙපමණ තරහා ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

2010 ගහපු එකට මට කිසි සම්බන්ධයක් නැහැ නේ ලොක්කා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙපමණ තරහා ගිහිල්ලා තිබෙන්නේ ඇයි. ඔබතුමා ඔපමණ තරහා ගන්නේ ඇයි ඉතින්. අර අපේ මහ ඇමතිතුමා වාගේ හිනාවෙලා උත්තර දෙන්න කෝ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

දැන් මෙතුමිය අහන්නේ 2010 ප්‍රශ්නයක්. ඉතින් 2010 ප්‍රශ්න අහලා තිබෙනවා නේ මෙතැන.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

නැහැ ඇමතිතුමා, නිලධාරීන් පසුබිම් වාර්තාවක් ඔබතුමාට දෙන්න ඕනෑ. ඔබතුමා දැන ගන්න ඕනෑ ප්‍රශ්නයකට උත්තර දුන්නාට පස්සේ අතුරු ප්‍රශ්න පැන නඟින බව. නිලධාරීන් ඉන්නේ ඒකට. ඒකට පසුබිම් වාර්තාවක් -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. දිගින් දිගට විවාදයකට යන්න දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හරි. පොඩ්ඩක් ඉන්න කෝ. දැන් මෙතුමා මට උගන්වන්න එනවා නේ? ගරු මන්ත්‍රීතුමා. මොකක්ද මෙතුමිය අහන ප්‍රශ්නය. ඔබතුමා දන්නවාද?

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මම දන්නවා. (බාධා කිරීම්) න්‍යාය පත්‍රයේ තියෙන්නේ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ආ කියන්න. මොකක්ද අහන ප්‍රශ්නය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ලිස්සලා යන්න නොවෙයි අහන්නේ. කොමසාරිස් වාර්තාව -

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. ඔබතුමා කියන විධියට වැඩ කරන්න මම සූදානම් නැහැ. ඔබතුමා දන්නේ නැත්නම් අහගන්න. ඔබතුමා කොහොමද මට උගන්වන්න එන්නේ. ගරු සභාපතිතුමා, පැහැදිලිව මේ අහන්නේ සමූපකාරයේ ප්‍රශ්නයක්. සමූපකාරයේ ප්‍රශ්නයට මම අදාළ - සමූපකාරේ ප්‍රශ්නය අහන්න. දැන් සමූපකාර ප්‍රශ්නය සම්බන්ධව -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ (බාධා කිරීම්) පෞද්ගලිකව අපහාස කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීති පියවරක් අරන් තිබෙනවාද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. කවුද පෞද්ගලික අපහාස කළේ. නැහැ, නැහැ -

[සභාවේ ඝෝෂා]

තමුන්නාන්සේ මැදිහත් වෙන්න ඕනෑ නැහැ. තමුන්නාන්සේ තමුන්නාන්සේගේ වැඩක් බලා ගන්න කෝ. ගරු සභාපතිතුමනි, මෙතුමාට මැදිහත් වෙන්න තිබෙන අයිතිය මොකක්ද? පාර්ලිමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් විධියට මේ සභාවේ -

[සභාවේ ඝෝෂා]

එතුමිය අහපු ප්‍රශ්නයට ඔබතුමා කොහොමද මැදිහත් වෙන්නේ. මෙතුමාට අයිතියක් තිබෙනවාද? මෙතුමාට අයිතියක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, දැන් මේක දිගින් දිගටම විවාදයකට යන්න දෙන්න අමාරුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒක ඉවර කරන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නය ඇහුවා. ගරු මන්ත්‍රීතුමිය ප්‍රශ්නය අහපුවාම මම උත්තරය දුන්නා. එතුමිය අතුරු ප්‍රශ්නයක් ඇහුවාම මම කිව්වා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාලය ඕනෑ නම්, කාලය ගන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඉන්න කෝ මම කියනකම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම අනවශ්‍ය කාරණාවලට යන්න දෙන්න අමාරුයි. ඔබතුමිය -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ඇමතිතුමා, එක්කෝ කාලය අරගෙන උත්තරයක් දෙනවා නම් මේක ඉවරයි. ඇති වුණු සිද්ධියක් පිළිබඳව නේ මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මොනවටද ඇමැතිලා ඉන්නේ. වාර්තාව අරගෙන බම්බු ගහන්නද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මම හිතන්නේ කාලය අරගෙන ඒ කටයුත්ත කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා අපි දිගින් දිගටම යන්න ඕනෑ නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් උත්තර ටිකක් දෙන්න කෝ.

[සභාවේ ඝෝෂා]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අපේ රීති පිළිබඳව ඔබතුමාගේ නිසි අවධානය යොමු කරනවා. මෙතැන මේ ප්‍රශ්නය මතු වෙන්නේ, අතුරු ප්‍රශ්න ඇසීමක් සමහයි. අනිවාර්යයෙන් මේ මන්ත්‍රීවරු කියපු ආකාරයෙන් ඇමතිවරු අපි බලාපොරොත්තු විය යුතුයි අතුරු ප්‍රශ්න පිළිබඳව. මේ උපරිමය තුන දක්වා වූ අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න අපි බැඳිලා ඉන්නවා. නමුත් ඒ අතුරු ප්‍රශ්නය මේ අදාළ උත්තරයට සම්බන්ධ දෙයක් වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සම්බන්ධ දෙයක් වෙන්න ඕනෑ. ඒක හරි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එතුමියට වෙනත් ප්‍රශ්න තිබෙන්න පුළුවන් ඒවා සම්බන්ව. ඒක අලුත් ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කළාම ඇමතිතුමාට පුළුවන් ඒ අදාළ දිනයේදී ඒ පිළිතුරු ලබා දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ කාගේවත් සහාය අවශ්‍ය නැහැ. සහයෝගය අවශ්‍ය නැහැ මේකට. මම අහන්නේ -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මම මේකට පැහැදිලි උත්තරය දුන්නා. උත්තරය දුන්නාම මේ උගත් නීතිඥතුමියට තේරෙන්නේ නැහැ උත්තරේ. ඒක තමයි පැහැදිලි කළේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ රජයේ නිලධාරීන්ට ගැහුවා -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීතුමා මෙතුමියගේ ප්‍රශ්නයට මම උත්තර දුන්නාම මෙතුමා ප්‍රශ්න කරනවා. (බාධා කිරීම්) මෙතුමාට තිබෙන අයිතිය මොකක්ද මගෙන් ප්‍රශ්න කරන්න. සභා රීති අනුව. මේ සභා රීති අනුව තමුන්නාන්සේට තිබෙන අයිතිය මොකක්ද? තමුන්නාන්සේට කිසි අයිතියක් නැහැ. රෝස් එක්ක තිබෙන සම්බන්ධතාවය මොකක්ද තමුන්නාන්සේට.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අනවශ්‍ය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක ගරු කටයුතු සභාවක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා පොඩ්ඩක් නිහඬ වෙන්න. ඔබතුමා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ විධියට මේක ගෙනියන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ.

[සභාවේ ඝෝෂා]

හරි. ගරු ඇමතිතුමා, මෙහෙම කරපු. එතුමියට අවස්ථාව ලබා දෙමු තව ප්‍රශ්න දෙකක් අහන්න. මෙතුමාට දැන් උත්තර දෙන්න බැරි නම් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉස්සෙලා කථා කරන්න ඉගෙන ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

උත්තරයක් දෙන්නම් කිව්වා නම් ඉවරයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. එක්කෙනෙක් කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. ගරු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් ගරු අමාත්‍යවරයෙකුගේ විෂය පථයට අදාළව ප්‍රශ්නයක් ඇහුවාම මම අදාළ උත්තරය දුන්නා. එතුමිය ඊට පස්සේ අතුරු ප්‍රශ්න ඇහුවා. හැබැයි, මේ අහපු ප්‍රශ්නවලට අදාළ නැති ඒවා. එතකොට මම පැහැදිලිව කිව්වා. ඔබතුමිය මේක අහන්න තිබුණා. නැත්නම් ඔබතුමිය අහන්න කියන එක. ඒක එතුමියට තේරුණේ නැහැ. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කථා කරපුවාම තේරුණා. හැබැයි, මට තිබෙන බරපතළම කාරණාව තමයි එතුමිය ප්‍රශ්නය ඇහුවා. මම උත්තරය දුන්නා. මේ ජනතා විමුක්ති පෙරමුණේ මේ මන්ත්‍රීතුමාට රීති අනුව මොකක්ද තිබෙන අයිතිය මේ ගැන කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගම්මන්පිල අමාත්‍යතුමාට මොකක්ද තිබෙන අයිතිය.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම යන්න දෙන්න බැහැ මට මේ ප්‍රශ්නය පිළිබඳව. මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි ඒක පස්සේ බේරා ගනිමු. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය තව අතුරු ප්‍රශ්න දෙකක් අහලා මේ ප්‍රශ්නය ඉවර කර ගනිමු. ඔබතුමියත් බොහොම කෙටියෙන් - දැන් බැරි නම් පස්සේ උත්තරයක් දෙන්න ඔබතුමා. සති දෙකක් කල් ඉල්ලා ගන්න කෝ. ගරු ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කල් ගන්න දෙයක් නැහැ ගරු සභාපතිතුමනි. මම උත්තර දීලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නයට අදාළ නම් ඔබතුමා කල් ඉල්ලා ගන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ආයි වෙනම අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එහෙම නොවෙයි. ඔබතුමාට මේ ප්‍රශ්නයට අදාළ නම් ඒ අහන -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා, මගේ ස්ථාවරය. අමාත්‍යවරයකුගෙන් ප්‍රශ්න අහලා තිබෙනවා. අමාත්‍යවරයා උත්තර දීලා තිබෙනවා. නැවත ප්‍රශ්න අහන්න. උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා පොඩ්ඩක් නම්‍යශීලී වෙන්න කෝ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අමාත්‍යවරයා උත්තර දීලා තිබෙනවා. නැවත ප්‍රශ්න අහන්න. උත්තර දෙන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇති. ඔබතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නැහැ. පොඩ්ඩක් ඉන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමා, අදාළ මන්ත්‍රීතුමියට ඒ ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි මම කියන්නේ. ඉඩ දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතකොට ඇමතිතුමා කල් ඉල්ලනවා.

[සභාවේ ඝෝෂා]

මේ තමුන්නාන්සේලා හැසිරෙන විධිය වැරදියි. මෙහෙම කෑ ගහන්න එපා. මේ සභාවේ ගෞරවය තියා ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. මම දන්නවා. ඔබතුමන්ලාගේ කටවල් ශබ්දයි. සැරයි. (බාධා කිරීම්) ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය අතුරු ප්‍රශ්න දෙකක් අහන්න කෝ. අනික් මන්ත්‍රීවරුන්ගේ කාලය ගන්න එපා. තව කථා කරන මන්ත්‍රීවරු ගොඩක් සභාවේ ඉන්නවා. නිශ්ශබ්දව ඉන්න මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අයට තව අවස්ථාව දෙන්නට ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ඉතාම ගෞරවයෙන් සහ ඉතාම කරුණාවෙන් මෙන්න මේ ප්‍රශ්නය ඉතාම කරුණාවෙන් අපි අහනවා. දැන් කොමසාරිස් පාලනයකට මේ විවිධ සේවා සමූපකාර සමිතිය යටත් කෙරුවේ යම්කිසි අකටයුතුකම් වුණු හින්දා. මේ පරීක්ෂණයට ගිය නිලධාරීන්ට පහර දීමක්, වාහනයට පහර දීමක් සිද්ධ වුණා. එතකොට ඒ පරීක්ෂණ

[ගරු රෝස් ප්‍රනාන්දු]

වාර්තාව ලැබෙන්නේ ඇමතිවරයාට. 2000 හරි, 2001 හරි අවුරුද්ද නොවෙයි ප්‍රශ්නය. මම අහන්නේ, මේකට නීති පියවරක්, මේ අමාත්‍යාංශය යටතේ නිලධාරීන් විසින්, මේ රජයේ නිලධාරීන්ට ගහපු එකට පියවරක් ගත්තාද? ඒක හරි පැහැදිලි ප්‍රශ්නයක්.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, මට ප්‍රශ්නය ඉතාමත් පැහැදිලියි. මම මේ ප්‍රශ්නයට ගරු සභාපතිතුමා උත්තරයක් දෙන්නම්. මෙතුමිය උගත් නීතිඥතුමියක් හින්දා මෙතුමියට මම හරියටම උත්තරය දෙන්නම්. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමියට ඉදිරිපත් කරන්නම්. ඔබතුමියගේ ප්‍රශ්නය. බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරණ සමූපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය මගින් සංශෝධිත බස්නාහිර පළාත් සභාවේ 98 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය අනුව සමිතියට අදාළව 41 පරීක්ෂණයක් සිදු කරන ලදී. එහි පරීක්ෂණ වාර්තාව අනුව චෝදනා පත්‍ර නිකුත් කළ අතර, එම චෝදනා පත්‍රවලට පිළිතුරු ප්‍රඥප්තියේ 48(5) (අ) වගන්තිය යටතේ පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩලයට යොමු කර එකී සමාලෝචන මණ්ඩලයේ නිර්දේශ අනුව නුසුදුස්සන් ඉවත් කර ඇත. සමූපකාර සමිති ප්‍රඥප්තිය අනුව මේ සම්බන්ධව කටයුතු කිරීමට බලය පැවරී ඇත්තේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත බැවින්, ඔහු විසින් මෙම කටයුත්ත කරනවා. මෙතුමිය කියනවා, මේ සභාවේ ඇමතිවරයාට තමයි බලය තියෙන්නේ කියලා. (බාධා කිරීමක්) ඉතින් මම කියන දේ අහගන්න කෝ. ඔබතුමිය අහගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අහගෙන ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු මන්ත්‍රීතුමියට සහ සභාවට මම එළි කරනවා. මෙතුමිය පැහැදිලි කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙවැනි පියවරක් ගත්තාද කියලා අහන්න ඇමතිවරයාගෙන් තමයි අහන්න ඕනෑ. නැත්නම් වෙන කාගෙන්වත් අහන්න බැහැ නේ. මෙතැන කොමසාරිස් කෙනෙක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමිය පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා, සමූපකාර සංවර්ධන පනත ගැන දන්නේ නැත්නම් ඔබතුමිය ඒක ඉගෙන ගෙන එන්න. ඔබතුමිය නීතිඥවරියක් වෙලා ඔබතුමිය මට ඇඟිල්ල දික් කරනවා ඇමතිවරයා වග කියන්න ඕනෑ කියලා. ඇමතිවරයා තමයි මේකට උත්තර දෙන්න -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම පනත් ගැන දන්නවා. මම ඇමැතිවරුත් ගැනත් දන්නවා. ප්‍රශ්නය අහන කොට මේක කොමසාරිස්ගෙන් වාර්තාව ලබා ගත හැකියි කියලා නිහඬ වෙන්න බැහැ. මේකට පියවරක් ගත්තාද කියලා ඇමතිවරයා උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. නැහැ. ගරු සභාපතිතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය සම්බන්ධව මට තවදුරටත් කාලය දෙන්න බැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒ ගැනත් කියන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමතිවරයා ගිහින් නඩු දාන්නේ නැහැ. ඒකට නිලධාරීන් ඉන්නවා කියලා අපි දන්නවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

2011 - උගත් නීතිඥතුමිය අහගෙන ඉන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීතිය අපි දන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා, මේ මන්ත්‍රීවරුන්ටත් මම කියන්නම්. මේ බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති - දැන් මේ ගැන වැරදි අවබෝධයක් තිබෙනවා. මේ සමූපකාරය අයිති ඇමතිවරයාට කියලා. ඇමතිවරයාට අයිති නැහැ. පොඩ්ඩක් ඉන්න කියන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම නම් සමූපකාර ඇමති වුණේ මොකටද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

සමූපකාරය කියන්නේ ප්‍රජාපාදිත ආයතනයක්. ප්‍රජාපාදිත. ප්‍රජාපාදිත කියන්නේ මොකක්ද දන්නවාද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සමූපකාර විෂය මොකටද භාර ගත්තේ. ඒ විෂය ගැන ප්‍රශ්න අහන්න වෙන කවුරුත් නැහැ මෙතැන.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ප්‍රජාපාදිත කියන්නේ මොකක්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙතැන ප්‍රශ්න අහන්න ඉන්නේ අමැතිවරයා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ප්‍රජාපාදිත ආයතනයක් කියන්නේ මොකක්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නිලධාරීන් නියෝජනය කරන්නේ නැහැ මෙතැන. නිකම් වගෙන් ඔරෝ උත්තර දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්නය පිළිබඳව මට දිගින් දිගටම කාලය දෙන්න බැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මෙතුමියට ඉඳගන්න කියන්න. මම උත්තර දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක විසඳගන්න ඕනෑ. විවාදයකට යන්න දෙන්න බැහැ. කරුණාකරලා දෙන්නම වාඩි වෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම නම් මේ ලංකාවේ වෙන එකක්වත් ගැන ප්‍රශ්න අහන්න ලැබෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මට ඔබතුමියට අතුරු ප්‍රශ්න අහන්න දෙන්න බැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නොමග අරින්න එපා සභාව.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා, සමූපකාර ව්‍යාපාරය කියන්නේ, ප්‍රජාපාදිත ආයතනයක්. ඒ කියන්නේ ස්වාධීනව සමිතියේ සිටින සාමාජිකයෝ විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරලා, ඒ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සභාපති පත් වෙලා කටයුතු කරන ස්වාධීනව තීන්දු තීරණ ගන්න ආයතනයක්. (බාධා කිරීම්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි දන්නවා ඒවා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඉතින් කට වහගෙන ඉන්න කෝ පොඩ්ඩක්. (බාධා කිරීම්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ප්‍රශ්න අහන්නේ. ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මේ උත්තරේ දෙන්නේ. ගරු සභාපතිතුමා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මොලේට කුෂ්ටයක් ඇවිල්ලාද කොහේද? ඔලුව ඉදිමිලා. ප්‍රශ්නයට උත්තරේ දෙන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

මම උත්තරේ දෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක ගැටුම්වලට යන්න අවශ්‍ය නැහැ. දැන් උත්තරේ දුන්නා නේ?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු සභාපතිතුමා, උත්තරේ දුන්නේ නැහැ තාම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා උත්තරයක් දුන්නා නේ දැන්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

නැහැ. නැහැ. උත්තරේ දුන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තර දුන්නා දැන්. ආයිත් උත්තර ඕනෑ නැහැ. දිගින් දිගමට උත්තර දෙන්න ඕනෑ නැහැ. දැන් ඇති. උත්තරේ ඇති.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එහෙම නම් සභාගත කරන්නද? උත්තරේ සභාගත කරන්නද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න. පොඩ්ඩක් වාඩි වෙන්න කෝ.

[සභාවේ ඝෝෂා]

මේ අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා මම තාවකාලිකව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.35 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ [යසපාල කෝරලගේ මහතා] ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***
*Accordingly the Sitting, Suspended and. it resumed at 11.35 a.m with Hon Deputy Chairman [Mr. Yasapala Koralage] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින්, න්‍යාය පත්‍රයේ අංක 11 යටතේ වූ ප්‍රශ්නය ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

## මීගමුව නව බස් නැවතුම් පොළ
NEGOMBO NEW BUS STOP

**11.**

**රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍රVI(1)/14/22)**

අ. මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදි කළ නව බස් නැවතුම්පල ඉදි කිරීමට දැරූ සම්පූර්ණ වියදම කොපමණද?

ආ. මෙම බස් නැවතුම්පල තුළ කුළියට දීම සඳහා ඉදිකළ කඩ කාමර ගණන කොපමණද?

ඇ. එකී කඩ කාමර කුළියට දීම සඳහා ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කළේද?

ඈ. මේ වන විට එකී කඩ කාමරවලින් කුළී පදනම මත ලබා දී ඇති කඩ කාමර ගණන කොපමණද?

ඉ. මෙම කුළියට දී ඇති කඩ කාමරවලින් පසුගිය වර්ෂය තුළ ලැබී ඇති ආදායම කොපමණද?

ඊ. මෙම බස් නැවතුම්පල පිරිසිදු කිරීමේ වගකීම පවරා ඇති ආයතනය කුමක්ද?

උ. මෙම බස් නැවතුම්පල පිරිසිදු කිරීමේ වියදම වාර්ෂිකව කොපමණද?

ඌ. එම වියදම් කරනු ලබනනේ කවුරුන් විසින්ද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අ. අදාළ නොවේ.

ආ. අදාළ නොවේ.

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

ඊ. අදාළ නොවේ.

උ. අදාළ නොවේ.

ඌ. අදාළ නොවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මුකුත් නැහැ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොහොම හොඳයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම බස් නැවතුම්පල තුළ කඩ කාමර ඉදි කිරීමෙන් පසුව ලබා දෙන පොරොන්දුව පිට සිවිල් පුරවැසියන්ගෙන් මුදල් එක්රැස් කළේද? අතුරු ප්‍රශ්නයක්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පැහැදිලිව උත්තර දුන්නේ, මට අදාළ නැත කියන එක. අදාළ නොවේ කියන එක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අදාළ නොවේ කියලා කියන්නේ, මගේ විෂයයට අදාළ නොවේ. ඔබතුමිය නැවත වතාවක් අදාළ විෂයය භාර ඇමැතිතුමාගෙන් ඔය ප්‍රශ්න ටික අහන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සල්ලි එකතු කරපු කෙනාව අපි දන්නවා. මම ඊළඟ දවසේ අහන්නම්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හරි කෙනාගෙන් අහන්න.

## නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"නිහාල් ප්‍රේමශාන්ත ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් සඳහා නිවාඩු අනුමත කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. සභාවේ අපට වාඩි වෙන්න කැඩුණු පුටු දීලා තිබෙන්නේ. දැන් කිහිප දවසක් මතක් කළා. තවම ලැබිලා නැහැ. ඒ පුටුවල ඉඳගෙන ඉන්න අපහසුයි. දැන් දෙතුන් වතාවක් ඉල්ලීම් කළා තවම පුටු ලැබිලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලබන සභා වාරය වනකොට ඉක්මන් කරලා -

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (3) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි මෑතදී පළාත් සභාව හරහා කෙරෙන වැඩ මුළුවක් සඳහා සම්බන්ධ වුණා. ඒ වැඩ මුළුව හලාවත ප්‍රදේශයේ තිබුණේ. අපි ඊට සම්බන්ධ වෙලා එම වැඩ මුළුවේ කටයුතු අවසන් වුණාට පස්සේ අපි කරපු ක්‍රියාදාමයන් පිළිබඳව ඇතැම් ජනමාධ්‍ය තුළින් වැරදි විධියට අපව අර්ථ කථනය කරලා තිබෙනවා. එකක් තමයි මම වෘත්තීයෙන් ගුරුවරයෙක්. ඒ වාගේම මම හිතන්නේ ආසියාවේ දිගම ටෙලි නාට්‍යයට සම්බන්ධ වුණු, දීර්ඝ කාලයක් කලාකරුවෙක් හැටියට ඉන්න කලාකාරයෙක්. ඒ නිසා යම් උත්සවයකදී අපි වෘත්තියෙන් ගායකයොත් වෙනවා. අපි මුදල් ලබාගෙන වේදිකාවේ ගායනා කරනවා. ඔබතුමා දන්නවා (බාධා කිරීමක්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඔබතුමාගේ ප්‍රසංගවලට පවා මම සහභාගී වෙලා තිබෙනවා. එවැනි ප්‍රවීන ප්‍රසිද්ධ කලාකරුවෙක් හැටියට මන්ත්‍රීවරයෙක් වශයෙන් එහිදී මාවත්, මගේ සහෝදර කලාකරු රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමාත්, තවත් අපේ යම් පිරිසකුත් මධ්‍යසාර පානය කරලා, යම් යම් විධියට අකටයුතු ආකාරයට ක්‍රියාත්මක වුණාය කියලා ජනමාධ්‍ය ඔස්සේ වැරදි විධියට සඳහන් කරලා තිබෙනවා. මම හිතන්නේ, මේක අපේ වරප්‍රසාදමය ගැටළුවක්. අපි එහෙම කිසිම අවස්ථාවක සම්බන්ධ වෙලා නැහැ. ඒ නිසා මේ පිළිබඳව වහාම සොයා බැලීමක් කරලා නිවැරදි කරන්න කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන් හැටියට ඔබතුමාත් නියෝජනය කරන හොරණ කලාප කාර්යාලයේ අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡාවක් කැඳවලා තිබුණා. ඒකට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කිසි කෙනෙකුට ආරාධනා නැහැ. මොකද, අපි මේ පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට බස්නාහිර පළාතේ පාසල් විශේෂ ව්‍යාපෘති යටතේ වාර විභාග ප්‍රශ්න පත්‍ර ගන්න - රුපියල් 600 ක මුදලක් අරගෙන විභාග ප්‍රශ්න පත්‍ර ගන්න එන්නය කියලා විදුහල්පතිවරුන් විසින් ළමුන්ට ප්‍රකාශ කරලා තිබෙනවා. ගියවරත් ඔය වාගේ ප්‍රශ්නයක් ඇවිල්ලා හොරණ කලාපයට අයිති මේධංකර විද්‍යාලයේ දෙමව්පියන්ට මේ සල්ලි ගෙවා ගන්න බැරුව එක් දැරියක් පොල් ගෙඩි වාගයක් එකතු කරගෙන විකුණලා සල්ලි එකතු කර ගන්න ගියාම උසාවියට දාලා ඒ දරුවාගේ අධ්‍යාපනයටයි, මානසිකත්වයටයි විශාල කැළැලක් ඇති වන කාරණාවක් බවට එය පත් වුණා. උපදේශක සභාවට විපක්ෂයේ මන්ත්‍රීවරු කැඳවන්නේ නැතුව මෙවර එම උපදේශක සභාව පැවැතුණේ ඇයි කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

උපදේශක කාරක සභාව තවම පැවැත්වූයේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒකට මමම උත්තර දෙන්නම්. කෙතැන හරි දැනුම් දීමේ අඩුපාඩුවක් නිසා පළමුවැනි සභා රැස්වීම අතපසු වෙලා තිබෙනවා. මම පැහැදිලිව කලාප අධ්‍යක්ෂවරුන්ට දැනුම් දුන්නා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ව සහභාගී කරවන්නේ නැහැ කියලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කලාප අධ්‍යක්ෂතුමිය විසින් අපට දැනුම් දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අනිවාර්යයෙන්ම කලාප කාර්යාලයේ, කලාප අධ්‍යක්ෂවරයාගෙන් වුණු වැරැද්දක් මිසක් ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන්වත්, ලේකම්වරුන්ගෙන්වත් වුණු වැරැද්දක් නොවෙයි. මේ වැරැද්ද නිවැරැදි -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ පළාත් සභාවෙන් කලාප කාර්යාලයට ලිපියක් යවලා තිබෙනවාලු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, නැහැ. ඒක වැරැදි ආකාරයේ -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විතරයි මේකට සම්බන්ධ වෙන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක මම පැහැදිලිව බැලුවා. වැරැදි අර්ථ දැක්වීමක් විතරයි සිද්ධ වෙලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට Copy එකක් දෙන්නම් කියලා කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මීන් පස්සේ ඒක නිවැරැදි වෙලා ක්‍රියාත්මක වෙයි. වැරැද්දක් වුණා නම් ආණ්ඩු පක්ෂය වශයෙන් අපි සමාව ඉල්ලනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. පළමුවැනි වසරට ළමුන් ඇතුළත් කිරීම සහ ගොඩනැගිලි ඉදි කිරීම පිළිබඳව දැවැන්ත ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ නිසා ඉක්මණින් එම කාරක සභාවට අපව සහභාගී කරවන්න කියලා ඔබතුමාගෙන් මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayaka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(3) යටතේ මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි සහභාගී වුණු සම්මන්ත්‍රණයේදී හවස සිදු වුණු සිදුවීම් රූපගත කරලා, කරපු දේවල් වීඩියෝ කරලා ඒවා මාධ්‍යවල පළ කළා. ඇත්තටම ඒකෙන් අපට හානියක් වෙනවා. මේක අඬගහලා කන්න දීලා ගහනවා වාගේ වැඩක්. කරුණාකරලා සොයා බලන්න, මේ පින්තූර ගියේ කොහොමද? මේ පින්තූර ගත්තේ කවුද? මේ දේවල් කිව්වේ කවුද? කියලා සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මා බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධූරයට පත් කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයටත්, සියලුම මැති ඇමැතිතුමන්ලාටත්, ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රමුඛ පළාත් සභාවේ සියලුම මහජන නියෝජිතයින්ටත් මගේ ගෞරවය ප්‍රශංසාව පිරිනමනවා. විශේෂයෙන් මේ අවස්ථාව -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමාට නැද්ද?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

සියලු දෙනාට පොදුවේ. ඒ වාගේම මේ අවස්ථාව වෙන් කර ගත්තේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2016 උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් සඳහා හෙට දවසේ උසස් පෙළ පන්ති ආරම්භ වෙනවා. ඒත් පාසල්වල විදුහල්පතිවරුත් ඒ වාගේම පාසල් බලධාරීනුත් විසින් නියමිත සේවා ගාස්තුවලට අමතරව මුදල් අය කර ගනිමින් උසස් පෙළ පන්තියට සහභාගී වන සිසු දරු දැරියන් සිසුන්

[ගරු සිසිර ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා]

ඇතුළත් කර ගැනීමේ ක්‍රියාමාර්ගය සිදු වන බව පාසල් ගණනාවකින්ම වාර්තා වෙනවා. (බාධා කිරීමක්) කථා කරන්න ඉඩ දෙන්න. අහගන්න මොකක්ද කියන්න යන්නේ කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප විශ්වාස කරනවා පළමුවැනි වසරේ සිට සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ දරුවන්ගෙනුත් උසස් පෙළ අධ්‍යයනයේදී එවැනි මුදලක් අය කරන්න උත්සාහ කරනවා නම් එය බරපතළ කනගාටුවක්. රජයක් විධියට අධ්‍යාපනය සම්බන්ධයෙන් සුවිශාල ප්‍රතිපාදන ප්‍රමාණයක්, අපේ රටේ ඉතිහාසයේ වැඩිපුරම වෙන් කර ඇත්තේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපේ රජය. ඒ වාගේම භෞතික සම්පත්, මානව සම්පත් හැකි උපරිමයෙන් ලබා දෙනවා. මහින්දෝදය තාක්ෂණාගාර, ප්‍රාථමික පාසල් හය දහසක්. රට පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශාල සංවර්ධනයක් සඳහා පාසල් පෙළ පොතේ ඉඳන් උසස් අධ්‍යාපනයේ ඉහළ අවස්ථාව දක්වා අධ්‍යාපනය ක්ෂේත්‍රයට ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනවා. බස්නාහිර පළාත් සභාව විධියට අපි ඉතාම සතුටුයි අපේ පළාත් සභාවේ 50% කට වඩා වැඩි කොටසක් අධ්‍යාපන අමාත්‍යාංශයට වෙන් කරන්නේ අපේ දරුවන් වෙනුවෙන්. ඒ නිසා පළාත් සභාවක් විධියට අපි මෙතරම් විශාල මුදලක් වැය කර ගෙන යද්දී, අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් කැපවෙමින් තිබියදී ඇතැම් පාසල්වල විදුහල්පතිවරුන් සහ පරිපාලනය විසින් කරන මේ ක්‍රියාදාමයට පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන් විධියට අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඒ නිසා විශේෂයෙන්ම අපි ඉල්ලීමක් කරනවා. මෙවැනි අයථා ලෙස මුදල් අය කරනවා නම්, එවැනි අය කරන පාසල් සහ පරිපාලනයන්, විදුහල්පතිවරුන් පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න කියලා. ඒවාට භාජනය වන අහිංසක දෙමව්පියන්ට - අපේ රටේ මිනිස්සු විවිධ ආර්ථික දුෂ්කරතා මැද්දේ ජීවත් වෙන්නේ. ඒ ගැන හංගන්න දෙයක් නැහැ. ඒ නිසා ඒ මිනිස්සු ඒ කාරණය අධ්‍යාපනය බලධාරීන් වෙත, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන්නොත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න. අපි විශ්වාස කරනවා. එය අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ නායකත්වය යටතේ බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වගකීමක් කියලා. ඒ නිසා කුමනාකාරයකින් හෝ පළමුවැනි වසර සිසුන් ඇතුළත් කිරීමේ තරගය දැන් ආරම්භ වෙලා තිබෙනවා. හොඳ පාසලකට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳ දෙමව්පියන්ගේ මානසිකත්වය. බොහොම පෘථග්ජන ස්වභාවයක්. ඒ නිසා මේවා ගැන බොහොම සමබරව හිතමු. ඒ නිසා මෙහි වගකිවයුත්තන් පිළිබඳව ඉතාමත් ගැඹුරින් තෝරාගෙන ඒවාට අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගන්න බස්නාහිර පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විධියට මැදිහත් වෙන්න කියන එක ආයාචනය කරනවා. ඔබතුමාට බොහොමත්ම ස්තූතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ට කථිකාචාර්ය කොටුපිටියේ රාහුල හිමියන් සහ නිකාරේ ඥානතිලක යන ස්වාමීන් වහන්සේලා වාද්දුව, තල්පිටිය, කිරිපැල්ලගහවත්ත කියන ඉඩමට අනවසරෙන් ඇතුළුව කරන අනවසර ඉදි කිරීමක් පිළිබඳව 2516/ඉඩම්, පානදුර දිසා අධිකරණයේ පවතින අධිකරණ කටයුත්තක් තිබියදී, මෙම ස්ථානයට තල්පිටිය ගඟ සහ මුහුද යාවන මෝයෙන් අනවසරයෙන් වැලි ඇදීමට 2014.06.28 වන දින ක්‍රියා කිරීමත්, ඒ සඳහා 262 - 1031 කැන්ටර් ට්‍රක් රථය යොදා ගැනීම සම්බන්ධයෙනුත් මම වාද්දුව පොලීසියට පැමිණිල්ලක් කළා. මෙහිදී මෙම වැලි පැටවීම සඳහා භාවිතා කර තිබුණේ, පානදුර ප්‍රාදේශීය සභාවට අයත් බැකෝ යන්ත්‍රයයි. මේ බැකෝ යන්ත්‍රයේ රියදුරු ගුණපාල මහතා මම ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කරපු කාලේ සේවයට ඇතුළත් වුණු කෙනෙක්. ඔහු ඒ බැකෝ යන්ත්‍රයෙන් ඒ ස්ථානයට ආවා. මම ඇහුවා, කොහොමද තමුසේ මේකට මැදිහත් වුණේ කියලා. ඔහු මට කියා සිටියේ, සභාපතිතුමා දැනුම් දුන්නා මේ කටයුත්තට සහභාගී වෙන්න කියලා. මම සභාපතිතුමාට දුරකථනයෙන් කථා කරලා ඇහුවා තමුන්නාන්සේ අනවසර කටයුත්තක් සඳහා බැකෝ යන්ත්‍රය යොදවලා තිබෙනවා. ඒ ක්‍රියා කරපු ආකාරය මොකක්ද කියලා. ඔහු කීවේ පොලිස් ස්ථානාධිපතිතුමාගේ ඉල්ලීම අනුව මේ කටයුත්තට මෙම යන්ත්‍රය ලබා දුන්නු බව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම වාද්දුව පොලිස් ස්ථානාධිපති උපුල් සෙනෙවිරත්න මහත්මයාට කිහිප වතාවක් දුරකථනයෙන් කථා කළා. මට සම්බන්ධ කර ගන්න හම්බ වුණේ නැහැ. මම පානදුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කපිල කඩුපිටිය මහත්මයාට දුකරථනයෙන් කථා කරලා මේ පිළිබඳව කිව්වා. ඔහු කිව්වා, වාද්දුව පොලිස් ස්ථානාධිපතිතුමාට කථා කරනවා කියලා. පසුව ඔහු මට

කථා කළා. මම මේ පැමිණිල්ල කළා. දැන් මේ අනවසර ඉදි කිරීම සම්බන්ධව මම ඊට පස්සේ ජොෂ්ඨ පොලිස් අධිකාරීතුමා හම්බ වුණා. වාද්දුව පොලිස් ස්ථානයට පැමිණිලි කරලා තිබෙනවා. මම කළුතර ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති වී. ඉන්ද්‍රන් මහත්මයාට දැනුම් දුන්නා. ඔහුත් කිව්වා එහෙම කරන්න බැහැ. මේක නීති විරෝධීයි. දැනුම් දෙනවා කියලා. නමුත් අද වනතුරත් මේ නීති විරෝධී ක්‍රියාව අඛණ්ඩව සිද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි. දැන් සාමාන්‍යයෙන් පූජනීය ස්ථානයක අවශ්‍ය කටයුත්තකට, උත්සවයකට වැලි ටිකක් ගේන එක පිළිබඳව අපේ විරෝධතාවයක් නැහැ. නමුත් මේ ස්ථානයට වැලි ගෙනැල්ලා, මිදුලේ අඟල් හයක විතර වැලි තට්ටුවක් අතුරලා අනවසර ඉදි කිරීම කරන්න ඕනෑ වුණාම ගොඩ ගහලා කරනවා. හැමදාම බෝ මළුවට වැලි අදිනවා. හැමදාම පන්සල් බිමට වැලි අදිනවා. වැලි ඇදලා ඉවර වෙලා අනවසර ඉදි කිරීම කරන්න ඕනෑ වුණාට පස්සේ ඒ වැලි ටික ආපහු ගොඩ ගහගන්නවා. ගොඩ ගහලා වැඩේ කරනවා. වැඩේ ඉවර වුණාට පස්සේ ආපහු තුනී කරනවා. ඉතින් මේ වාගේ ක්‍රියාවක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිතුමාගෙන් විමසීමක් කළාම වාද්දුව පොලිස් ස්ථානයේ ජීප් රථය මෙම අනවසර වැලි ප්‍රවාහනය කිරීම සඳහා ආරක්ෂාව සැපයුවා කියන කාරණාව තමයි ගම්මු කියන්නේ. දැන් මේ කටයුත්ත සඳහා යොදා ගත්තු වාහනයේ අංකයත් මා ළඟ තිබෙනවා. මගේ ජීප් රථය හරස් කරලා මේ වාහනය නතර කර ගත්තා. නතර කරලා පොලීසියට කථා කළා. මම කියන්නේ මේකයි. මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් අපි කථා කරන්නේ මානව හිමිකම් පිළිබඳව. රටේ නීතිය ආරක්ෂා කිරීම පිළිබඳව. රටේ නීතිය රකින්න අපි භාර කරලා තිබෙන පුද්ගලයෝ ඒ නීති විරෝධී ක්‍රියාවලට -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

වැඩේ කවල් වෙලා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අනුබල දෙනවා නම්, ඒකට මඟ පෙන්වනවා නම්, ආරක්ෂාව සංවිධානය සපයනවා නම් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මණ්ඩලේ කවල්.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු මන්ත්‍රීතුමා ඕවා -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

විපක්ෂයේ හිටපු සංවිධායකතුමා අපි දන්නවා කවුරුත් වාචාලයෝ කියලා. නමුත් තමන්ගේකමක්, හිතවත්කමක්, ලෙංගතුකමක් මන්ත්‍රීවරුන් අතර තිබෙන්න ඕනෑ. ඒකත් නැති වුණාම වැඩක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඇමැති කාලයේ -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඇමැතිකම පැත්තකින් තියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඇමැතිකම් කරන කාලේත් වැලි ඇද්දා. ඒ කාලේ කථා කළේ නැහැ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

වැලි ඇද්ද කියන්නේ, මේක මගේ පෞද්ගලික කාරණාවක් නොවෙයි. දැන් මේ වැලි ඇදීම පිළිබඳ කාරණාව මට සිද්ධ වෙලා තිබෙන්නේ, මේ අධිකරණ කටයුත්තකට මැදිහත් වුණු ස්ථානයක මේ ආකාරයට කටයුතු කරන්නේ කොහොමද කියන කාරණාවයි. වැලි ඕනතරම් අදිනවා. වැලි අදින එක බලා ගන්න - මම මෝදර වෙරළ ආරක්ෂක මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීට කථා කරලා ඇහුවා මේකට පර්මිට් එකක් අරගෙන තිබෙනවාද කියලා. ඔහු කිව්වා තමන්ගේ ප්‍රදේශයේ නොවෙයි, අල්ලපු ප්‍රදේශයේ නිසා අහලා බලන්න කියලා. පර්මිට් නැහැ. මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් මහජන නියෝජිතයෙක් හැටියට මුහුණ දීමට සිදුවීම ගැන මම අතිශයින්ම කනගාටු වෙනවා. හේතුව අපට නීත්‍යානුකූලව අපේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්න බැරි නම්, අපි කොහොමද ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කියන ගැටළුව තිබෙනවා. ඒ නිසා

[ගරු ජගත් අංගගේ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් මම ඉල්ලා සිටින්නේ කරුණාකරලා මේ නීතිය ක්‍රියාවට නොනැගීම සම්බන්ධව, නීතිය විහිළුවට ගැනීම සම්බන්ධව අදාළ නිලධාරීන් සමග පොලිස්පතිතුමා හරහා හෝ යම්කිසි මඟ පෙන්වීමක් කරන්න පුළුවන් නම් ඒ කටයුත්ත සිදු විය යුතුයි. එහෙම නැත්නම් මේවා නිවැරැදි කරන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කිසිම කෙනෙකු අපහසුතාවයට පත් කරන්න, ද්වේශ සහගතව පළිගැනීමක් කරන්න වාගේ දෙයක් කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නැහැ. මේ තත්ත්වය නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට මැදිහත් වන ලෙස මම ඔබතුමාගේ මාර්ගයෙන් අදාළ ස්ථානවලට දැනුම් දෙන ලෙසත් දන්වා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම අපි කවුරුත් දන්නවා. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය ගත්තාම ගංවතුර උවදුරින් පසුගිය කාලයේ කළුතර දිස්ත්‍රික්කයට විශාල හානියක් වුණා. රටේම හානි සිදු වනකොට කළුතර දිස්ත්‍රික්කයට විශාල හානියක් වුණා. ඒ තුළ අපි දැක්කා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා රජය තීන්දුවක් ගත්තා සියලුම දේවල් ආපදා කළමනාකරණය පිළිබඳ රේඛීය අමාත්‍යාංශය හරහා කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව හැටියට, සමාජ සේවා අමාත්‍යාංශය හැටියට ඒ තුළ මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ වෙන් කිරීමට හැකියාවක් නොතිබීම තුළ අපි ඒ ස්ථානවලට ගියා. ඒ ස්ථානවලට ගියාම අපට ගොඩක් වෙලාවට සිද්ධ වුණා අපේ පුද්ගලික ධනයෙන් හෝ ජනතාව මෙහෙයවලා ඒ අයට සහනයන් සලසන්න. මොකද, ඒකට හේතුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ගංවතුරෙන් හානි වුණු අයට කරපු ආධාර උපකාර පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. නමුත් මම පළාත් සභාවට කථා කළාම සම්පූර්ණයෙන්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මේක භාර දීලා නිසා පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න, පළාත් සභාවටත් හැකියාවක් තිබුණේ නැහැ. මම එතැනදී ජනතාවට වුණු ලොකු අසාධාරණයක් දැක්කා. සමහර තැන්වල අපට බැරි වෙලාවත් -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

අපි ලක්ෂ 50 ක් වෙන් කරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට යැව්වා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ පොත් දෙන්න. ගරු ඇමැතිතුමා හොඳ දෙයක් කළා. දරුවන්ට පොත්පත් අරගෙන දෙන්න මුදල් ප්‍රතිපාදන වෙන් කළා. ඊට ඉස්සෙල්ලා ගංවතුරින් යට වුණු ගමන්ම කෑම ටික - අපේ ප්‍රදේශ නිරන්තරයෙන් ගංවතුර උවදුරට මුහුණ පාන ප්‍රදේශ. ඒ නිසා පැහැදිලිවම මම ඉල්ලන්නේ මෙපමණයි. නැවත මෙවන් විපතක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරන්නේ නැහැ. මෙවන් විපතක් වෙනවා නම් පළාත් සභාව හරහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා ඒ අයට සහනයක් දෙන්න කටයුතු කරන්න ඕනෑ. මොකද, මම දැක්කා සමහර තැන්වල දවස් දෙක තුන බඩගින්නේ ඉන්න සිද්ධ වුණු අය හිටියා. ඒ නිසා අපට හැකියාවක් තිබෙන්න ඕනෑ, පළාත් සභාව හැටියට, පළාත් සභාවේ ජනතා නියෝජිතයෝ හැටියට පළාත් සභාවෙන් ඒකට මැදිහත් වෙලා ඒ කටයුත්ත කරන්න. ඒ නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලන්නේ මීන් ඉදිරියට මෙහෙම දෙයක් නොවෙන්න කටයුතු කරන්න කියලා. මොකද, එහෙම නැති වුණොත් එහෙම දිගින් දිගටම මේක සිද්ධ වෙනවා. ඒ වාගේම මේ පිළිබඳව හොඳ කැපවීමෙන් වැඩ කරපු නිලධාරීන් හිටියා. වැඩ කරපු සේවකයෝ හිටියා. ඒ සියලු දෙනාටත් මගේ ගෞරවය, ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධව පොඩ්ඩක් පැහැදිලි කර ගන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මයික්‍රෆෝනය දාන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

චක්‍රලේඛයක් තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ මෙතුමාගේ ඉල්ලීම අනුව මේ කටයුතු කිරීම පිළිබඳ මුදල් අමාත්‍යාංශයට යවන්න. නැවත මෙවැනි කටයුත්තක් කරන කොට සමාජ සේවා අමාත්‍යාංශයෙන් මේක කරන්න පුළුවන් විධියට සකස් කරන ගන්න වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ රෝහල් ගැන කථා කරද්දී විශේෂයෙන්ම මීගමුව දිස්ත්‍රික් රෝහල ගැන අද ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව ඉතාමත් කනගාටුවෙන් හෝ දැනුම් දෙන වෙලාවේ මම හිතන්නේ, අපේ සෞඛ්‍ය ඇමැතිතුමා මේ ස්ථානයේ නැහැ. නමුත් මේ මීගමුව දිස්ත්‍රික් රෝහල කියන්නේ, මීගමුවේ ජනතාවත්, කටාන ඒ වාගේම මිනුවන්ගොඩ, දිවුලපිටිය ජනතාවත් ඒත් එක්කම Free Trade Zone එකේ ඉන්න දහස් ගණනක් ජනතාවත් මීගමුවට එන සංචාරක ජනතාවත් මේ සියලු දෙනාටම හදිසියකට යන්න තිබෙන රෝහල. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රෝහලට ඇති වෙලා තිබෙන තත්ත්වය දිහා බැලුවාම හෙද හිඟයක් තිබෙනවා. මීගමුව රෝහලේ අවම සියයකට වඩා අධික ප්‍රමාණයක හිඟයක් පවතිනවා. ඒත් එක්කම ඖෂධවේදීන්ගේ හිඟයකුත් පවතිනවා. මේ රෝහලේ සත්කාර සේවාවන් ලබා දීම සඳහා හත් දෙනෙකුගේ පමණ ප්‍රමාණයක් අද නැති වෙලා තිබෙනවා. ඒත් එක්කම කාර්ය මණ්ඩල හිඟය. මෙවැනි විශාල අඩුපාඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒත් එක්කම අලුතෙන් හදපු ගොඩනැගිල්ල අද ගිලා බහින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මම හිතන්නේ, ජනමාධ්‍ය තුළිනුත් මේක මීට පෙර පෙන්නුම් කරලා දීලා තිබෙනවා. වතුර කාන්දු වීම නිසා අද මේ බිල්ඩිමත් අවදානම් තත්ත්වයකට තමයි පත් වෙලා තිබෙන්නේ. එය රෝගීන්ටත් විශාල බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට වාට්ටු දෙකක් අයින් කරලා ඒ වාට්ටු දෙක ඖෂධ ගබඩා හැටියට පාවිච්චි කරන්න අරගෙන තිබෙනවා. මේ නිසා ඖෂධ හරි ප්‍රමිතියට තියා ගන්න බැරි තත්ත්වයකුත් මේ නිසා උදා වෙලා තිබෙනවා. මොකද, නිකම් තිබෙන වාට්ටු දෙකක ඖෂධ දාපුවාම හරි ප්‍රමිතියට අනුව මේ ඖෂධ තියාගන්න බැහැ. ඒ නිසා රෝගීන්ට පමණක් නොවෙයි ඒ ඖෂධ ලබා ගන්න ජනතාවටත් විශාල හානියක් සිදු වන තත්ත්වයක තමයි අද මේ රෝහල තිබෙන්නේ. ඒත් එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපකරණ ගත්තාමත් ඉතාමත් අඩු තත්ත්වයක තමයි තිබෙන්නේ. විශාල අඩුපාඩු තිබෙන රෝහලක් බවට අද පත් වෙලා තිබෙනවා. කොපමණ ලොකු රෝහලක් වුණත්, අද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන රෝහල්වලින් රාගම සහ ගම්පහ රෝහල් ඇරුණාම ඊළඟට තිබෙන්නේ මීගමුව රෝහල. මේ රෝහලේ ජෙනරේටරය පවා අවශ්‍ය ධාරිතාව ලබා දෙන්න බැරි මට්ටමේ පවතින්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රදේශවල ජනතාව පමණක් නොවෙයි, වයඹ පළාත අවට ආසනවල ඉන්න ජනතාවත් මේ මීගමුවේ රෝහලට තමයි හදිසියකදී එන්නේ. ඒක නිසා පළාත් සභාව හැටියට අපේ වගකීමක් තිබෙනවා. පසුගිය අවුරුද්දේ පහේත් මම නියෝජනය කළා. මීගමුවේ ඇමැතිවරු දෙදෙනෙක් ඉන්නවා. ප්‍රබල ඇමැතිවරු කියලා කියන්නේ. ඒ ඇමැතිවරු දෙන්නා ඉදිද්දීත් මේ මීගමුවේ රෝහලට අද වෙලා තිබෙන තත්ත්වය ගැන බැලුවාම ඉතාමත් කනගාටුදායකයි. මම හිතන්නේ, සමහර ඇමැතිවරු, තමන් නොදැනුවත්ව කිසිම දෙයක් කරන්න බැහැ කියන මට්ටමේ ඉන්න ඇමැතිවරු මීගමුවේ ඉන්නවා. තමන් නොදැනුවත්ව මීගමුවේ කිසිම දෙයක් වෙන්නේ නැහැ කියන අය. අන්න ඒ අය ඉඳගෙනත් අද මේ රෝහලට වෙලා තිබෙන තත්ත්වය ගැන බැලුවාම මම හිතන්නේ ඒ හින්දාම වෙන්න ඇති අද -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ලන්සා ඇමැතිතුමා හිටියා නම් හම්බ වෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොහොමත් ලන්සා ඇමැතිතුමා මම කථා කරද්දී ඉන්නේ නැහැ. යනවා. ඒකයි. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. පළාත් සභාවේ සෞඛ්‍ය ඇමැතිතුමා දැනුවත් කරලා අද පවතින බරපතළ ප්‍රශ්නයට - විශේෂයෙන් ජනතාවට සේවයක් ලබා දෙන්න තිබෙන ස්ථානයක්. ලෙඩක් දුකක් වුණාම දුවන්නේ එතැනට. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් එන සංචාරකයෝ හදිසියක් වුණාම ගෙනියන්නේ මේ මීගමුව රෝහලට. ඒක නිසා අපි ජාත්‍යන්තර

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

වශයෙනුත් ඉතාමත් අපහසුතාවයකට පත් වෙනවා. මෙවැනි රෝහලක් පවතින එකක් බරපතළ ප්‍රශ්නයක්. ඒක නිසා විශේෂ අවධානයක් යොමු කරලා මේ රෝහල -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් කියන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අන්න ආවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කිව්වාට පස්සේ එතුමා ආවට මට කරන්න දෙයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ කථාවට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නිසා විශේෂ අවධානයක් යොමු කරලා මේ වසරේවත් මම හිතන්නේ ඔබතුමා මාර්ගයෙන් සෞඛ්‍ය ඇමැතිතුමා දැනුවත් කරලා මේ බරපතළ ප්‍රශ්න ටික විසඳලා මීගමුවේ රෝහල හොඳට ක්‍රියාත්මක වන, කාලයට ඔබින තත්ත්වයට ගෙනැල්ලා ඒ රෝහල වැඩි දියුණු කරලා ජනතාවට සහනයක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මට මාගේ මංගල කථාව සඳහා අද දිනයේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාශ 15 න්ම මනාප ඡන්ද 67,686 ක් ලබා දෙමින් බස්නාහිර පළාතෙන්ම එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ ප්‍රථම ස්ථානයට මා ඔසවා තැබූ කොළඹ දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මගේ ස්තූතිය ප්‍රකාශ කළ යුතු අතර, විවිධ බාධක හා බලපෑම් මත දැනට මැතිවරණය පැවැත් වූ පළාත් අටෙන්ම එක්සත් ජාතික පක්ෂ ලැයිස්තුවේ ප්‍රථම ස්ථානයට පත් වීමට මාහට මනාප ඡන්ද ලබා දීපු ජනතාවට මගේ ගෞරවය පුද කළ යුතුයි. මේ සා විශාල ඡන්ද ප්‍රමාණයක් මා හට ලබා ගැනීමට හැකි වූයේ අතිබහුතරයක් සිංහල, මුස්ලිම්, දෙමළ ජනතාව අන්තවාදීන් හෝ ජාතිවාදීන් නොවූ නිසා බවයි මගේ හැඟීම. අභියෝග ගණනාවක් මැද වුණත් මුස්ලිම් මෙන්ම සිංහල අපේ මිනිස්සු මා හට මනාප ඡන්ද ලබා දීමෙන් දී ඇති පණිවිඩය අද දවසේ මතුව තිබෙන තත්ත්වය නිවැරැදිව වටහා ගැනීමට උදාහරණයක් ලෙස ගත හැකියි. තව ටිකක් යථාර්ථවාදීව කල්පනා කර බැලුවහොත් තාක්ෂණය හා සන්නිවේදනය දියුණු ලෝකයත් සමග ගනුදෙනු කරන තරුණ සමාජයක් සිටින, එසේම ලෝකයත් සමග තරගකාරීව ගනුදෙනු කරන ලාංකීය සමාජය තුළින් කරුණු වසන් කොට ඔවුන්ව ළිං මැඩියන් ලෙස තවදුරටත් තබා ගත නොහැකි බව අපි හැමෝම තේරුම් ගත යුතුයි. ප්‍රබුද්ධ මිනිසුන් සිටින සමාජයක අනේක විධ ප්‍රශ්න රාශියක් මේ මොහොතේ අප හමුවේ තිබෙනවා. අධ්‍යාපන ක්‍රමය අකර්මන්‍ය වී සිසු පරපුර කුඩු මාරයා විසින් ගිල ගන්නට ඔන්න මෙන්න බලාගෙන සිටින මොහොතක නිදහස් සෞඛ්‍ය සේවය වචනයට පමණක් සීමා වූ මොහොතක එනම් තුණ්ඩු කැල්ල පමණක් වෛද්‍යවරයාගෙන් නොමිලේ ලැබෙන, බෙහෙත් ෆාමසියෙන් මිලදී ගත යුතු මොහොතක දිනෙන් දිනම රැකියා නියුක්තිය වෙනුවට රැකියා වියුක්තිය වැඩි වන රටක ජීවත් වන අපි බඩු මිලෙන්, දූෂණයෙන්, භීෂණයෙන්, වංචාවෙන්, අවනීතියෙන් මිරිකුනු සමාජයක ජීවත් වෙනවා. අපි සංවර්ධනය මුවාවෙන් කෝටි ප්‍රකෝටි ගණන් යටිමඩි ගසන පාලකයින් දෙස මුනිවත පමණක් රකිමින් කර කියා ගත නොහැකිව ඔහේ බලා සිටින සමාජයක් බවට දැන් පත්ව සිටිනවා. දැන් අපේ සමාජය ඩෙංගු මාරයාගේ බිල්ලක් බවට පත් වන සමාජයක් කරා ඉතා වේගයෙන් ගමන් කරමින් සිටිනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඔයගොල්ලෝ තමයි සුපර් ස්ටාර් පෙන්නලා-

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අත්දැකීම් ඇති මන්ත්‍රීවරයෙක් විධියට මට මගේ කථාව කරන්න දෙන්න කෝ? මම නවක මන්ත්‍රීවරයෙක් නේ?

කථාව කරන්න දෙන්න කෝ? රටේ ආර්ථිකය කිහිප දෙනෙක් පමණක් හසුරුවමින් ඔවුන්ට පමණක් ආදායම් ලැබෙන අනෙක් අය ඉතා පහළ මට්ටමට ඇද වැටුණු ආර්ථිකයක් තිබෙන, රටේ ජනතාව ප්‍රපාතයටම ඇද වැටුණු ඔවුන්ගේ ආර්ථිකයක් බවට මේ රටේ ආර්ථිකය පත් කොට ගෙන තිබෙනවා. රජයේ මුදල් අමාත්‍යාංශ වාර්තාව අනුව ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 4000 ක් ලෙස සඳහන් වුවත්, රජයේම කැබිනට් ඇමැතිවරයෙකු පවසන පරිදි රටේ ජනතාවගෙන් 40% කගේ ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් දෙකකි. එනම් රුපියල් 260 කි. ඇමැතිවරයෙකුගේ මාසික විදුලි බිල ලෙස රුපියල් 140,000/- ක් ගෙවන රටක ආර්ථිකයේ තරම සියලු දෙනාම මේ වන කොට දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සවිඥානික ජනතාවක් වන අපි මේ සියලු දේ දිහා අවබෝධයෙන් බලා සිටිනා බව ආණ්ඩුව දන්නා නිසා අපේ අවධානය රට හමුවේ තිබෙන ප්‍රශ්නවලින් ඈත් කරන්නට, අන්තවාදීන්ට ඔවුන්ගේ පාරාදීසයක් බවට අපේ රට පත් වන්නට ඉඩ දී නිද්‍රාශීලී, ඕතෑනි, තීරණ නොගන්නා, කල් මරමින් ඔඩු දුවන්නට ඉඩ දී සිටින ප්‍රතිපත්තියක ආණ්ඩුව කටයුතු කරනවා. කවර හේතුවක් මත හෝ කවර මට්ටමේ අන්තවාදී සංවිධානයකටවත්, කල්ලියකටවත් ඔඩු දුවන්නට ඉඩ දිය යුතු හෝ ඉඩ හදා දිය යුතු හෝ නැහැ. ශ්‍රී ලංකාව තුළ එකිනෙකාට තම තමන්ගේ ආගම්, ආගමික හා ජාතික අනන්‍යතාවය රැක ගනිමින් ජීවත් වීමට ඇති නිදහස අහිමි කරන්නට කිසිවෙකුට ඉඩ දිය යුතු හෝ ඉඩ හදා දිය යුතු හෝ නැහැ. 1948 දී අප ලබා ගත් නිදහස උදා කර ගත්තේ අපි ජාතීන් ආගම් වශයෙන් එකම දාමයකින් බැඳී මිස එකිනෙකා වශයෙන් වෙන් වී නොවෙයි. වෙන් වී භේදබින්න වීමෙන් කිසිම රටකට ඉදිරියට යා නොහැකි බව මාගේ හැඟීමයි. මේ ආණ්ඩුවත්, ආණ්ඩුවේ හවුල්කාරයනුත් මැතිවරණ දිනීම අරමුණු කරගෙන මතුරන, මතුර මතුරා වපුරන ජාත්‍යන්තර කුමන්ත්‍රණ තිබෙනවා නම් ඒවාද පරාජය කළ හැක්කේ ශ්‍රී ලාංකිකයන් හැටියට සිටීමෙන් මිස අන්තවාදීව හා මූලධර්මවාදීව සිතීමෙන්වත්, ක්‍රියා කිරීමෙන්වත් නොවන බව අවධාරණය කරන්න කැමැතියි.

ආණ්ඩුවේ සිටින සමහර දේශපාලඥයින් හඳුනා ගත් ඒත් බුද්ධි අංශ විසින් තවමත් නිල වශයෙන් හඳුනා නොගත් අන්තවාදී කණ්ඩායම් මේ රටේ තිබෙනවාලු. මොවුන් කවර තරාතිරමේ සම්බන්ධතා ඇතිව සිටියත් ඔවුන්ව විනාශ කිරීම ලෝකයේ දරුණුතම ත්‍රස්තවාදී සංවිධානය මුලිනුපුටා දැමූ අපේ ත්‍රිවිධ හමුදාවට බැහැයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. ඒ සඳහා ආණ්ඩුව අණ දෙන්න මැලි වෙනවාද කියන්නත්, එසේ මැලි වෙනවා නම් ඒ කුමන හේතුවක් නිසාද යන්නත් සබුද්ධික ජනතාව කල්පනා කරනවා. එවන් කණ්ඩායම් මර්දනය කරන්නට මේ ආණ්ඩුව පසුබට වීම ගැන ජනතාවට සැකයක් තිබෙනවා. ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ උත්සාහයෙන් ජීවිත පරිත්‍යාගයෙන් ත්‍රස්තවාදය විනාශ කර බිය සැක නැති රටක ජීවත් වීමට ජනතාව දුන් වරම, අවස්ථාව මෙවැනි කල්ලි කණ්ඩායම්වලට යටවීමට හැර අතපය බැඳගෙන බලා සිටීම ඒ රණවිරුවන් වෙත කරන දරුණු අපහාසයක් බව මම කියන්න කැමැතියි. ඒත් රටට ආදරය දක්වන්නන් හැටියට අපි හොඳින් තේරුම් ගත යුතු දේ තමයි දේශපාලනය හා රට කියන්නේ අවස්ථාවාදීව හැසිරිය යුතු දෙයක් නොවන බව. දේශපාලන අවස්ථාවාදය මේ රටට අත්කර දුන් කිසිදු යහපතක් නැහැ. ඒ නිසා මේ රට හමුවේ වර්තමානයේ ඇති සියලු තීරණාත්මක අභියෝග පිළිබඳව සිතිය යුත්තේ දේශපාලන අවස්ථාවාදයෙන් තොරවයි.

අවසාන වශයෙන් තමන්ගේ තාත්තා, අම්මා UNP හෝ ශ්‍රී ලංකා වුණු පලියට ඒ පක්ෂය තමන්ගේ පක්ෂය හැටියට තෝරා ගන්න තරුණ පරපුරක් අද වර්තමානයේ නැහැ. අද ඉන්නේ වංචාවෙන්, දූෂණයෙන්, නොමඟ යැවීමෙන් කටයුතු කරන දේශපාලන නායකයෝ ගැන බුද්ධිමත්ව හිතන නූතන තාක්ෂණික යුගයට අයත් තරුණ පරපුරක්. විශේෂයෙන්ම අන්තර් ජාලය ගනුදෙනු කරන ලක්ෂ 14 කට වැඩි පිරිසක් අද ලංකාවේ ඉන්නවා. ඔවුන් දන්නවා මෙවැනි දේශපාලඥයින්ට ලෝකයේ ඇතැම් රටවල ජනතාව අත්කර දුන් ඉරණම මොකක්ද කියලා. රට තමන්ගේත් තමන්ගේ පවුලේ උදවියගේත් තමන්ට කඩේ යන ගැත්තන්ගේත් පාරාදීසයක් කියලා හිතන, රට භීෂණයෙන් භයානක ඒකාධිපති පාලනයෙන් කළ අයට මොකද වුණේ කියලා තරුණ පරපුර දන්නවා. ජනතාව රවටන දේශපාලඥයන් හවුල් වී ආරක්ෂා කරන සියලු ගැත්තන්ට ඒ පාඩම් කියා දෙන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මට විනාඩියක් දෙන්න. මොකද, විපක්ෂයට විනාඩි 13 ක් තිබෙනවා. මෙතුමාට විනාඩි 05 යි. මට විනාඩි 05 යි. එතකොට තව විනාඩි 03 ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන් වෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අවසන් කරන්න හදන්නේ. හවුල් වී ආරක්ෂා කරන සියලු ගැත්තන්ට ඒ පාඩම කියා දෙන්න ශ්‍රී ලාංකික ජනතාව දැන් සූදානම් වී ඇති බව එහෙම කරන උදවිය හොඳින් තේරුම් ගත යුතුයි. අපි දේශපාලන ක්‍රමය ඉතා ඉක්මණින් වෙනස් කළ යුතුයි. ව්‍යාජ ඉලක්කම් සංවර්ධනයෙන් රට මුදවාගෙන යථාර්ථවාදී සංවර්ධනයකට රට ගෙන යා යුතුයි. ඒක මේ රජයට කරන්න බැරි බව අවුරුදු 20 ක් රට පාලනය කරලා ඔප්පු කරලා තිබෙනවා. වේගවත් සංවර්ධනයක් සහිත, දියුණු අධ්‍යාපන ක්‍රමයක් සහිත කුඩු නැති ඒ නිසාම සැනසුම පිරුණු සමාජයක් කරා තරුණ අසහනය දුරු කරන රැකියා බිහි කරන සමාජයක්, අන්තවාදයට හිස ඔසවන්නට ඉඩ නොදෙන ආගමික හා ජාතික නිදහසක් සහිත කිහිප දෙනෙකු වෙනුවට හැමෝටම ආදායම් සමානව ලැබෙන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් මේ රටට බිහි කළ හැක්කේ එක්සත් ජාතික පක්ෂ රජයකට පමණක් බව මම අවසාන වශයෙන් කියන්න කැමැතියි. ඒ සඳහා සියලු දෙනාටම අපි මේ පැත්තටත් ආරාධනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා මේ සභාවට පැමිණීමෙන් පසු මුල් වතාවට මට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන්. විශේෂයෙන්ම පසුගිය 15 වැනි දින අලුත්ගම, බේරුවල, දර්ගා නගරය ඒ වාගේම වැලිපැන්න කියන ප්‍රදේශවල ඇතිවුණු ගැටුම්කාරී ඒ වාගේම නොසන්සුන් තත්ත්වය පිළිබඳව අපට විවිධාකාරයෙන් පෙනෙනවා. මේ පිළිබඳ විවිධ දෘෂ්ටි කෝණවලින් කරුණු පැහැදිලි කිරීම් කරනවා. විචාර කරනවා. අර්ථ කථනයන් කරනවා. නමුත් අපට පෙනී ගිය දෙයක් තමයි අද ජාත්‍යන්තර වශයෙන් මේ රටේ බහුතර සිංහල බෞද්ධ ජනතාව අන්තවාදීන් විධියට අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා මේ රට තුළ බෞද්ධ ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක කරන, සිවුරු ත්‍රස්තවාදයක් ක්‍රියාත්මක කරන පිරිසක් විධියට අද ජාත්‍යන්තර වශයෙන් විශාල ප්‍රචාරයක් අරගෙන ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම අපි දැක්කා BBC ආයතනය හරහා ඒ වාගේ අල්ජසීරා, CNN වැනි ආයතන හරහා මේ රටේ මුස්ලිම් ප්‍රජාව නියෝජනය කරනවා කියන නායකයින් මේ රටේ බහුතර සිංහල බෞද්ධ ජනතාවට එරෙහිව ඉතාම වෛර සහගත ආකාරයේ ප්‍රකාශයන් ලෝකය පුරා ගෙන ගියා. ඒ පිළිබඳව අපේ බලවත් විරෝධය, කනස්සල්ල අපි පළ කරන අතර මේ රටේ බහුතර සිංහල බෞද්ධ ජනතාව ඉතිහාසය පුරා කවදාවත් මේ රටේ ජීවත් වුණු අන්‍ය ජනකොටස්වලට, අන්‍ය ආගමිකයන්ට එරෙහිව වෛරය, ක්‍රෝධය සහ සංහාරය කිසි විටෙකත් දියත් කරලා නැහැ. ඒ නිසා තමයි ඔය කියන සියලු ආගම්වලට මේ රටේ ආරක්ෂාව තහවුරු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්න කැමැතියි මේක එක පාර්ශවයකින් පමණක් අද ලෝකය පුරා ප්‍රචාරය කර ගෙන යනවා. සිංහල බෞද්ධයෝ අන්තවාදීන්. ඒ වාගේම මේ රටේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා මූලධාර්මවාදීන්. මේ රටේ ඉන්න සිංහල බෞද්ධ ජනතාවට මුස්ලිම් ජනතාව එක්ක ජීවත් වෙන්න බැහැ. දෙමළ ජනතාව එක්ක ජීවත් වෙන්න බැහැ කියලා අද ලෝකය පුරා කර ගෙන යන අසත්‍ය ප්‍රචාරය හරහා අපට පෙනෙනවා අද අපේ බෞද්ධ ජනතාව විශාල අවමානයකට, නිග්‍රහයකට ලක් කරමින් තිබෙනවා. ඒ පිළිබඳව විශේෂයෙන්ම අපේ දැඩි සිත් වේදනාව, කනස්සල්ල අපි පළ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලය පුරා මේ සිදුවීම සම්බන්ධයෙන් මාධ්‍ය තුළ වාර්තා කිරීම් අරගෙන බැලුවාම අපට පෙනෙන්න තිබුණු දෙයක් තමයි මේකේ ඒකපාර්ශවික ස්වභාවය. මේ ඒකපාර්ශ්වික ස්වභාවය නිසාම සිංහල බෞද්ධයන්ගේ පැත්තෙන් තමන්ට සිදු වුණු අසාධාරණය, තමන්ට සිදු වුණු දුක් ගැනවිල්ල, තමන්ට සිදු වුණු මේ වේදනාව ජාත්‍යන්තර වශයෙන් විතරක් නොවෙයි, රට ඇතුළේවත් අපට ප්‍රකාශ කර ගන්න බැරි වුණා. විශාල මාධ්‍ය වාරණයක් නිල හෝ නොනිල ආකාරයකට වැටී තිබුණු බවයි අපට පැහැදිලිව පෙනී ගියේ. ඒ නිසා මම කියන්න ඕනෑ. අද මේ රටේ සිංහල බෞද්ධ ජනතාවට එරෙහිව කර ගෙන යන මේ වෛර සහගත ප්‍රකාශ පිළිබඳව අපට පැහැදිලිව කියන්න සිද්ධ

වෙන්නේ එවැනි බෞද්ධ අන්තවාදයක්, බෞද්ධ ත්‍රස්තවාදයක් මේ රට තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. බෞද්ධයන්ගේ වේදනාව විවෘතව අපි ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. (බාධා කිරීමක්) කරුණාකරලා මට බාධා කරන්න එපා. ඔබතුමාත් නවක මන්ත්‍රීවරයෙක් නේ? කරුණාකරලා ඒ ශීලාචාරකම තියාගන්න. විනය තියාගන්න. ඒ නිසා -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ශීලාචාර බව ඔබතුමා මට කියලා දෙන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ නිසා පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි, අද මේ රට ඇතුළේ ආගමික සංහිඳියාවට තිබෙන බාධාව මොකක්ද කියන එක සම්බන්ධයෙන් අපි සියලු දෙනාගේම අවධානය යොමු විය යුතුයි. මට මතකයි මීට වසර ගණනාවකට කලින් ඔය බේරුවල ප්‍රදේශයේම මුස්ලිම් අන්තවාදී කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් ඇති වුණා. ඒ ගැටුමෙන් දෙදෙනෙක් මිය ගියා. 41 දෙනෙක් තුවාල ලැබුවා. හැබැයි ඒ සිද්ධිය පිළිබඳව අපේ සමාජයේ කිසිදු ආකාරයකින් අවධානය යොමු වුණේ නැහැ. අද ඉතාම පැහැදිලියි පසුගිය දා කල්මුණේ, සහින්දු මර්දු කියන ප්‍රදේශයේ මුස්ලිම් පල්ලියක් මුල් කරගෙන කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් ඇති වුණා. මොකකද, මේ කණ්ඩායම් දෙක? මේ කණ්ඩායම් දෙක පිළිබඳව අපි කියන්නේ අවධානය යොමු කරන්න. මොනවාද මේ කණ්ඩායම්? මේවා පිටුපස්සේ ඉන්න විදේශීය බලවේග කවුද? ඒ වාගේම මේ පිටුපස ඉන්න මුස්ලිම් රටවල් මොනවාද? මේ පිළිබඳව වහාම අවධානය යොමු කරන්න. මොකද, අද මේ රටේ සම්ප්‍රදායික මුස්ලිම් සමාජයේ, ඒ වාගේම සම්ප්‍රදායික අනෙකුත් ආගම්වලට තිබෙන තර්ජනය මොකක්ද කියන එක පිළිබඳව සොයා බැලීමක් කිරීමෙන් තොරව අපි ඔය කථා කරන ආගමික සංහිඳියාව සහජීවනය නිකම් ඇති කරන්න බැහැ. ඒක අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒක ඇති කරන්න පුළුවන් වෙන්නේ මේ කියන අන්තවාදී කණ්ඩායම්වලට හිස ඔසවන්න ඉඩ නොදී ඒ සමාජය ඇතුළේ තිබෙන සංහිඳියාව, සාමය, සහජීවනය බිඳ දමන මේ අන්තවාදී කණ්ඩායම් පිළිබඳව පැහැදිලිව අවධානය යොමු කරන්න ඕනෑ. බෞද්ධ සමාජය තුළින් අන්තවාදය මතු වෙනවා නම්, ඒකටත් අපි පැහැදිලිව විරුද්ධයි. ඒ වාගේම මුස්ලිම් සමාජය තුළින්, ඉස්ලාම් ආගම තුළින් අන්තවාදීන් බිහි වෙනවා නම්, දෙමළ සමාජය තුළින් ඒ අන්තවාදීන් බිහි වෙනවා නම් අපි ඒකටත් විරුද්ධයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි සියලු දෙනාටම වගකීමක් තිබෙනවා, මේ රටේ තිස් අවුරුදු යුද්ධයක් පැවතුණා. ඒ තිස් අවුරුදු යුද්ධයෙන් අපි සියලු දෙනාම බැට කෑවා. ඒකෙන් විශාල ජීවිත හා දේපළ වන්දියක් අපි ගෙවලා තිබෙනවා. සමාජයක් විධියට විශාල වන්දියක් ගෙවලා තිබෙනවා. නැවත වතාවක් ආගමික වශයෙන් මේ රට තුළ ගැටුම්කාරී තත්ත්වයක් ඇති කරන්න අපි කිසිවෙකුටත් අවශ්‍යතාවයක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ රටේ ඉතිහාසය, සංස්කෘතිය ඒ වාගේම ශිෂ්ටාචාරය නිර්මාණය කරපු මේ රටේ බහුතර සිංහල බෞද්ධ ජනතාවට එරෙහිව කරගෙන යන මේ සාහසික ප්‍රකාශ, ජාත්‍යන්තර වශයෙන් කරගෙන යන මේ සාහසික ප්‍රකාශ වහාම නතර කරන්න කටයුතු කරන්න ඕනෑ. අපට වාරණ නියෝග පනවනවා. බෞද්ධයන්ට අද රැස්වීමක් පවත්වන්න බැහැ. පන්සලක අද රැස්වීමක් පවත්වන්න බැහැ. ඒ අවස්ථාවලට වාරණ නියෝග ගන්නවා. උසාවි නියෝග ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා අපට කියන්න තිබෙන්නේ - හැබැයි ඒ කිසිම ප්‍රශ්නයක් නැහැ. පසුගිය මැයි 19 වෙනිදා රට පුරා හර්තාල් ව්‍යාපාර දියත් කළා. කඩ වල් වැහුවා. කළු කොඩි එසෙව්වා. පාරට ආවා. එතැනදී කවුරුවත් ඔය නීතිය ක්‍රියාත්මක කරන්න ආවේ නැහැ. එහෙම නම් ඇයි මේ නීතිය දෙවිධියකට ක්‍රියාත්මක වෙන්නේ? අන්න ඒ පිළිබඳව පැහැදිලිව අපට අපේ දැඩි කනස්සල්ල පළ කරන්න සිද්ධ වෙනවා. අපි දැක්කා ඔය දෙහිවල කියන ප්‍රදේශයේ, වැල්ලවත්ත කියන ප්‍රදේශයේ මුස්ලිම් ව්‍යාපාරික ස්ථානවලට ගිහිල්ලා කවුද තර්ජනය කළේ? ඒ තර්ජනය කරපු තරුණයෝ මොකද කළේ? ඒ අය කාගේ අනුදැනුම ඇතිවද ඒ තැන්වලට ගිහිල්ලා ඒ කටයුතු කළේ? එහෙම නම් අද මේ බලහත්කාරය කොතැනින්ද ක්‍රියාත්මක

වෙන්නේ කියන එක පිළිබඳව සොයා බැලීම බුද්ධි අංශවල වගකීමක්. ඒක නිසා හමුදාවට, පොලීසියට, බුද්ධි අංශවලට අපි කියන්නේ මේ රට තුළ ක්‍රියාත්මක වන අන්තවාදය පිළිබඳව සහ ඒ අන්තවාදයට උඩ ගෙඩි දෙන, ඒකට අනුබල දෙන, අර මාලිගාවත්තේ කාර්යාලයවල ඉඳලා සැලසුම් හදන අය කවුද කියන එක පිළිබඳවත් සොයා බලන්න ඕනෑ කියන එකයි අපි පැහැදිලිව කියන්නේ. ඒ බව ප්‍රකාශ කරමින් අද මේ රට තුළ නැවත වතාවක් ආගමික වශයෙන් තිබෙන සංහිඳියාව නැති කරන්න උත්සාහ කරන කවර පාර්ශවයක් වුණත් ඒ පාර්ශවයන්ට එරෙහිව අපි සියලු දෙනා එක්සත්ව, එක්සිත්ව කටයුතු කරන්න ඕනෑ. රටේ ජාතික සමගිය, සංහිඳියාව පවත්වා ගැනීම අවශ්‍යයි. අද අලුත්ගම ප්‍රදේශයේ ඇති කරලා තිබෙන සාමකාමී තත්ත්වය තවදුරටත් අපි වර්ධනය කරමින්, ඇති වුණු සිද්ධි බිඳීම් නැවත වතාවක් පිළිසකර කර ගනිමින්, ජීවිත හා දේපළ හානිය නැවත පිළිසකර කර ගනිමින් රට ඉදිරියට ගෙන යන්න අපි සියලු දෙනාගේ සහයෝගය ලබා දිය යුතුව තිබෙනවා කියන එක ප්‍රකාශ කරමින් විශේෂයෙන්ම සිංහල, බෞද්ධ ජනතාවගේ හඬ යටපත් කිරීම පිළිබඳව මගේ බලවත් කනස්සල්ල, විරෝධය සහ සිත්තැවුල ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කියැවුණා, විශේෂයෙන්ම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික පැහැදිලි කිරීම් පිළිබඳව විවාද කරන්න බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. එතුමාගේ කථාවෙන් - දැන් එතුමා කිව්වා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

BBC ආයතනයට දුන්නු Interview එකක් ගැන. ඒ Interview එක දුන්නු ඇමැතිතුමා ඉන්නේ මෙතුමන්ලාගේ ආණ්ඩුවේ. එතකොට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, නැහැ. ඔබතුමාට වුණු -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එතුමාගේ ප්‍රකාශය අනුව සමස්ත මුස්ලිම් ප්‍රජාවටම ලඝු කරලා කථා කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වුණු දේ විතරක් කියන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මම මුස්ලිම් භක්තිකයෙක් කියලා නොවෙයි කියන්නේ. ඒ ආණ්ඩුවේ ඇමැතිතුමාගේ ප්‍රකාශය හරහා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒකට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඒ ගණයට දාලා මෙතුමා කථා කරන්නේ. බහුතරයක් මුස්ලිම් ප්‍රජාව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අසාධාරණයක් සිද්ධ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා කොළඹ නගර සභා බල ප්‍රදේශ තුළ ඇතැම් අවස්ථාවල -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂ ප්‍රකාශයක් කළාම ඒ පිළිබඳව ප්‍රශ්න නැගීමක් කරන්න බැහැ රීති අනුව.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

වරප්‍රසාද ප්‍රශ්නයක් වුණත් ඒ ප්‍රශ්නයට සම්බන්ධ කරලා නේ අහන්නේ? මොකක්ද රීතිය? කරුණාකරලා අපට රීතිය පැහැදිලි කරලා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මගේ විශේෂ ප්‍රකාශයෙන් මේ සභාවේ අවධානය යොමු කරන්නේ, නාගරික සංවර්ධන අධිකාරියත්, ඒ වාගේම පළාත් පාලන ආයතනත් අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට අදාළව අනුගමනය කරන දෙබිඩි පිළිවෙත පිළිබඳවයි. විශේෂයෙන් ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා මේ සභාවට කිසියම් ප්‍රකාශයක් කරද්දී අවධාරණයට ලක් වුණා, සැබෑ ලෙසම ඉවත් විය යුතු අනවසර ඉදි කිරීම් ඉවත් වන්නේ නැති බව. හැබැයි කිසියම් කෙනෙකුගේ පෞද්ගලික උවමනාවට, නාගරික සංවර්ධන අධිකාරියේ පෞද්ගලික උවමනාවට එහෙම නැත්නම් පළාත් පාලන ආයතනයේ පෞද්ගලික උවමනාවට ඉඩමක් අවශ්‍ය නම් ඒ ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යයට මේ රටේ නීතිය ඉතාමත් කැත විධියට පාවිච්චි කරන ස්වරූපයක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ අනුව මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ මෙන්ම පොදුවේ බස්නාහිර පළාත තුළ නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත්ව තම පදිංචි නිවාසවලින් මෙන්ම ව්‍යාපාරික ස්ථානවලින් පදිංචිවාසීන් ඉවත් කොට අදාළ භූමිය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක නිතර වෙමින් ඉන්නවා. එම ක්‍රියාවලිය පවතින අණපනත්වලට සපුරා පටහැනි අතර, ඇතැම් අවස්ථාවලදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ දැනටමත් ඇති වුණු එකඟතාවයන්වලටද පටහැනියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විශේෂයෙන්ම බොරැල්ල වනාතමුල්ල ප්‍රදේශයේ 34 වත්තට නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වෙන්නේ නැහැයි කියලා, ඒ ඉඩම අත්පත් කර ගන්නේ නැහැයි කියලා පොරොන්දුවක් තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ පුනර්ජීවන වැඩ සටහනින් ඉවත් වෙනවා කියලාත් එකඟතාවයක් තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එකඟතාවය කඩ කරලා තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වනාතමුල්ලේ 34 වත්තට එහෙම එකඟතාවයක් තිබියදී දැන් නාගරික සංවර්ධන අධිකාරිය බලහත්කාරයෙන් තමන්ගේ හමුදා නිලධාරීන් යොදවලා, ඒ පදිංචිකරුවන්ට විවිධාකාර බලපෑම් කරමින් ඉන්නවා. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අසාර්ථක වුණාට පස්සේ නාගරික සංවර්ධන අධිකාරිය පවතින නීතිය දඩමීමා කරගෙන මෙන්න නාගරික සංවර්ධන අධිකාරී පනතේ 28 (ආ) (3) යටතේ දැන්වීමක් කරලා තිබෙනවා. 28 (ආ) (3) යටතේ කරන දැන්වීම ඉතාමත් භයානක දැන්වීමක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ අනුව අපි කියන්නේ මේ පටු අරමුණකට 28 (ආ) (3) වගන්තිය භාවිතා කරලා ඒ 28 (ආ) (3) වගන්තියේ තිබෙන භයානකකම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවකින් පවා විස්තර කරනවා. ඒකේ පොඩි කෑල්ලක් කියන්නම්. ඔබතුමාට පෙනෙයි ඒකේ තිබෙන භයානකකම.

[ ගරු සුනිල් වටගල ]

*"Where any person fails to comply with the notice received under section 20 A(1) the UDA may apply to the Magistrate in terms of Sub Section 3A to obtain a mandatory order authorizing the UDA to give effect to such notice. The Mandatory Order permits the UDA to demolish a building."*

එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වගන්තිය යටතේ Order එකක් දෙනවා ඒ තිබෙන ගොඩනැගිල්ල කඩා ඉවත් කර ගන්න. නිසි සැලසුමක් නැත්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මෙන්න මේ නීතිය ඉතාමත්ම තුච්ඡ විධියට, පටු විධියට පාවිච්චි කරලා, අද නාගරික සංවර්ධන අධිකාරිය තමන්ට ඉඩම විකුණන්න අවශ්‍යතාවයක් තිබුණා නම්, ඒ ඉන්න මිනිස්සුන්ව පලවා හැරලා ඒ ඉඩම අත්පත් කර ගන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක තමයි නාගරික සංවර්ධන අධිකාරිය මේ වෙලාවේ කෙක්කෙන් බැරි නම් කොක්කෙන් හරි තමන්ගේ පටු දේශපාලන උවමනාව ඉෂ්ට කරවා ගන්න තමයි මේ හදන්නේ. මෙලෙස අනවසර පදිංචිකරුවන් යැයි කියන මිනිස්සුන්ට තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පරම්පරා දෙකක හෝ තුනක පදිංචියක්. වරිපනම්, විදුලිය, ජලය, ඡන්ද නාම ලේඛන තුළ ඔවුන් ඉන්නවා. ඒ වාගේම ඔවුන්, ඔවුන්ගේ නිවාස සැලසුම් අනුමත නොවීම තුළ පමණක් සලකා, ඔවුන්ගේ පදිංචි ස්ථානය අනවසර යැයි පවසමින් කඩා ඉවත් කිරීම අතිශය අසාධාරණ ක්‍රියාවලියක් වෙනවා. එහෙම ඉවත් කරනවා නම්, අනවසර ඉවත් කිරීම් අද කොළඹ නගරයේ 75% ක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඡන්ද කාලයට පැමිණෙන දේශපාලඥයන්ට ඔවුන්ගේ ඡන්දය නීත්‍යානුකූලව වෙනවා නම් ඔවුන්ගේ නිවාස නීත්‍යානුකූල නොවන්නේ ඇයි කියලා අද ඒ මිනිස්සු ප්‍රශ්න කරනවා. ඒ අනුව බොරැල්ල වනාතමුල්ලේ මිනිස්සු, 34 වත්ත, නාරාහේන්පිට බේකරි වත්ත, කොටා පාරේ 188 වත්ත, ඒ වාගේම කොළඹගේ මාවතේ පදිංචි තැනැත්තන් හට මේ බරපතළ අසාධාරණය සිදු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මීට අමතරව බොරැල්ල, ජයරත්න මල්ශාලාව අසල ඇති 460 වත්තට, බොරැල්ලේ සයිකල් බසාර් එක ළඟ තිබෙන 66 වත්තට අලුතෙන් ඇවිල්ලා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැන්වීමක් කරලා තිබෙනවා, ඒ ගෙවල්වලින් යන්න කියලා. දවසින් දවස ව්‍යාප්ත වෙමින් පවතින මෙම ව්‍යසනය තුළ සමස්ත කොළඹ නගරයේ ජනතාව අද වික්ෂිප්ත වෙලා ඉන්නවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ තත්ත්වය මත ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලා සිටිනවා මේ අසාධාරණය ක්‍රියාව නතර කරන්න කියලා නාගරික සංවර්ධන අධිකාරියට කිසියම් බලපෑමක් කරන්න. ඒ වාගේම මිනිස්සුන්ට මේ නිවාසවලින් යන්න කියලා කියනවා නම් ඒකට අදාළ විකල්ප වැඩ පිළිවෙළක් ඒ මිනිස්සුන්ට පැහැදිලි කරලා දෙන්න කියන ඉල්ලීමත්, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු පළාත් පාලන ආයතනවල බලධාරීන්ට ඔබතුමාගේ මාර්ගයෙන් අවධානය යොමු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, ජාතිභේදයක් නැති බේරුවල, අලුත්ගම, දර්ගා නගරය, වැලිපැන්නේ කඳුළු කථාව සමතයකට පත් කරන්නට සියලු දෙනා ගත් උත්සාහය පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කර සිටීම තමයි මම පළමුවෙන්ම සිදු කරන්න උත්සාහ ගන්නේ. එහිදී විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා බේරුවල ආසනයට දෙපාරක් පැමිණ මේ සිංහල, මුස්ලිම් අහිංසක ජනතාවට සිදු වුණු සිදුවීම සම්බන්ධව සොයා බලලා කටයුතු කිරීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මම මුලින්ම මගේ ගෞරවනීය ප්‍රණාමය, බේරුවල සහ කළුතර දිස්ත්‍රික්කයේ සිංහල, මුස්ලිම් ජනතාව වෙනුවෙන් පුද කර සිටිනවා. ඒ වාගේම මේ සිද්ධියට සම්බන්ධ වෙලා විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු දැක් වූ දායකත්වයට, සහයෝගයට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම කිව යුතුයි. මහ සංඝරත්නයට, ඒ වාගේම මුස්ලිම් පූජකතුමන්ලාට, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සමස්ත සිංහල, මුස්ලිම් ජනතාවට මේ ගැටළුව නිරාකරණය කර ගැනීමට, සමතයකට පත් කර ගැනීමට උත්සාහ ගැනීම සම්බන්ධව සහ ඔවුන්ගේ දායකත්වය ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම මේ සිද්ධියත් සමග කාලකණ්ණි සතුටක් ලබපු මන්ත්‍රීවරු සහ සමහර උදවිය නැත්තේ නැතුවා නොවෙයි. ඒ තරමට කාලකණ්ණි සතුටක්, වින්දනයක් ලබපු පිරිස් හිටියා. ඒ නිසා අප දැක්කා ගිය සභා වාරයේදී විවිධ අසත්‍ය ප්‍රකාශ නිකුත් කළ අතර, ඒවා මේ හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. පළමුවැනි දේ තමයි ආණ්ඩු පක්ෂයේ එම්.එම්.එම්. අම්ජාඩ් හිටපු ගරු මන්ත්‍රීතුමා සරමක් ඇඳගෙන පාසලක අනාථයෙක් හැටියට සිටියා කියන ප්‍රකාශයක් මුජිබුර් රහුමාන් ගරු මන්ත්රීතුමා ගියවර සභාවේදී ප්‍රකාශ කළා. අපි පැහැදිලිව දන්නවා. මම අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමාගේ සමීප මිතුරෙක් හැටියට එතුමාගේ සීමාවටත් කිසිදු බලපෑමක් සිදු වෙලා තිබුණේ නැහැ. එතුමාට බලපෑමක් සිදු වුණෙත් නැහැ. මම එතුමා සමග කථා කළා. එතුමා ඒ අවස්ථාවේදී ඒ පාසලට ගිහිල්ලා තිබෙන්නේ අසරණ වුණු අහිංසක මුස්ලිම් ජනතාවට එතුමාගේ සහයෝගය ලබා දීමට. ඊළඟ කාරණය තමයි මම ඉදිරිපත් කරන්නේ අපේ හිතවත් ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. එතුමා කරපු ප්‍රකාශය තමයි එතුමාගේ සහෝදරයෙකුගේ ෆාම් එකක -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. එතුමා ප්‍රකාශ කළා මම අසත්‍ය ප්‍රකාශ කළා කියලා. මම එදා ප්‍රකාශ කළේ, ඒ ඇති වුණු කලබලවලින් බේරෙන්න මුස්ලිම් ජනතාව යම් පාසලකට ගිහිල්ලා හිටියා. ඒ පාසලට මම යනකොට මම දැක්කා අපේ හිටපු මන්ත්‍රීතුමා, අම්ජාඩ් මැතිතුමා සරමක් ඇඳගෙන ඉන්නවා. එතුමාත් ඒ පාසල තුළ අනාථයෙක් හැටියට හිටපු එක තමයි මම ප්‍රකාශ කළේ. එතුමාට කියන්න බැහැ මම අසත්‍ය ප්‍රකාශ කළා කියලා. මම ප්‍රකාශ කළේ සත්‍යය. ඒක මෙතැනට ඇවිල්ලා කියන්න ඕනෑ අම්ජාඩ් මන්ත්‍රීතුමා. එතුමාට ඒක කියන්න අයිතියක් නැහැ. මම කියපු එක ඇත්තද බොරුද කියලා කියන්න බැහැ. එතුමාට ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙම කියන්න බැහැ. එතුමාට ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

එතුමාගේ අසත්‍ය ප්‍රකාශය පිළිබඳව සමස්ත සභාවේම අය දන්නවා. ඊළඟ අසත්‍ය ප්‍රකාශය කළේ මගේ හිත මිත්‍ර විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා. ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා. එතුමාගේ සහෝදරයෙකුගේ ෆාම් එකක එළුවෝ 600 ක් කපලා, කොටලා, බඩවැල් කපලා දාලා, මරලා දැම්මා කියන ප්‍රකාශය කළා. මේකේ එය සඳහන් වෙලා තිබෙනවා. ඉතින් අපි පැහැදිලිවම දන්නවා. දැනට ඒ සියලුම වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අරගෙන තිබෙනවා. එක එළුවෙක් නැති වෙලා තිබෙනවා. ඒ කියන්නේ එක එළුවෙක්. මම දන්නේ නැහැ කුමක් වෙලාද කියන එක. ඒ වාගේම එහි තිබුණු ගොඩනැගිල්ලක් විනාශ වෙලා තිබෙනවා. ඕක තමයි සත්‍ය කථාව. මේවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගත්තු සත්‍ය වාර්තා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට පැහැදිලි කරන්න අවස්ථාව දෙන්නම් -

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

36 (1) යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාදයක් කඩ වෙනවා නම් එතුමාගේ කථාවෙන් පස්සේ -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ නම සඳහන් කරලා කථා කරන නිසා මම කථා කරන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මෙන්න මේ විධියේ අසත්‍ය ප්‍රකාශ කරමින් තමයි මේ අය -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීමෙන් පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒක නිසා මම කියනවා -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දවස් හතක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මගේ කථාවෙන් පස්සේ එතුමාට අවස්ථාව දෙන්න. එතුමාට අවස්ථාව දෙන්න. මම භය නැතුව සංඛ්‍යා ලේඛනත් එක්ක ඉදිරිපත් කරන්නේ. ඊළඟට මේ තිබෙන්නේ බේරුවල ආසනයේ අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගත්තු සත්‍ය වාර්තා. මම සභාගත කරනවා.[3] මෙහි සියලු මරණ සංඛ්‍යාව, අලාභ හානියට ලක් වුණු ගොඩනැගිලි සංඛ්‍යාව සහ අනෙකුත් සියලු දේවල් පිළිබඳව මම සභාගත කරනවා. එතකොට -

[3] කථාව අවසානයේ පළ කර ඇත.

**ගරු මංජුල බුද්ධදාස**
Hon. Manjula Buddhadasa

එළුවොත් ඉන්නවාද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ සභාවටම දැන ගන්න පුළුවන්. ඊළඟ කාරණය තමයි මේ සභාවට අමතරව විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මැතිතුමා බේරුවල ආසනයේ සංචාරය කළා කියලා ඔහු ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඒ ප්‍රකාශයේදී කියලා තිබෙනවා සිංහල ජනතාවම තමයි වැරැදිලා සිංහල ජනතාවගේ ගෙවල්වලට ගිනි තියලා තිබෙන්නේ කියලා. ඒක නිසා මෙතුමා කියනකොට 2014 ජූනි 29 වැනිදා ලංකාදීප පත්තරේ අහනවා,[4]

*නමුත් ඇමැතිතුමනි සිංහල ජනයාගේ දේපළවලටත් හානි සිදු වෙලා තිබෙනවා.*

*නැහැ, නැහැ. එහෙම වෙලා නැහැ. අපි අලුත්ගම ගියා. හරි එහෙනම් පෙන්වන්න. මට කියන්න කොහේද කියලා. අලුත්ගම මසූර් මාවතේ සිංහල ජනතාවගේ නිවාස හයකට පහර දීලා, ගිනි තියලා තිබෙනවා.*

මේ විධියට මේ පත්තරේ තිබෙනවා. අලුත්ගම ජනවාර්ගික ගැටුමක් ඇති වුණේ නෑ කියලා වාසුදේව නානායක්කාර මැතිතුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඒ නිසා වාසුදේව නානායක්කාර මැතිතුමාට සිංහල ජනතාව හැටියට අපි අපේ අප්‍රසාදය ප්‍රකාශ කර සිටිනවා. මෙවැනි දෙයක් මාධ්‍ය තුළට ප්‍රකාශ කිරීම සම්බන්ධව. ඊළඟට මේ ජූනි මාසේ 29 වැනි[5] ඉරිදා ලංකාදීප පත්තරේ තිබෙනවා,

*අලුත්ගම ජන ජීවිතය යථා තත්ත්වයට පත් වී ඇතැයි පැවසුවද ඇස්වල තවමත් කඳුළු උල්පත්ය. කාවින්දි අලුත්ගම, ඥානේස්සර මහ විද්‍යාලයේ හතර වැනි වසරේ ඉගෙනුම ලබන දරුවා කියන ප්‍රකාශයක්. මේ දරුවා හිටපු*

[4] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

[5] - එම -

*ගේත් ගිනි තිබ්බා. මෙයා කොච්චර භය වෙලා හිටියාද කියනවා නම් දවස් කිහිපයක් යනකල් කථා කළේ නැහැ. ගොළු වෙලා හිටියේ. අද අසල්වැසි කාන්තාවක් මේ සම්බන්ධවත් අපට ප්‍රකාශ කළා.*

මේ විධියට එකක් කියනවා. මේ බලන්න,

*"ජාතිවාදයක් නැති අලුත්ගම කඳුළු කථාව."*

මේ කථාවේ සිංහල, මුස්ලිම් ජනතාව දෙගොල්ලෝගෙම ගෙවල් ගිනි තියපු, ඒ ගෙවල්වල ජනතාව ප්‍රකාශ කරපු ප්‍රකාශයන් මේකේ තිබෙනවා. ඉතින් ඒක නිසා මෙවැනි අමාත්‍යවරුන් පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා වාගේම ඒ අමාත්‍යවරුන් පිළිබඳව අපේ විරෝධය අපි ප්‍රකාශ කරනවා.

[සභාවේ ඝෝෂා]

සමස්ත බේරුවල ජනතාව වෙනුවෙන්. ඊළඟට අපි දන්නවා මේ වනවිට රට පාවා දෙන -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කාගේ ආණ්ඩුවද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ වාගේම අපි දන්නවා මේ වනවිට රට පාවා දෙන -

[සභාවේ ඝෝෂා]

ජිනීවාවලට චෝදනා එල්ල කරපු හකීම් මහත්මයා පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ. මේ හකීම් මහත්මයා පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධව කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ජිනීවාවලට ප්‍රකාශයක් කරලා තිබෙනවා. දර්ගා නගරයේ මුස්ලිම් කාන්තාවන්ට පර්දාව දාගෙන යන්න විධියක් නැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලාගේ ආණ්ඩුව. අපිට කියන්න එපා. ඇයි අපට කියන්නේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ නිසා හකීම් මහත්තයාට අපි කියනවා. හකීම් මහත්තයා ඉන්න මේ ආණ්ඩුව තුළ අපටත් ඉන්න ලැජ්ජයි කියලා. එතුමා විතරක් නොවෙයි. මේ ආණ්ඩුවේ ඉන්න එතුමා කියනවා නම් අයුක්ති සහගතයි කියලා. එතුමා ඉන්න ආණ්ඩුවක සිංහලයන් වශයෙන් ඉන්න අපට ලැජ්ජයි කියන ප්‍රකාශය කරනවා. ඒ වාගේ අපි පැහැදිලිව දන්නවා. තවත් ප්‍රකාශ - මේ බලන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න. කාලය අවසන්.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දර්ගා නගරයේ ඔරලෝසු පල්ලිය සිංහල ජනතාව කඩා විනාශ කළා කියලා අන්තර් ජාලයේ තිබුණා. මේක කඩා විනාශ කළේ සිංහල ජනතාව නොවෙයි. අධිවේගී මාර්ගයේ පිවිසුම් මාර්ගයක් තමයි මේ දර්ගා නගරයේ ප්‍රධාන මාර්ගය. මේ මාර්ගයේ තමයි ඔරලෝසු පල්ලිය තිබෙන්නේ, RDA එකෙන් කඩපු, මේ තියෙන්නේ අන්තර්ජාලය හරහා ගත්තු පින්තූරයක්. ඒ නිසා මෙවැනි අසත්‍ය ප්‍රකාශ කරමින් අපේ සිංහල, මුස්ලිම් ජනතාවගේ සමගිය බිඳින්න හදන දේශපාලන අන්තවාදීන් පිළිබඳව, ඒ වාගේම ජාතිවාදීන් පිළිබඳව සමස්ත ජනතාවගේ විරෝධය ප්‍රකාශ කර සිටිමින් මම නිහඬ වෙනවා.

**<u>2014.06.15 දින බේරුවල හා අළුත්ගම යන ප්‍රදේශවල සිදුවූ හදිසි තත්ත්වය</u>**
**<u>014.06.23 වන දින ප.ව. 3.00ට පෙර වාර්තාව</u>**

| අනු අංකය | ග්‍රා.නි. වසම | අවතැන් පවුල් ගණන | අවතැන් පුද්ගලයින් ගණන | ස්ථානගත පරීක්ෂාවෙන් පසු | නිවාස හානි | | පන්සල්/ මුස්ලිම්දේවස්ථාන/පෙර පාසල් හානි | වෙළඳ ආයතන හානි | සංචාරක බංගලා | රථ වාහන හානි | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | පූර්ණ | අර්ධ | | | | | |
| 01 | 741 බී කපුගොඩ | | | | | | | | | | කැමරා 02 |
| 02 | 744 ඒ දූවේගොඩ | | | 16 | | 03 | | | | | |
| 03 | 747 ඒ මරක්කලාවත්ත | 09 | | | | 09 | | 02 | | | |
| 04 | 748 පොල්කොටුව | | | | | 01 | | 01 | | | |
| 05 | 749 කංකනාම්ගොඩ | 07 | | | | 07 | | 02 | | | |
| 06 | 750 වලතර | 05 | 32 | 32 | | | | | | | |
| 07 | 751 අක්කරගොඩ | | | 02 | | 02 | | | | | |
| 08 | 752 අඹේපිටිය | 264 | 974 | 99 | 02 | 17 | | 08 | | මෝටර් සයිකල් 02 | |
| 09 | 755 මහගොඩ | | 93 | 99 | 01 | 19 | ග්‍රා.නි.කා. 01 | 03 | | ත්‍රි රෝද රථ 01 | |
| 10 | 756 මාලිගාහේන | | | | | 07 | | 01 | | | |
| 11 | 758 හෙට්ටිමුල්ල | | | | | | | 04 | | | |
| 12 | 759 ඒ ගල්හේන | 07 | 38 | 38 | 01 | 06 | | 02 | | | |
| 13 | 760 මොරගල්ල | | | | | | | 02 | 01 | | |
| 14 | 762 කළුවාමෝදර බ. | | | | | | | 01 | | ලොරි 01 | |
| 15 | 763 ගනේගම | | | | | | | 15 | | | |
| 16 | 764 අළුත්ගම (බ.) | | | | | | | 45 | | | |
| 17 | 765 අළුත්ගම (නැ) | | | | | | | 17 | | | |
| 18 | 765 ඒ සීනවත්ත | 200 | 1000 | | | 53 | | 09 | | වෑන් 03 මෝටර් සයිකල් 06 ත්‍රි රෝද රථ 03 කාර් 03 | |
| 19 | 766 ධර්ගානගරය | 502 | 2700 | 165 | 02 | 33 | | 02 | | පාපැදි 01 | |
| 20 | 766 ඒ ධර්ගානගරය (නැ) | 470 | 2722 | 08 | 04 | 04 | | 03 | | වෑන් රථ 01 කාර් 01මෝටර් රථ 01 | |
| 21 | 766 බි අලකදූපිටිය | 09 | 29 | 29 | | 08 | පෙර පාසල් 01 | 03 | | පාපැදි 02 ත්‍රි රෝද 01 | |
| 22 | 766 සි පතිරාජගොඩ | 25 | 37 | 69 | 02 | 05 | | | | පාපැදි 08 යතුරු පැදි 01 | |
| 23 | 766 එෆ් මාලේවන | | 58 | 58 | | 12 | 01 දේවස්ථාන | | | වාහන 01 | |
| 24 | 766 ජී අධිකාරීගොඩ | | 700 | [illegible]3 | 09 | 20 | 01දේවස්ථාන | 09 | | ත්‍රිවිල්01 | ජකි |
| | | | | | | | | | | කාර් 01 පාපැදි 03 | 10 |
| 25 | 768 පාදගොඩ | | | | | | | | | ලොරි 01 | |
| 26 | 768 ඒ වැලිපිටිය | | 03 | 03 | | 01 | | | | | |
| 27 | 769 වරාපිටිය | | 03 | 03 | 01 | | | | | මෝටර් රථ 07 | 769 වරාපිටිය |
| 28 | 770 ඒ නාකන්දලගොඩ | | 02 | | 01 | | | 01 | | යතුරු පැදි 21 | |
| | එකතුව | 1498 | 8391 | 704 | 23 | 207 | 04 | 153 | 01 | 74 | 12 |

- සැ.යු. මෙම තොරතුරු ස්ථානගත පරීක්ෂාවෙන් අනතුරුව වෙනස් විය හැකිය.

- 768 ඒ වැලිපිටිය ග්‍රාම.නි. වසමේ දැනට මරණ 01 ක් වාර්තා වී ඇත.
- 759 ඒ ගල්හේන ග්‍රාම.නි. වසමේ දැනට මරණ 01 ක් වාර්තා වී ඇත.

[illegible] 200 ([illegible])
[illegible]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කථා කරනකොට ගරු මන්ත්‍රීතුමන්ලා මතක තියා ගන්න ඕනෑ, මන්ත්‍රීවරුන් පිළිබඳව පාර්ලිමේන්තු ඇමැතිවරුන් පිළිබඳව 34 (5) ඡේදය යටතේ තමන්ට කථා කරන්න බැහැයි කියන එක.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනරූඪ වෙනවා ඇති.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. පොදු කටයුතු යටතේ බස්නාහිර පළාතේ 2014 අංක ..... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. අවස්ථාව දෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව.

## බස්නාහිර පළාතේ 2014 අංක .... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : පළමුවර කියැවීම
## FINANCIAL (AMENDMENT) STATUTE NO.... 0F 2014 OF THE WESTERN PROVINCE : FIRST READING

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2014 අංක .... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව මීළඟට තිබෙන්නේ, ලේකම්තුමා විසින් අසුනින් නැඟී සිට ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීමයි. ප්‍රඥප්තියේ පූර්විකාව මෙම සභාවට ඉදිරිපත් කරන ලෙසට මම ආරාධනා කරනවා.

***[පූර්විකාව ]**
*[Preamble]*

**හේමන්ත සමරකොන් - සභා ලේකම්**
Hemantha Samarakoon - Council Secretary

ගරු සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

*"2010 අංක 02 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි."* යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තියේ පළමුවර කියැවීමේ වැඩ කටයුතු දැන් නිමා වුණා. මීළඟට එම ප්‍රඥප්ති කෙටුම්පත දෙවැනි වර කියැවීමට දිනයක් නියම කරගත යුතුව තිබෙනවා. ප්‍රඥප්තිය කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා ඒ සඳහා දිනයක් නියම කර ගන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මාසයක් ඇතුළත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවැනි වර කියැවීම සඳහා මාසයක් ඇතුළත අපි දිනයක් නියම කර ගනිමු.

***ඊට අනුකූලව ප්‍රඥප්ති කෙටුම්පත, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***
*It was ordered to refer the draft statute to the Committee on Statutes and Laws.*

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක....... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය: පළමුවර කියැවීම
## PAWNBROKERS' STATUTE OF THE WESTERN PROVINCE NO. … OF 2014: FIRST READING

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක....... දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය*" මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව මීළඟට තිබෙන්නේ ලේකම්තුමා විසින් අසුනින් නැඟී සිට ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීමයි. ඒ අනුව, ප්‍රඥප්තියේ පූර්විකාව මෙම සභාවට ඉදිරිපත් කරන ලෙසට ලේකම්වරයාට මම ආරාධනා කරනවා.

***[පූර්විකාව ]***
*[Preamble]*

**හේමන්ත සමරකෝන් - සභා ලේකම්**
Hemantha Samarakoon - Council Secretary

ගරු සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

*" බැංකුවක් විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය හැර බඩු උකස් ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද ඊට ආනුෂංගික හෝ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2001 අංක 03 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තියේ විධිවිධාන 1942 අංක 13 දරන බඩු උකස් ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධානවලට අනනුකූල වේ."* යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තියේ පළමුවර කියැවීමේ වැඩ කටයුතු දැන් නිමා වුණා. මීළඟට එම ප්‍රඥප්ති කෙටුම්පත දෙවනවර කියැවීමට දිනයක් නියම කර ගැනීමයි. ඊට ප්‍රථම ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කර ඒ පිළිබඳව සලකා බලා දිනයක් නියම කර ගනිමු. මාසයක් ඇතුළත ඒ සඳහා දිනයක් නියම කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

***ඊට අනුකූලව ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***
*It was ordered to refer the draft statute to the Committee on Statutes and Laws.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී මෙම සභාවට කාර්ය පටිපාටි 107 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාවක් මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. මීට පෙර අපේ ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් මා වෙත යොමු කර තිබෙනවා. ඉතාමත් කෙටියෙන් ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න. දීර්ඝ වශයෙන් මට ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා, ප්‍රකාශයක් කළා, ගුරුතුමා. මම මගේ කථාවේදී එළුවෝ 600 ක් මැරුවයි කියලා ප්‍රකාශයක් කළා කියලා. එය අසත්‍ය ප්‍රකාශයක්. මම හිතන්නේ ගුරුවරයෙක් හැටියට මම කනගාටු වෙනවා, බෞද්ධයෙක් හැටියට තමන්ගේ භාෂාවවත් හරියට නිවැරැදිව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඒ වාගේ ප්‍රකාශයක් කළා නම් එහෙම, මම හැන්සාඩ් එක බලලා ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් ඒ පිළිබඳව -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ ප්‍රකාශය, එළුවෝ 600 ක් ඉන්න ෆාම් එකක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද කටමිටුවට යොමු කරලා ඒ ගැන මම සාධාරණය ඉෂ්ට කරන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දෙවැනි කාරණාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් සිද්ධ වෙලා තිබෙනවා නම් -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පිටරටවලට ඕවා කියන්නේ. පිටරටවලට කියලා රටේම වරප්‍රසාද නැති කරනවා ඔබතුමන්ලා. බොරු කියලා. ජාතිවාදී ප්‍රකාශ ඔබතුමන්ලා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබෙනවා නම් මම බලන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දෙවැනි කාරණාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එතුමාගේ කථාවේ දෙවැනි ප්‍රකාශය. එතුමා ප්‍රකාශ කරනවා අලුත්ගම - බේරුවල පොලීසියේ වාර්තාව. මම කනගාටු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ ෆාම් එක අයිති වෙන්නේ මතුගම -

[සභාවේ ඝෝෂා]

පොලිස් වසමට, මතුගම උසාවියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් තිබේ නම් හැන්සාඩ් එකක බලලා මම ඒ ගැන වරප්‍රසාද කමිටුවට යොමු කරලා මම ඒ ගැන තීන්දුවක් ලබා දෙන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මතුගම උසාවියෙන් රිමාන්ඩ් භාරයට අරගෙන මාස 07 ක් ගත වෙලා, බන්ධනාගාර ගත වෙලා, නිදහස් වෙලා තිබෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාධාරණව බලන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) කිය කියා මට ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. මේ විධියට මේ සභාව අරගෙන යන්න දෙන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

තමන්ගේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් තමයි කිව්වේ, එළුවෝ 600 ක් මැරුවයි කියලා. මම ප්‍රකාශ කරනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ විධියට මට මේ සභාව අරගෙන යන්න හම්බ වෙන්නේ නැහැ. 36(1) කියලා දිගටම යන්න ගියොත්. ඔබතුමා වාඩි වෙන්න. මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ කරුණු දෙක ගැන සොයා බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවක් මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙනවා. එම යෝජනාව ඉදිරිපත් කිරීමට මම ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතියි.

*"කාර්ය පටිපාටි රීති 107 මගින් සලසා ඇති ප්‍රතිපාදනවලට අනුව 2014.07.08 වන දින සභා රැස්වීමේ මතු සඳහන් වන රීති අත්හිටුවා විවාදයට ගැනීම පිණිස පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරමි.*

*පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද, පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට අනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8 (5), 8 (6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, අපේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් ගෙන එන්නට යෙදුණු රීති අත්හිටුවීමේ යෝජනාවට මම විරුද්ධයි. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ යෝජනාව ගෙන ඒම කාලෝචිත නැහැයි කියලා. මම කරුණු පැහැදිලි කරන්නම්. දැන් මේ යෝජනාව අපට ඉදිරිපත් කරලා තිබෙනවා. මම විශ්වාස කරන්නේ, අද ඒ යෝජනාවට අදාළ කරුණු මේ සභාවේ ප්‍රකාශනවලින් කියැවුණා. විශේෂයෙන්ම එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කළ කථාවල කරුණු තමයි මේ කාරණාවට අදාළව ගොඩක් දේවල් ලියලා තිබෙන්නේ. අන්තිමට තුන්වන ඡේදයේ තිබෙනවා,

*"එබැවින් ලෝක ප්‍රජාව හමුවේ ශ්‍රී ලාංකික ජාතියේ ආත්ම ගෞරවයට අතිශය හානිකර දායක වූ මෙම පටු ජාතිවාදී, ආගම්වාදී ව්‍යායාමයන් මුලිනුපුටා දැමීමට ශ්‍රී ලංකා රජය වහ වහා ක්‍රියා කළ යුතු යැයි බස්නාහිර පළාත් සභාව යෝජනා කරන්නීය* කියන යෝජනාව තමයි එතුමා ගෙන එන්නේ."

මා අවංකවම විශ්වාස කරනවා, මේ යෝජනාව ගෙන ඒම තුළ යළිත් වරක් සුව වෙමින් පවතින සහ සුව වෙලා තිබෙන තුවාලයක් කබල ගලවලා ලේ වැගිරෙන්න සැලැස්වීමක් කියලා. ඒ නිසා මේ දෙපාර්ශවයේම සිංහල, මුස්ලිම් අපේ සහෝදර ගරු මන්ත්‍රීවරු ඉන්නවා. ආණ්ඩු පක්ෂයේත් සිංහල, මුස්ලිම් ගරු මන්ත්‍රීවරු ඉන්නවා. අද මේ ප්‍රකාශය කිරීමෙන් යළිත් වරක් අර සුවපත් වෙමින් තිබුණු තුවාලය

අඩු ගණනේ ඉස්ම ගලන්න සැලැස්වීමක් හැටියටයි මා දකින්නේ. ඒ නිසා මේ යෝජනාව ගෙන ඒමෙන් තමයි රට අප්‍රසාදයට පත් වෙන්නේ. ඊළඟට මේ සුව වුණු තුවාලය -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මොන රීතිය යටතේද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේක පාරනකොට -

[සභාවේ ඝෝෂා]

මට කථා කරන්න දෙන්න. මේ කාරණාව තුළ අපි අන්තර්ජාතික -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මට කථා කරන්න දෙන්න. මට කථා කරන්න දෙන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. 36 (1) යටතේ මම කථා කරන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙම නම් මම යෝජනාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිටපු ගරු ඇමැතිතුමා -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

36 (1) යටතේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. ඔබතුමා සංශෝධනයක්ද ගෙන එන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

රීති අත්හිටුවීමේ යෝජනාවට විරුද්ධයි කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවට

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

විරුද්ධයි කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සංශෝධනයක්ද ගෙන එන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම ඒ යෝජනාවට -

[සභාවේ ඝෝෂා]

කවුරු හරි ස්ථිර කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එම යෝජනාවට විරුද්ධද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

එම යෝජනාවට විරුද්ධයි කියලා මම යෝජනාවක් ගෙන ආවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

එතුමා කියන්නේ රීති අත්හිටුවන්න එපා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි පැහැදිලියි. ඔබතුමාට දිගින් දිගටම ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. ඔබතුමා යෝජනාවට විරුද්ධයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ප්‍රකාශයක් නොවෙයි. ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවීමේ යෝජනාවට මා විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාවට විරුද්ධයි. සභාවේ බෙදීමක් තිබෙනවා. ඒ නිසා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ජාතියේ සමගිය හදන්න කියලා මේ කියන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජාතික සමගිය හදලා තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. එම රීති අත්හිටුවීමට සභාවේ බෙදීමක් තිබෙන නිසා -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

යළිත් වරක් ජාතිවාදයේ ගිනි දැල් අවුලන්නද? මේ යෝජනාව ගෙන ආවේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට සිද්ධ වෙනවා සභාවේ එකඟතාවය ගන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

සාමය ඇති කරලා හමාරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

මට අදහස් ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

බය වෙන්න එපා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

භය වෙන්නේ තමුන්නාන්සේලා. මේක වචාගෙන කන්න හදන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

වචාගෙන කන්න නොවෙයි. වුණු දේ ගැන කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගහන එක නවත්වන්න බැරි වුණා නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පිස්සු කෙළින්න එපා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

පිස්සු කෙළින්නේ ඔබතුමා. ඔබතුමා මොනවද දන්නේ?

[සභාවේ ඝෝෂා]

ඔබතුමා මොනවද දන්නේ? ඔබතුමා දන්නේ -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

සාමය තිබෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඝෝෂා කිරීම් කරන්න එපා. කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේක ගිනි තියන්න දෙන්න බැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා ගිනි තියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මුළු කොළඹ, මාලිගාවත්තම ගිනි තිබ්බේ ඔබතුමා නේ? බේරුවල ගිනි තියලා -

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අලුත්ගම ගැන කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

අලුත්ගම ගැන කථා කරන්න. මාලිගාවත්තේ ජාතිවාදී ප්‍රශ්න වුණේ නැහැ. ප්‍රශ්න වුණේ අලුත්ගම. බේරුවල. කථා කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තමුන්නාන්සේ -

[සභාවේ ඝෝෂා]

අපේ ගෞරවනීය සහෝදර - අපට ඕනෑ මේක යටපත් කරලා දාලා -

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාවක් ගෙන ආවාම යෝජනාවට භය වෙන්න එපා. යෝජනාවට කථා කරන්න. භයේ දුවන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමා බොරුවට කෑ ගහනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට ඡන්ද විමසීමක් කරන්න. මේ ජාත්‍යන්තරයට උඩ ගෙඩි දෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

යෝජනාව ගැන කථා කරන්න කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ ගොල්ලන්ට ඕනෑ විධියට ගෙනියන්න දෙන්න බැහැ. පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය හැමෝටම තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මොකටද භය වෙන්නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මීට පෙර -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න. මීට පෙර මේ සභාවේ මෙවැනි වාතාවරණයක් ඇති වුණේ නැහැ. විශේෂයෙන්ම මේ වාගේ ප්‍රශ්නවලදී. ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ඉන්නවා. විපක්ෂ නායකතුමාත් එක්ක කථා කරලා තීන්දුවක් ගන්න.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, ඡන්දයට යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සීනුව නාද කරන්න කිව්වා. ඒකවත් ඇහෙන්නේ නැහැ සෝෂාව නිසා. දැන් සීනුව නාද කරලාත් ඉවරයි. සභාවේ බෙදීමක් තිබෙනවා. කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එහෙම බෙදීමක් අහන්න බැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මටත් විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්ද විමසීමෙන් පස්සේ දෙන්නම්. වාඩි වෙන්න.

[සභාවේ සෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

ගරු සභාපතිතුමා
Mr. Chairman

රීති ප්‍රශ්න නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ නේ තියෙන්නේ. ඔබතුමා කොහොමද නැහැ කියන්නේ. අහන්න එපැයි. ඔබතුමා අහන්නේ නැතුව කොහොමද නැහැයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්ද විමසීමට යන්න හදන්නේ. මට අවස්ථාව දෙන්න බැහැ. කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. මේ ඡන්දය විමසීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඡන්ද විමසීමට විරුද්ධවයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු සභාපතිතුමා
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඡන්ද විමසීමට විරුද්ධව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. මූලාසනයට ගරු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කියන එකට අහුම්කන් දෙන්න. ගරු සභාපතිතුමනි, විපක්ෂය ගෙන එන හැම එකටම ඡන්දයක් ඉල්ලනවා නම් අපට මේකේ බලයක් නැහැ. ඒක නිසා අපි ඒකට විරුද්ධයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඉක්මණින් ඡන්ද විමසීම කරන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඡන්දය විමසන අවස්ථාව. කරුණාකරලා වාඩි වෙන්න. මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කළා. ඒ සඳහා හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විරුද්ධවය පළ කළා. ඒ නිසා එම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීවරු නැඟී සිටින්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මේක බස්නාහිර පළාතටම සිදු වුණු සිද්ධියක්. ඇයි මේක කථා කරන්න දෙන්නේ නැත්තේ? කථා කරන්න ඕනෑ දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. මේ සභාව ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නට ඕනෑ. ඕනෑම එකකට අයිතියක් තිබෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ යෝජනාවට කැමැතිද නැද්ද කියලා ඡන්දය විමසන්න. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි බැරි?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම කරන්න දෙන්න බැරි නම් ගෙදර යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාව ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න ඕනෑ. මේක විහිළුවකට ලක් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

කොහෙද මේ යන්නේ? මේක විහිළුවකට ලක් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ගරු සභාපතිතුමා, සභාව කල් දාන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 01.12 ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspended untill 01.12 p.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. එම යෝජනාවට විරුද්ධව හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා විරෝධතාවය ප්‍රකාශ කළා. ඒ යෝජනාව පිළිබඳය සභාවේ බෙදීමක් ඇති නිසා මා විසින් ඒ සම්බන්ධව ඡන්ද විමසීමකට අදහස් කළා. ඒ පිළිබඳව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, විරෝධය ප්‍රකාශ කරන්න බැහැ. සංශෝධනය ගෙන එන්න පුළුවන්. ඔබතුමා යෝජනාව ගෙන එන්න අවසර දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සඳහා විරුද්ධයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා යෝජනාව ගෙන එන්න අවසර දීලා තිබෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, දැන් යෝජනාවක් ගෙනාවාම යෝජනාවට පක්ෂ ද විපක්ෂ ද කියලා ඡන්ද විමසීමක් කරමු. නමුත් යෝජනාවක් කරන්න මන්ත්‍රීවරයෙකුට තිබෙන අයිතියට බාධා කරන්න බැහැ නේ? රීතිවලින් එහෙම කොහොමද ඒක අත්හිටුවන්නේ. (බාධා කිරීම්) දැන් මේකේ මොකක්ද තිබෙන්නේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අපි විරුද්ධයි රීති අත්හිටුවන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

මොකක් හරි රටේ අනතුරක් වෙනවා කියලා මේකේ කොහේද තියෙන්නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

රීති අත්හිටුවන්න බැහැයි කියලා කියනවා. රීති අත්හිටුවලා යෝජනාවක් ගේන්න පුළුවන්කමේ ප්‍රතිපාදන නේ මේ සලසලා තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, රීති අත්හිටුවන්න අපි විරුද්ධයි. එතකොට සභාවේ එකඟතාවය අහන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි මම හදන්නේ මේ -

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ඒ යෝජනාව ගේන්න. සංවාදයට ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙත් රීති අත්හිටුවීමට කොටසක් විරුද්ධයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඒගොල්ලෝ කියනවා රීති අත්හිටුවන්නය කියලා. අපට ඕනෑ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒගොල්ලෝ බැහැයි කියනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

අපට ඕනෑ, සම්ප්‍රදායික, දෛනික න්‍යාය පත්‍රයට යන්නයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මාස දෙකක් තිස්සේ මගේ යෝජනාව තිබෙනවා න්‍යාය පත්‍රයේ. ඒක ගන්න විධියක් නැහැ. ඒ නිසා න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න. රීති අත්හිටුවන්න දෙන්න එපා. ඒකට අපි විරුද්ධයි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මේ කාරණා වාගේ ඒවාත් වැදගත් කාරණා. එතුමන්ලාගේ මේ ජාතිවාදී වැඩ පිළිවෙළට වඩා වැදගත් වෙන්නේ පළාත් අධ්‍යාපනය. පළාතේ සංවර්ධනය.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා වැරදි දේවල් කථා කරන්න එපා. ගරු සභාපතිතුමනි, සභාව නොමග යවනවා, එතුමා මේ කරන කථාවේදී.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

වැදගත් යෝජනා දෙකක් තිබෙන්නේ. මේවාගේ බහුබූත යෝජනා ගේනවාට අපි අකමැතියි.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මේ සභාවට අලුත් දෙයක් නොවෙයි, මේ රීති අත්හිටුවීමේ යෝජනා පරාද කරන එක. අද ඊයේ එකක් නොවෙයි.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මම 107 රීති අත්හිටුවීම යටතේ තමයි යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාත් යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ. ඒක නැහැ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. නැත්නම් මට මේකේ තීන්දුවක් ගන්න බැහැ.

සභාවේ කටයුතු සම්බන්ධයෙන් රීතිවල යම්කිසි විධිවිධාන සලස්වා නැති ඕනෑම අවස්ථාවක සභාපතිතුමාට බලය තිබෙනවා, මගේ තීන්දුව ඕනෑම විධියකට ප්‍රකාශ කරන්න. ඒක මේ රීතිවල තිබෙනවා. ඒ අනුව මට පුළුවන් කටයුතු කරන්න. කිසිම ගැටළුවක් නැහැ ඒකේ. ඒ අනුව තමයි තීන්දු කළේ. එහි කිසි ප්‍රශ්නයක් නැහැ. ඒකේ කිසිම ගැටළුවක් නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

ගරු සභාපතිතුමනි, දැන් ප්‍රජාතන්ත්‍රවාදය අනුව මේ පත් වුණු ගරු මන්ත්‍රීවරු තමුන්නාන්සේගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රජාතන්ත්‍රවාදය අනුව තමයි ඔක්කොම ඇවිල්ලා තිබෙන්නේ. මමත් ඇවිල්ලා තිබෙන්නේ එහෙමයි.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayatissa

එහෙම කොහොමද වැඩ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමා රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළාම මේ පැත්ත විරුද්ධයි. ඒ නිසා මම ඒ අනුව කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමා කිසි ප්‍රශ්නයක් නැහැ ඒකේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ ප්‍රජාතන්ත්‍රවාදය. මගේ යෝජනාව මාස දෙකක් තිස්සේ න්‍යාය පත්‍රයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විරුද්ධයි. ආණ්ඩු පක්ෂයේ මතවාදය ඉදිරිපත් කළේ එතුමා. ඒ නිසා මට අයිතියක් තිබෙනවා ඒ සම්බන්ධයෙන් දැන් -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

යෝජනාවක් ආවාම නියමිත ක්‍රමයට එන්න. අපේ කාලය කන්න එපා විපක්ෂ මන්ත්‍රීතුමන්ලා. හැමදාම බොරු කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, මේක බස්නාහිර පළාතේ සිදු වුණු යම් සිදුවීමක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මීට පෙරත් එවැනි දේවල් සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙම ඇති නොවෙන්න කථා කරන්න මේ යෝජනාව ගෙනාවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට එකඟයි. මම එහෙම වෙන්නේ නැහැ. නමුත් අපි ඉතාම සාධාරණව කටයුතු කරන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ මුජිබුර්ගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම සාධාරණව කටයුතු කරන්නේ. කිසිම මන්ත්‍රීවරයෙකුට අසාධාරණයක් කරන්නේ නැහැ මම. නමුත් මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ විරෝධතාවයක් ඇවිල්ලා තිබෙනවා මේ රීති අත්හිටුවීමේ යෝජනාවට. ඒ නිසා මම මේ -

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. එහෙන් නැගිටිනවා. මෙහෙන් නැගිටිනවා. මේ ඔක්කොම කථා කරන්න ගියාම බැහැ නේ කථා කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ අපේ මන්ත්‍රීතුමන්ලාට රීති අත්හිටුවන්න බැරිමද? ආණ්ඩු පක්ෂයේ බහුතරයට පමණද මේක කළ හැක්කේ කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මේ කාර්ය පටිපාටි රීති අත්හිටුවීම සම්බන්ධයෙන්, 107 රීතිය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. එහිදී සඳහන් වෙනවා ගරු සභාපතිතුමනි, අමාත්‍යවරයෙක් රීති අත්හිටුවීමේ යෝජනාවක් ගෙනාවොත් ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. අනිවාර්යයෙන් රීති අත්හිටුවෙනවා. මන්ත්‍රීවරයෙකු ඉදිරිපත් කළොත් කටයුතු කළ හැක්කේ කෙසේද කියන එක තුන්වන උප වගන්තියේ සඳහන් වෙනවා. කොහොමද සඳහන් වෙන්නේ, අමාත්‍යවරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන විට හැර - ඒ කියන්නේ මන්ත්‍රීවරයෙක්. යෝජනාවට පක්ෂ වන මන්ත්‍රීවරුන් ගණන - මොකක්ද යෝජනාව? රීති අත්හිටුවීමේ යෝජනාව. ප්‍රජාතන්ත්‍රවාදීව තිබෙන න්‍යාය පත්‍රයේ යනවාද? රීති අත්හිටුවලා මේකට වැඩි අවස්ථාවක් දෙනවාද කියන එක ගරු සභාව ප්‍රජාතන්ත්‍රවාදීව ගත යුතු තීන්දුවක්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නැහැ. ඒක ඔබතුමාගේ විග්‍රහය නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමාගේ විග්‍රහය ඔබතුමා ඉදිරිපත් කරන්න. මම මගේ විග්‍රහය ඉදිරිපත් කරන්නම්. (බාධා කිරීම්) හය වෙන්න එපා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ විග්‍රහය මම ඉදිරිපත් කරන්නේ නැහැ. (බාධා කිරීම්)

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපට විග්‍රහ කරන්න. උදය ගම්මන්පිල ඇමතිතුමා නොවෙයි. ඔබතුමා මේ සභාවේ සභාපති. ඔබතුමා අපට විග්‍රහ කරලා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා. පැහැදිලියි. මම තේරුම් අරන් තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපට විග්‍රහ කරලා දෙන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා ඇමැතිතුමාගෙන් උපදෙස් ගන්නවා නේ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ගණපූරණය අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු වන්නේ නම් - මේ සභාවේ ගණ පූරණය 35 යි. යෝජනාව ගන්න පුළුවන්. 35 ක් නැත්නම් යෝජනාව ගන්න බැහැ. ඒකයි ඇත්ත. (බාධා කිරීම්) තමුන්නාන්සේලාගේ සාමාන්‍ය බහුතරය ඕනෑ නැහැ. 35 න් -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උදය ගම්මන්පිල ඇමතිතුමා, ඔබතුමා ඉන්නේ සභාපතිතුමාට උපදෙස් දෙන්න නොවෙයි. සභාපති එතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා අපට තේරුම් කරලා දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මම දැන් මගේ තීන්දුව ප්‍රකාශ කළා. ඒ අනුව ඡන්දයකට යන්න මම තීරණය කළා. මම සීනුව නාද කරලා අවසානයි. ඒ අනුව මම දැන් ඡන්දයකට යනවා. ඒක දැන් වෙනසක් වෙන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ. සභාපතිතුමා එහෙම බැහැ නේ? ඔබතුමා කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා නැගී සිටින්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගන්න. ඡන්දේ ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම බැහැ. සභාව විහිළුවට ලක් කරන්න බැහැ. වාඩි වෙන්න නැගිටින්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ විධියට රීති අංක 107 යටතේ විපක්ෂයට යෝජනාවක් ගේන්න බැරිව යනවා. ඔය විධියට ක්‍රියා කළොත්. විපක්ෂයට යෝජනාවක් කවදාවත් ගේන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. හැමෝගෙන්ම මම අහනවා. උදය ගම්මන්පිල අමාත්‍යතුමාගෙන් පමණක් නොවෙයි මම නිරෝෂන් පාදුක්ක - (බාධා කිරීම්) නැහැ. මේ සභාව මේ විධියට විහිළුවට ලක් කරන්න දෙන්න බැහැ. කරුණාකර මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට පක්ෂ ගරු මන්ත්‍රීවරු නැඟී සිටින්න. ඉස්සෙල්ලාම පක්ෂ අය නැඟී සිටින්න. කරුණාකරලා පක්ෂ මන්ත්‍රීවරු නැඟී සිටින්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර පක්ෂ මන්ත්‍රීවරු නැඟී සිටින්න. විරෝධයට.

[සභාවේ ඝෝෂා]

කරුණාකර විපක්ෂ මන්ත්‍රීවරු නැඟී සිටින්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කවදාවත් විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට යෝජනාවක් ගෙනෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මන්ත්‍රීතුමන්ලා අසුන්වලට ගිහිල්ලා වාඩි වෙන්න. තමන්ගේ ආසනවල ඉන්න.

[සභාවේ ඝෝෂා]

සභාව මේ විධියට යන්න බැහැ නේ? ගරු මන්ත්‍රීතුමන්ලා සභා ගර්භයේ ශීලාචාර විධියට හැසිරෙන්න. මේ විධියට සභාව යන්න බැහැ නේ?

[සභාවේ ඝෝෂා]

# රීති අංක 11 (1) යටතේ සභාව කල් තැබීම
ADJOURNMENT OF THE COUNCIL SITTING UNDER RULE NO. 11(1)

ගරු සභාපතිතුමා
Mr. Chairman

*"මෙම අවස්ථාවේදී 11(1) රීතිය යටතේ මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.25 ට, 2014 ජූලි මස 22 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 01.25 p.m till 9.30 a.m. on 22.07.2014*